# විදුලිබල අමාත්‍යාංශය




# ප්‍රගතිය 2021

## වැඩසටහන් 2022

# ගරු අමාත්‍යවරයාගේ පණිවිඩය



මෙම අමාත්‍යාංශයේ "2021 වර්ෂයේ ප්‍රගතිය හා 2022 වර්ෂයේ ඉදිරි වැඩසටහන්" වාර්තාව වෙනුවෙන් විදුලිබල අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වශයෙන් පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම පිළිබඳව මම අතිශයින්ම සතුටට පත්වෙමි. සමාලෝචිත වර්ෂයේ වැඩි කාලයක් තුළ මෙම අමාත්‍යාංශයේ අමාත්‍යධුරය හෙබවූ හිටපු ගරු අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මැතිතුමාගේ නායකත්වය යටතේ ලේකම් ඇතුළු අමාත්‍යාශයේ නිලධාරීන් සහ අමාත්‍යාංශ විෂය පථයට අයත් අනෙකුත් ආයතනවල නිලධාරීන් විසින් පෙර නොවූ විරූ ලෙස ව්‍යාප්ත වූ ගෝලීය වසංගතය හා එහි බලපෑම් හේතුවෙන් ඇති වූ ගෝලීය ආර්ථික අර්බුධය හමුවේ සාධනීය අන්දමින් ඉටු කරන ලද අනගි සේවය හා මගපෙන්වීම වෙනුවෙන් මාගේ ගෞරවය පුද කිරීමට ද මම කැමැත්තෙමි. එමෙන්ම දීර්ඝකාලීනව බලපැවැත් වූ නිරෝධායන ඇඳිරි නීතිය සහ වසංගත තත්ත්වය තුළ පවා විදුලිබල මණ්ඩලයේ හා ලංකා විදුලි පෞද්ගලික සමාගමේ ඉදිරි පෙළ නිලධාරීන් විසින් ඉටු කරන්නා වූ සේවාවන් වෙනුවෙන් මෙන්ම විදුලි පාරිභෝගිකයන් සඳහා අඛණ්ඩ සේවාවක් සැපයීම සඳහාත් දැනට සිදු කෙරෙමින් පවත්නා සහ නව ව්‍යාපෘති ස්ථාපිත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහාත් ඔවුන් දරන අමිල උත්සාහය පිළිබඳව මගේ ප්‍රශංසාව හා ගෞරවය ඔවුන් වෙත පුද කළ යුතු ය.

විදුලි බලය සහ බලශක්තිය යනු රටේ ආර්ථික සංවර්ධනය සහ ශ්‍රී ලංකාවේ ජන ජීවිතය ඉහළ නැංවීම සඳහා අත්‍යවශ්‍ය වන මූලික අවශ්‍යතා දෙකකි. පසුගිය දශක කිහිපය තුළ, මෙරට විදුලි ඉල්ලුම ජල විදුලි ජනනය මත වැඩි වශයෙන් රඳා පැවති අතර, පසුව, ජනන මිශ්‍රණය සඳහා ඉන්ධන (තාප) තෙල් යොදා ගැනිණි. පොසිල ඉන්ධන භාවිතයෙන් විදුලිය ජනනය කිරීම ඉතා මිල අධික හා පරිසර හිතකාමී නොවන බැවින්, අපි විකල්ප ක්‍රම භාවිතා කරමින් විදුලිය ජනනය කිරීමට පටන් ගත්තෙමු. ගල් අඟුරු පිළිබඳ ඉහළ ජාත්‍යන්තර නියාමනය සහ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ "පුනර්ජනනීය බලශක්තියෙන් 70%ක් විදුලි බලය" ලබා ගැනීමේ අනිවාර්ය ප්‍රතිපත්ති ඉලක්කය මත අප COP 26 සමුළුව අතරතුර "නව ගල් අඟුරු එපා" (No New Coal) ගිවිසුමේ සම අනුග්‍රාහකයෙකු බවට පත් විය. එබැවින්, අපගේ විදුලිබල අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG), ප්‍රධාන/කුඩා පරිමාණ ජල විදුලිය, සූර්ය, සුළං සහ ජෛව ස්කන්ධ ව්‍යාපෘති වැනි දැනට පවතින සහ නව පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවලට ප්‍රමුඛත්වය ලබා දෙමින් මෙම ඉලක්කය සපුරා ගැනීමට අප සූදානම් වෙමු.

මෙම දැවැන්ත කර්තව්‍යය සාක්ෂාත් කර ගැනීම සඳහා අපි දැනට නිදහසේ පවතින සුළං හා සූර්ය සම්පත් ප්‍රයෝජනයට ගැනීමට මධ්‍යකාලීන හා දිගුකාලීන සැලැස්මක් සැලසුම් කර ඇති අතර මෙම අගනා අපේක්ෂාවන් සමඟ තාක්ෂණික ඉලක්ක ජය ගැනීමට අප සමඟ අත්වැල් බැඳගන්නා ලෙස වැදගත් ආයෝජකයින්ට සහ ඉංජිනේරු ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPCS) ආයතනවලට ආරාධනා කර සිටිමු.

අභියෝගාත්මක වසරක් තුළ අපගේ ආයතනවල සුවිශේෂී ජයග්‍රහණ පිළිබඳ තොරතුරු මෙම වාර්තාව මගින් අපි ඔබ වෙත ඉදිරිපත් කරන්නෙමු. අමාත්‍යාංශය සිය මෙහෙවරට අනුකූලව කටයුතු කිරීමටත්, පාරිභෝගිකයින්ට ගුණාත්මක සේවාවක් අඛණ්ඩව ලබා දීමටත්, අමාත්‍යාංශයේ විෂය පථයට අයත් සියලුම ආයතන සමඟ සම්බන්ධීකරණය පවත්වා ගනිමින් රජයේ ඉලක්ක සපුරා ගැනීමටත් හැකි සෑම උත්සාහයක්ම ගෙන ඇත. අපගේ නිලධාරීන්ගේ නොපසුබට උත්සාහය සහ අඛණ්ඩ කැපවීම සහ සහයෝගය තුළින් සාධනීය ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවීම මහත් භාග්‍යයකි.

රට පුරා 99.9% ක විදුලියන මට්ටමක් පවත්වා ගත්තත් මූලික විදුලි සේවා සම්බන්ධතා ගාස්තු දැරීමට නොහැකිවීම හේතුවෙන් මෙතෙක් විදුලි සම්බන්ධතාවය ලබාගෙන නොමැති පවුල් සංඛ්‍යාව 95,297ක් බව අප විසින් හඳුනාගෙන ඇත. එබැවින් ඔවුන් සඳහා නොමිලේ විදුලි සේවා සම්බන්ධතාව ලබාදීමේ අරමුණින් රුපියල් මිලියන 750 ක මුදලක් වෙන්කර "දැයට එළිය" යෝජනා ක්‍රමය අයවැය යෝජනාවක් ලෙස ආරම්භ කර තිබේ. එම වැඩසටහන මගින්, මේ වන විට නිවාස 95,297 න් පවුල් 24,547 ක් සඳහා විදුලි සේවා සම්බන්ධතාවය නොමිලයේ ලබා දී ඇති අතර ඇතැම් ප්‍රදේශවල නිවෙස්වල වහලය මත සූර්යබල පහසුකම් ලබාදීමට සලකා බලා ඇති අතර බෝගස්වැව ප්‍රදේශයේ විදුලිය බෙදාහැරීමේ මාර්ග දෙකක් ඉදිකිරීම සඳහා මෙම ප්‍රතිපාදන යටතේ මිලියන 22.78 ක් නිදහස් කර ඇත.

2023 වර්ෂයේ දී කෙරවලපිටියේ දී ඉදිකොට නිම කිරීමට අපේක්ෂිත මෙගාවොට් 300 ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG) බලාගාරයේ ඉදිකිරීම් ආරම්භ කිරීම සහ පළමු මහා පරිමාණ මෙගාවොට් 100 සුළං බල උද්‍යානය මන්නාරමේ ඉදිකිරීම, 2021 වසරේ දී ලද ප්‍රමුඛ ජයග්‍රහණ ලෙස සැලකිය හැකිය. එමෙන්ම තවත් LNG ව්‍යාපෘති දෙකක් සහ පාවෙන ගබඩා සහිත ප්‍රතිවායුකරණ ඒකක (FSRU) වලින් සමන්විත LNG පර්යන්ත පහසුකම් කෙරවලපිටියේ ස්ථාපිත කිරීමටත් ඉදිරි වසර තුන තුළ වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීමටත් නියමිතය.

අවසන් වශයෙන්, විදුලිබල හා බලශක්ති අංශයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අඛණ්ඩ සහයෝගයක් ලබා දුන් අපගේ ප්‍රධාන සංවර්ධන හවුල්කරුවන්හට මගේ කෘතඥතාව පිරිනමමි.

**ගරු. අමාත්‍ය ගාමිණී ලොකුගේ**

**විදුලිබල අමාත්‍යාංශය**

## ලේකම්තුමියගේ පණිවිඩය



2019 වර්ෂයේ සිට 2021 වර්ෂය පුරාම මෑත ඉතිහාසය තුළ අප මුහුණ දුන් අතිශය අභියෝගාත්මක කාලය පසු කරමින් කොවිඩ් - 19 වසංගතය සමස්ත භූමි තලයේ ම සමාජීය මෙන් ම ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම් කරමින් සිටියි. පෙර නොවූ විරූ මෙම හදිසි තත්ත්වය තුළ විදුලිබල අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින අනෙකුත් ආයතන දිවයින පුරා සිටින ප්‍රජාවට අත්‍යවශ්‍ය සේවාවක් වන විදුලි බලය සැපයීමේ සුවිශේෂී කාර්යය අඛණ්ඩව ඉටුකරමින් පවතියි. මෙම වසංගතය මඟින් ඉතා ප්‍රබල අභියෝග නිර්මාණය කර තිබුණ ද, අපි දෛනික කාර්යයන්හි නිරත වීමට අමතරව ආරම්භ කරන ලද සංවර්ධන ව්‍යාපෘති ඇණහිටීමට ඉඩ නොදෙමින් අදාළ කාර්යයන්හි නිරත වන්නෙමු. මෙහි දී, සංවර්ධන ව්‍යපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට අවශ්‍ය සියලු පියවර ගෙන තිබේ.

මෙම වාර්තාව මඟින් විදුලිබල ක්ෂේත්‍රයේ දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතීන් හි 2021 ජනවාරි මස සිට 2021 සැප්තැම්බර් මස දක්වා ප්‍රගතිය සහ 2022 වර්ෂයේ දී ආරම්භ කිරීම නියමිත ව්‍යාපෘති සම්බන්ධයෙන් සවිස්තරාත්මක විස්තරයක් ගෙනහැර දක්වයි. වසංගත කාලසීමාව තුළ දිවයින පුරා අඛණ්ඩ විදුලි සැපයුම තහවුරු කිරීමට හැකි වීම සමාලෝචිත වර්ෂය තුළ දී ලද ඉහළම ජයග්‍රහණයයි. තවද, මෙගාවොට් 300 ද්‍රවීකෘත ස්වභාවික විදුලි බලාගාරයක් කෙරවලපිටියේ ඉදිකිරීම ආරම්භ කිරීම සහ මන්නාරම තම්බපණ්ණි සුළං විදුලි උද්‍යානයේ වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීම ආදිය රටෙහි සංවර්ධන න්‍යාය පත්‍රයෙහි සුවිශේෂී සංධිස්ථාන වන අතර මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අප ලද සුළු පටු ජයග්‍රහණ නොවේ. අපගේ විදුලිබල පද්ධති වෙත පුනර්ජනනීය බලශක්තිය වැඩි වශයෙන් අවශෝෂණය කරගැනීමට හැකියාව සලසමින් නව ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම ඇතුළත්ව සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් වන සුවිශේෂී මෙහෙයුම සම්පූර්ණ කිරීමට මෙම කාල සීමාව තුළ දී හැකියාව ලැබිණි. මෙය ජාතික විදුලිබල පද්ධතිය වෙත පුනර්ජනනීය බලශක්තිය වැඩි වශයෙන් අවශෝෂණය කරගැනීමට උපකාරී විය.

වත්මන් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාරව 2030 වර්ෂය වන විට විදුලි බලයෙන් 70% ක් පුනර්ජනනීය බලශක්තිය මඟින් ජනනය කිරීමේ ඉලක්කය මුදුන්පත් කරගැනීම සඳහා විදුලිබල ක්ෂේත්‍රය මෙහෙයවීමේ අභියෝගාත්මක කාර්යය මෙම අමාත්‍යාංශය වෙත පැවරී තිබේ. අපගේ සැලසුම් මඟින් දැක්වෙන්නේ මේ සඳහා මේ වන විට ස්ථාපිත පුනර්ජනනීය බලශක්තිය ද්විගුණනය කිරීම අවශ්‍ය බවයි. අපගේ ජාතික විදුලිබල පද්ධතිය කේන්ද්‍රීය වශයෙන් පාලනය කරනු ලබන, මනා සංවේදීතාවයකින් යුතු, ඒකීය, සුහුරු ජාලයක් බවට පත් කිරීම අවශ්‍ය වේ. ජාතික විදුලිබල පද්ධතිය හරිතකරණයට බඳුන් කරන අතර පද්ධතිය පවත්වාගෙන යාම පමණක් ම නොව පද්ධතියේ ස්ථායීතාවය, විශ්වසනීයත්වය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ආදී අතිශය වැදගත් ජාල සුවිශේෂීතාවයන් වැඩි දියුණු කිරීමේ කාර්යය අප වෙත පැවරී ඇති අභියෝගයයි. මෙම ස්ථායී, විශ්වාසනීය සහ හරිත විදුලිබල පද්ධතිය සඳහා වන අපගේ ඉංජිනේරු සැලසුම් මඟින් ජාතික බලශක්ති පද්ධතියට ජාල හා සම්බන්ධිත බලශක්ති ගබඩාකරණ ඒකක එකතු කිරීම ඉතා වැදගත් ලෙස සැලකිය යුතු බව ඒත්තු ගන්වයි. මාගේ අමාත්‍යාංශයට සහ සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයට සහ මෙම අමාත්‍යාංශ දෙක යටතේ පවතින අනෙකුත් ආයතනයන් හි තාක්ෂණික ඥානය හා විශිෂ්ට හැකියාව උපයෝගී කරගනිමින් නියමිත හරිත ඉලක්ක කරා ළඟාවිය හැකි බවට මා තුළ කිසිදු සැකයක් නොමැත.

දුෂ්කර කාල පරිච්ඡේදයන් තුළ රටේ යහපත උදෙසා වෙහෙස නොබලා කටයුතු කරන විදුලිබල ක්ෂේත්‍රයේ සේවක පිරිසට මාගේ හෘදයංගම ස්තුතිය පළකිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

**වසන්තා පෙරේරා මහත්මිය**
**ලේකම්**

# ප්‍රගතිය 2021 සහ වැඩසටහන් 2022

## අන්තර්ගතය


| | | |
|---|---|---|
| 06 | සී/ස. ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම | 91-94 |
| 05 | සී/ස. ලංකා ගල් අඟුරු පුද්ගලික සමාගම | 85-89 |
| 04 | සී/ස. එල්ටීඑල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම | 69-83 |
| 03 | සී/ස. ලංකා විදුලි පුද්ගලික සමාගම | 61-67 |
| 02 | ලංකා විදුලිබල මණ්ඩලය | 21-59 |
| 01 | විදුලිබල අමාත්‍යාංශය | 01-19 |

# විදුලිබල අමාත්‍යාංශය

# පටුන


1. හැඳින්වීම, දැක්ම, මෙහෙවර....................02
2. අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යයන් හා ප්‍රධාන කර්තව්‍යයන්....................02
3. අමාත්‍යාංශයේ විෂයය පථය යටතේ වන ආයතන....................03
   - ලංකා විදුලිබල මණ්ඩලය
   - සී/ස. ලංකා විදුලි පුද්. සමාගම
   - සී/ස. එල්ටීඑල් හෝල්ඩිංග්ස් පුද්. සමාගම
   - සී/ස. ලංකා ගල් අඟුරු පුද්. සමාගම
   - සී/ස. ශ්‍රී ලංකා එනර්ජීස් පුද්. සමාගම
4. විදුලිබල අංශයේ තත්ත්වය - 2021....................03
   4.1 විදුලි ඉල්ලුම හා විදුලි පාරිභෝගිකයන්ගේ වර්ධනය....................04
5. 2021 වර්ෂයේ විදුලිබල අංශයේ ප්‍රගතිය....................05
   5.1 විදුලි ජනනය ඉහළ නැංවීම....................05
      (A) තාප විදුලිබල ජනනය....................05
      (B) පුනර්ජනනීය බලශක්ති ජනනය....................06
         - ජල විදුලිය....................06
         - සූර්යබල....................07
         - සුළංබල....................08
         - වෙනත්....................09
   5.2 විදුලි සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් සංවර්ධනය....................09
   5.3 අයවැය යෝජනා යටතේ ඉදිරිපත් කළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය....................12
      5.3.1 දැයට එළිය වැඩසටහන....................12
5.4 "ගම සමග පිළිසඳරක්" වැඩසටහනේ දී එකඟ වූ ක්‍රියාකාරකම් හි ප්‍රගතිය....................13
5.5 දේශගුණික විපර්යාස සඳහා ගන්නා ලද ක්‍රියාකාරකම් ....................13
   5.5.1 විදුලිබල ක්ෂේත්‍රයේ - ජාතිකව තීරණය කරන ලද දායකත්ව (NDCs)....................13
   5.5.2 කොළඹ හරිත සංවර්ධන සංවාදය....................14
6. 2022 සඳහා සැලසුම්....................14
   6.1 විදුලිබල ජනනය....................14
   6.2 සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් සංවර්ධනය....................18
7. 2021 වර්ෂයේ දී මුහුණ දුන් අභියෝග සහ එවැනි අභියෝග ජය ගැනීමට උපාය මාර්ග....................19

## 1. හැඳින්වීම, දැක්ම, මෙහෙවර

විදුලිබලය නූතන සමාජයේ ජීවනාලිය ලෙස හඳුන්වා දිය හැකි අතරම එය වේගවත් ආර්ථික සහ සමාජීය සංවර්ධනය සඳහා අවශ්‍යම මූලික යටිතල පහසුකමක් ලෙස පිළිගැනේ. මෙම වැදගත් අවශ්‍යතාවය හඳුනාගෙන විදුලිබල අංශයේ වගකීම් ඉටු කිරීම සඳහා රජය විසින් විදුලිබල අමාත්‍යාංශයත්, සුළං, සූර්ය හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයත් ලෙස අමාත්‍යාංශ දෙකක් පිහිටුවා ඇත. 2021 වර්ෂය වන විට රටේ විදුලියන මට්ටම 99.9% පමණ වන අතර විදුලිය වෙත ප්‍රවේශවීමේ හැකියාව 100% දක්වා ළඟා වී ඇත. 2020 වර්ෂයේ සිට අත්විඳින ලද COVID 19 වසංගත තතත්වයේ බලපෑම හේතුවෙන් 2021 වර්ෂයේ දී බලගැන්වීමට නියමිතව තිබූ ප්‍රධාන විදුලි සංවර්ධන ව්‍යාපෘති කිහිපයක්ම මාස ගණනාවක්ම ප්‍රමාද විය. COVID 19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුව ද 2021 වර්ෂයේ මැයි මස 06 වෙනි දින ශ්‍රී ලංකාවේ ප්‍රථම මහා පරිමාණ මෙගා වොට් 100ක සුළං බලාගාරය මන්නාරමේ දී බලගැන්වීම සහ මාර්තු 05 වෙනි දින ශ්‍රී ලංකාවේ ප්‍රථම මෙගා වොට් 300ක ද්‍රවීකෘත ස්වභාවික වායු බලාගාරයේ (LNG) ඉදිකිරීම් ආරම්භ කිරීම 2021 වර්ෂයේ දී අත්කර ගත් ප්‍රධාන ජයග්‍රහණ වේ.

2030 වර්ෂය වන විට රටේ විදුලි ඉල්ලුමෙන් 70%ක් පුනර්ජනනීය විදුලි ප්‍රභවයන් උපයෝගී කරගෙන ජනනය කිරීම සහ 2050 වන විට කාබන් උදාසීනභාවය සාක්ෂාත් කරගැනීම වර්තමාන රජයේ අපේක්ෂිත ප්‍රතිපත්ති ඉලක්කයන් වෙයි. ඉහත ඉලක්කයන්ට අදාළව අනාගතයේ දී නව ගල් අඟුරු බලාගාර කිසිවක් ඉදි නොකිරීමට ද රජය විසින් තීරණය කොට ඇත. මෙම ඉලක්ක ළඟා කර ගැනීම සඳහා දැනට පවතින විදුලි සම්ප්‍රේෂණ ජාලයේ විශ්වාසනීයත්වයත්, ස්ථාවරභාවයත් සහතික කිරීම සඳහා අවශ්‍ය ආයෝජන අවශ්‍යතාවයන් අමාත්‍යාංශය විසින් දැනටමත් හඳුනා ගෙන ඇත. රජයේ දැක්ම සාක්ෂාත් කර ගැනීමට පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය පෙරමුණු කර ගත් ව්‍යාපෘති රැසක් අඛණ්ඩව සංවර්ධනය කරනු ලැබේ.

*දැක්ම*

*තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක්*

*මෙහෙවර*

*විදුලි ජනනය, සම්ප්‍රේෂණය, බෙදාහැරීම හා සැපයීම, විදුලි බලාගාර සඳහා ගල් අඟුරු ප්‍රසම්පාදනය සහ විදුලි බලය සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් විදුලිබල ක්ෂේත්‍රයට නායකත්වය සැපයීම.*

## 2. අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යයන් හා ප්‍රධාන කර්තව්‍යයන්

2020 ඔක්තෝම්බර් 6 වන දින ප්‍රකාශයට පත් කරන ලද අංක 2196/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව, විදුලිබල අමාත්‍යාංශය වෙත, අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් විෂයයන් සහ ක්‍රියාවලීන් යටතේ ඉටු කිරීම සඳහා පහත සඳහන් සුවිශේෂී ප්‍රමුඛතා ලබා දී ඇත.

### (අ) විෂයයන් සහ කාර්යයන්

“සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා, ‘අඩු වියදම් විදුලි ජනන සම්මිශ්‍රණයක් හා කාර්යක්ෂම බෙදාහැරීමක් සහතික කිරීම’ සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව විදුලිබල විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ, ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

### (ආ) සුවිශේෂී ප්‍රමුඛතා

- ජනනය කරන ලද විදුලි බලයේ කාර්යක්ෂමතාව සහ උපරිම භාවිතය සහතික කිරීම සඳහා සුහුරුජාලයක් සංවර්ධනය කිරීම.
- පුනර්ජනනීය බලශක්ති, තාප බලාගාර, ස්වභාවික බලාගාර සම්මිශ්‍රණ තුලනය කරමින් විදුලි ජනනය සඳහා දරනු ලබන පිරිවැය අඩු කිරීම හා ජනනයේදී ඇතිවන අවිනිශ්චිතතා ඉවත් කිරීම.
- දිගුකාලීන අවශ්‍යතා පදනම් කරගත් විදුලි ජනන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
- විදුලි සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම.
- කාර්මික නිෂ්පාදන ක්‍රියාවලියේ ජාත්‍යන්තර තරඟකාරීත්වය පවත්නා පරිදි විදුලිබල පිරිවැය අවම කිරීම.

## 3. අමාත්‍යාංශයේ විෂයය පථය යටතේ වන ආයතන

ලංකා විදුලිබල මණ්ඩලය - වර්ෂ 1969 අංක 17 දරණ පනත මගින් සංස්ථාපනය කර ඇත. විදුලි බලය ජනනය කිරීම, එය සම්ප්‍රේෂණය කිරීම හා සියළුම කාණ්ඩයන්හි පාරිභෝගිකයන් සඳහා බෙදාහැරීම, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව (PUCSL) මගින් අනුමත කර ඇති මිල ගණන් අනුව ආදායම් එකතු කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙත බලය පවරා ඇත.

සී/ස. ලංකා විදුලි පුද්. සමාගම (LECO) - 54.84 % ක කොටස් හිමිකාරීත්වයක් සහිතව ලංකා විදුලිබල මණ්ඩලයේ උපයෝගී සමාගමක් වන මෙහි මහා භාණ්ඩාගාරය වෙත 43.56 % ක ද, නාගරික සංවර්ධන අධිකාරිය වෙත 0.79 % ක ද, දේශීය අධිකාරීන් වෙත 0.81 % ක සුළුතර කොටස් හිමිකාරීත්වයක් සහිතය.

සී/ස. එල්ටීඑල් හෝල්ඩිංග්ස් පුද්. සමාගම - 63 % ක කොටස් හිමිකාරීත්වයක් සහිතව ලංකා විදුලිබල මණ්ඩලයේ උපයෝගී සමාගමක් වන මෙහි සුළුතර කොටස් හිමිකාරීත්වය (37 %) එහි සේවකයන් සතුය.

සී/ස. ලංකා ගල් අඟුරු පුද්. සමාගම - 60 % ක කොටස් හිමිකාරීත්වයක් සහිතව ලංකා විදුලිබල මණ්ඩලයේ උපයෝගී සමාගමක් වන මෙහි මහා භාණ්ඩාගාරය වෙත 20%ක, ශ්‍රී ලංකා නැව් සංස්ථාව වෙත 10 % ක හා ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත 10% ක සුළුතර හිමිකාරීත්වයක් සහිතය.

සී/ස. ශ්‍රී ලංකා එනර්ජීස් පුද්. සමාගම (ලංකා විදුලිබල මණ්ඩලයට 100%ක හිමිකාරීත්වය සහිතයි.)

## 4. විදුලිබල අංශයේ තත්ත්වය - 2021

ජාතික විදුලිබල ජාලයේ වර්තමාන ස්ථාපිත ධාරිතාවය මෙගා වොට් 4,587 වන අතර එය 57% පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් හා 43%ක් පොසිල ඉන්ධනවලින් සමන්විත වේ. පොසිල ඉන්ධනවලින් 20%ක් ගල් අඟුරුවලින් ලැබෙන අතර ඉතිරිය ඉන්ධන තෙල් මඟින් සමන්විත වේ. සමස්ත ස්ථාපිත ධාරිතාවයෙන් 31% ප්‍රධාන ජල විදුලි බලාගාරයන්ගෙන් සමන්විත වන අතර එය පුනර්ජනනීය බලශක්තියේ ප්‍රධානම අංගයක් වේ. අනෙකුත් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව වන සුළං, සූර්ය, කුඩා පරිමාණ ජල විදුලි හා ජෛව ස්කන්ධ බලශක්තිය ද විදුලි ජනනයට යොදා ගැනෙන අතර එය සමස්ත ධාරිතාවයෙන් 26%කි. තාප විදුලි ජනන ප්‍රභවයන් ලෙස ගල් අඟුරු සහ තාප තෙල් (ඩීසල් හා දැවි තෙල්) යොදා ගැනෙන අතර එම බලාගාර ලංකා විදුලිබල මණ්ඩලය හා පුද්ගලික විදුලි නිෂ්පාදකයන් සතුව පවතියි.

| ප්‍රභවය | | ධාරිතාවය (මෙගා වොට්) | % | විදුලි බලාගාර සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ප්‍රධාන ජල විදුලි | | 1,399 | 31% | 17 |
| තාප | | | | |
| | තාප තෙල් (ලංවිම) | 604 | 13% | 9 |
| | තාප තෙල් (පුද්ගලික ) | 457 | 10% | 3 |
| | ගල් අඟුරු | 900 | 20% | 1 |
| අනෙකුත් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව | | | | |
| | කුඩා ජල විදුලිය | 425 | 18% | 213 |
| | සුළං | 248 | | 18 |
| | සූර්ය ( භූමිය මත ස්ථාපිත) | 91 | | 45 |
| | ඩෙන්ඩ්‍රෝ හා ජෛව ස්කන්ධ | 43 | | 12 |
| | WTE | 10 | | 1 |
| | සූර්ය පියැසි | 410 | 8% | |
| එකතුව | | **4,587** | | **319** |




*සමස්ත ස්ථාපිත ධාරිතාව - 2021 සැප්තැම්බර්*

- **විදුලි ජනනය.**

මෙම වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් මුල දක්වා මුළු දළ විදුලිබල ජනනය ගිගා වොට් පැය 11,055කි. එම විදුලි ජනනයෙන් 41% ජනනය කරනු ලැබුවේ, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් වන අතර, එයට 28%ක් වන ප්‍රධාන ජල විදුලි සහ 13%ක් වන අනෙකුත් පුනර්ජනනීය බලශක්ති (සුළං, භූමිය මත ඉදිකළ සූර්ය බලය, ජෛව ස්කන්ධ හා සූර්ය පියැසි) ඇතුළත් වෙයි. ජනන මිශ්‍රණයෙන් 59%ක් තාප ප්‍රභවයන් මඟින් ජනනය කළ බලශක්තියෙන් සමන්විත වන අතර ඒවා 40%ක් ගල් අඟුරු හා 19%ක් තාප තෙල්වලින් සමන්විත වේ.




*විදුලි ජනනය*
*(2021 සැප්තැම්බර් මුල දක්වා)*

## 4.1 විදුලි ඉල්ලුම හා විදුලි පාරිභෝගිකයන්ගේ වර්ධනය.

විදුලිය සඳහා ඇති ඉල්ලුම වාර්ෂිකව 5.5%ක අගයකින් වර්ධනය වන අතර උපරිම විදුලි ඉල්ලුම (Peak Demand) වාර්ෂිකව 3.7%ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2020 වර්ෂයේ දී COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන් සාමාන්‍ය දෛනික විදුලි ඉල්ලුම තරමක් අඩු වූ අතර එය ගිගා වොට් පැය 40ක් පමණ විය. කෙසේ වෙතත්, මේ වසර තුළ වාර්තා වූ සාමාන්‍ය දෛනික විදුලි ඉල්ලුම ගිගා වොට් පැය 44ක් පමණ වෙයි. 2021 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වාර්තා වූ දෛනික ඉහල විදුලි ඉල්ලුම (Peak Demand) මෙගා වොට් 2,717.46ක් විය. 2022 වර්ෂය සඳහා පුරෝකතනය කරන ලද විදුලි ඉල්ලුම ගිගා වොට් පැය 16,741ක් වන අතර 5.8%ක වර්ධන වේගයක් අපේක්ෂා කෙරෙයි.

2021 වර්ෂයේ සැප්තැම්බර් මස මුල වන විට මෙරට මුළු විදුලි පාරිභෝගිකයන් සංඛ්‍යාව 7,471,921කි. 2020 වර්ෂය අවසානයේ සිටි විදුලි පාරිභෝගිකයින් සංඛ්‍යාව 7,216,933ක් වූ අතර ඒ අනුව 2021 සැප්තැම්බර් දක්වා නව විදුලි සම්බන්ධතා 254,988ක් ලබා දී ඇත. විවිධ කාණ්ඩ යටතට අයත්වන විදුලි පාරිභෝගිකයන්ගේ සංඛ්‍යාව පහතින් දැක්වෙයි.

| විදුලි පාරිභෝගිකයන් (2021 අගෝස්තු දක්වා) | | (%) |
| --- | --- | --- |
| ගෘහස්ථ | 6,434,455 | 86 |
| ආගමික | 45,719 | 0.6 |
| පොදු අවශ්‍යතා | 907,019 | 12 |
| කර්මාන්ත | 69,914 | 0.9 |
| රාජ්‍ය | 9,423 | 0.01 |
| හෝටල් | 537 | 0.01 |
| කෘෂිකර්මාන්ත | 1,280 | 0.02 |
| තොග + වීදි ආලෝකකරණය | 3,574 | 0.05 |
| එකතුව | 7,471,921 | |




*පාරිභෝගික වර්ගීකරණය - 2021 අගෝස්තු*

## 5. 2021 වර්ෂයේ විදුලිබල අංශයේ ප්‍රගතිය.

### 5.1 විදුලි ජනනය ඉහල නැංවීම

මෙරට වර්ධනය වන විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ දිගු කාලීන ජනන සැලසුම්වලට අනුව නව විදුලි ජනන ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙයි. පහත සඳහන් ප්‍රතිපත්ති තුන මගින් විදුලිබල ජනනය පාලනය වෙයි.

- වර්ෂ 2030 වන විට රටේ විදුලිබල ජනනයෙන් 70%ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මගින් සපුරා ගැනීම.
- වර්ෂ 2050 වන විට කාබන්හරණ තත්ත්වය කරා ළඟා වීම.
- නව ගල් අඟුරු බලාගාර කිසිවක් ඉදි නොකිරීම.

ඉහත ප්‍රතිපත්ති සැළකිල්ලට ගනිමින් ලංකා විදුලිබල මණ්ඩලය විසින් නව දිගු කාලීන ජනන සැලැස්ම සකස් කරමින් පවතී.

අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන පහත සඳහන් විදුලි ජනන ව්‍යාපෘති 2021 වර්ෂයේ දී විවිධ ඉදිකිරීම් අදියරයන් හි ක්‍රියාත්මක විය.

**(A) තාප විදුලිබල ජනනය.**

**1. ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG) විදුලි බලාගාර**

- **මෙගා වොට් 300 - පළමු වන LNG බලාගාරය, කෙරවළපිටිය**

මෙම බලාගාරය ඉදි කිරීම සඳහා මුල් ගල තැබීමේ උත්සවය 2021 මාර්තු මස 05 වෙනි දින මෙහි ව්‍යාපෘති සංවර්ධන සමාගම වන සී/ස ලක්දනව් සමාගම මගින් සිදු කරන ලදී. මේ වන විට ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. ව්‍යාපෘතියට අදාළ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම 2021 ජූලි මස 19 දින ලංකා විදුලිබල මණ්ඩලය හා ව්‍යාපෘති සංවර්ධනකරු අතර අත්සන් කරනු ලැබීය. 2023 වර්ෂයේ මැද භාගය වන විට මෙම බලාගරයේ ඉදිකිරීම් නිම කිරීමට බලාපොරොත්තු වේ.

- **මෙගා වොට් 300 - දෙවන LNG බලාගාරය, කෙරවළපිටිය**

මෙම ව්‍යාපෘතිය සඳහා සුදුසු ආයෝජකයෙකු තෝරා ගැනීමට 2021 ජූනි 21 දින ලංකා විදුලිබල මණ්ඩලය විසින් යෝජනා (RFP) කැඳවා ඇති අතර, එය 2021 නොවැම්බර් 13 දිනෙන් අවසන් වේ. මේ වන විට ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. 2024 ඔක්තෝම්බර් මාසයේ දී ව්‍යාපෘතියේ වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

- **මෙගා වොට් 300 - තෙවන LNG බලාගාරය, කෙරවළපිටිය**

ව්‍යාපෘතියට අවශ්‍ය ඉඩම සංවර්ධනය කිරීම සඳහා වූ පාරිසරික බලපෑම් තක්සේරුව සම්පූර්ණ කර මහජන අදහස් ලබා ගැනීමට විවෘත කොට ඇත. ලංකා විදුලිබල මණ්ඩලය මෙම ව්‍යාපෘතියේ හවුල්කරුවන ඉන්දියාවේ නැෂනල් තර්මල් කෝපරේෂන් (NTPC) සමාගම සමග සාකච්ඡා කරමින් පවතී. ලංකා විදුලිබල මණ්ඩලය හා NTPC අතර හවුල් ව්‍යාපාර ගිවිසුම් අත්සන් කරන ලදී. හවුල් ව්‍යාපාර සමාගම පිහිටුවීම පිළිබඳ ලිපි සකස් කරමින් පවතී.

- **LNG සැපයුම් යටිතල පහසුකම් සංවර්ධනය**

ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG) ලංකාවට සම්පාදනය කර ගැනීමට අදාළව LNG පර්යන්ත පහසුකම් සඳහා පාවෙන ගබඩා සහිත ප්‍රතිවායුකරණ ඒකකය (FSRU) ගොඩනංවා අත්පත් කර මෙහෙයවීමේ පදනම මත (BOO) සහ LNG බෙදාහැරීමේ නල මාර්ග පද්ධතිය ගොඩනංවා, මෙහෙයවා, හුවමාරු කිරීමේ පදනම මත (BOOT) සංවර්ධනය කිරීමට අදාළ තරගකාරී ප්‍රසම්පාදන කැඳවීම ලංකා විදුලිබල මණ්ඩලය විසින් සිදු කොට ඇත. ප්‍රමාණවත් ගබඩා පහසුකම් සහිත ප්‍රතිවායුකරණ ධාරිතාවක් සහිත FSRU ඒකකය කෙරවලපිටිය වෙරළේ සිට කි.මී. 5ක දුරින් ස්ථානගත කෙරෙනු ඇත. මීට අදාළ මූල්‍ය යෝජනාවලිය විවෘත කොට ඇගයීම් කටයුතු සිදුවෙමින් පවතී. ර 2024 වසරේ මුල් කාර්තුවේ දී වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

**2. වායු ටර්බයින විදුලි බලාගාරය (මෙගා වොට් 35X3), කැළණිතිස්ස**

හදිසි විදුලි බිඳවැටීමක දී කොළඹ නගරයේ විදුලි පද්ධතිය යථාවත් කිරීමටත්, ඉහළ විදුලි ඉල්ලුම් අවස්ථාවල අවශ්‍ය විදුලිය සැපයීමටත්, බලාගාරයේ දැනට පවතින ටර්බයින වෙනුවට අලුත් වායු ටර්බයින සවි කෙරේ. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත මුදල ඩොලර් මිලියන 90කි. සැපයුම් ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පවතී. 2021 සැප්තැම්බර් 09 වෙනි දින ටෙන්ඩර් කැඳවීම අවසන් කොට තාක්ෂණික ඇගයීම් කටයුතු සිදුවෙමින් පවතී. 2021 සැප්තැම්බර් 24 මූල්‍ය යෝජනා විවෘත කරන ලද අතර මේ වන විට ඇගයීම සිදු වේ. 2022 වර්ෂයේ පෙබරවාරි වන විට ටෙන්ඩර්ය ප්‍රදානය කිරීමට අපේක්ෂිතයි.

**(B) පුනර්ජනනීය විදුලිබල ජනනය.**

**1. ජල විදුලි ජනන ව්‍යාපෘති**

- **උමා ඔය ජල විදුලි ව්‍යාපෘතිය - මෙගා වොට් 120**

උමා ඔය බහු කාර්යය සංවර්ධන ව්‍යාපෘතිය වාරිමාර්ග අමාත්‍යාංශය සහ විදුලිබල අමාත්‍යාංශය එක්ව ක්‍රියාත්මක කරනු ලබයි. බලාගාරයේ ස්ථාපිත ධාරිතාවය මෙ.වො. 120 (2 X මෙ.වො. 60) වන අතර අපේක්ෂිත වාර්ෂික බලශක්ති ජනනය ගිගා වොට් පැය 290ක් වෙයි. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත මුදල ඩොලර් මිලියන 530කි. ව්‍යාපෘතියේ වර්තමාන ඉදිකිරීම් ප්‍රගතිය 96% වන අතර 2021 දෙසැම්බර් 25 වන විට බලගැන්වීමට අපේක්ෂා කෙරේ.

- **බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාරය - මෙගා වොට් 35**

පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය (Clean Development Mechanism – CDM) යටතේ ලියාපදිංචිය ලබා ගත් ශ්‍රී ලංකාවේ ප්‍රථම මහා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය වන්නේ බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතියයි. ව්‍යාපෘතියේ අපේක්ෂිත බලශක්ති ජනනය ගිගා වොට් පැය 126කි. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 82කි. ව්‍යාපෘතියෙන් 97% අවසන් කර ඇති අතර 2021 වර්ෂය නිමවීමට ප්‍රථම බලාගාරය බලගැන්වීමට අපේක්ෂා කෙරේ.

- **මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය - මෙගා වොට් 31.5**

මෙම ව්‍යාපෘතිය මහනුවර දිස්ත්‍රික්කයේ උලපනේ ආශ්‍රිතව පිහිටා ඇත. මූල්‍යාධාර ආසියානු සංවර්ධන බැංකුව විසින් සපයන ලදී. ව්‍යාපතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 114කි. මෙමගින් අපේක්ෂිත වාර්ෂික විදුලි ජනනය ගිගා වොට් පැය 100 වන අතර මුළු ස්ථාපිත ධාරිතාවය මෙගා වොට් 31.5කි. මේ වන විට ඉදිකිරීම්වලින් 29% අවසන් කොට ඇත. 2023 නොවැම්බර් මාසයේ දී ව්‍යාපෘතිය බලගැන්වීමට බලාපොරොත්තු වේ.

- **සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතිය - මෙගා වොට් 14**

ධාරිතාවය මෙගා වොට් 7 බැගින් වන කුඩා පරිමාණ ජල විදුලි බලාගාර දෙකක් ලෙස මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට ඇත. ලංකා විදුලිබල මණ්ඩලයේ අනුබද්ධ ආයතනයක් වන ශ්‍රී ලංකා එනර්ජීස් ආයතනය මගින් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් සිදු කිරීමට බලාපොරොත්තු වන අතර 2023 වර්ෂයේ මැද භාගයේ දී අවසන් කිරීමට අපේක්ෂා කෙරෙයි.

- **තල්පිටිගල ජල විදුලි ව්‍යාපෘතිය - මෙගා වොට් 15**

තල්පිටිගල ජල විදුලි ව්‍යාපෘතිය වාරිමාර්ග අමාත්‍යාංශය මගින් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ එක්ව ක්‍රියාත්මක කරනු ලබයි. මේ වන විට ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී. 2024 වන විට බලාගාරය බලගැන්වීමට ලංකා විදුලිබල මණ්ඩලය අපේක්ෂා කෙරෙයි.

## 2. සූර්යවිදුලි ජනන ව්‍යාපෘති

- **සූර්යබල සංග්‍රාමය - සූර්ය පියැසි (වහළ මත ඉදි කරනු ලබන සූර්ය බලාගාර) වැඩසටහන**

සමාජයේ විවිධ කොටස් පුනර්ජනනීය බලශක්තිය පදනම් කරගත් විදුලි ජනනයට සම්බන්ධ කර ගැනීම සඳහා 2016 වර්ෂයේ දී සූර්යබල සංග්‍රාමය වැඩසටහන හඳුන්වා දෙන ලදී.

2019 වර්ෂයේ දී රජය විසින් ආසියානු සංවර්ධන බැංකුව මගින් ලබා දුන් ඩොලර් මිලියන 50ක ආධාර යටතේ ගෘහස්ථ, කාර්මික හා වාණිජ ආයතනවල වහල මත කි.වො. 5ක් දක්වා සූර්ය පියැසි ඉදි කිරීමට අඩු පොලී ණය පහසුකමක් හඳුන්වා දෙන ලදී. මෙම වැඩසටහන මගින් පමණක් වර්තමානයේ මෙගා වොට් 44ක් ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කර ඇත. 2021 ඔක්තෝම්බර් මාසය වන විට දී සූර්යබල සංග්‍රාමය වැඩසටහන මගින් ජාතික විදුලි ජාලයට එකතු කරන ලද ධාරිතාවය මෙ.වො. 410කි. ඒ හා සම්බන්ධ පද්ධති 34,219ක් ඇත.

- **භූමිය මත ඉදිකරනු ලබන කුඩා පරිමාණ සූර්ය බලාගාර (මෙ.වො.1 X 35 සහ මෙ.වො.1 X 70)**

මෙම ව්‍යාපෘති දෙක යටතේ, සම්පූර්ණ ධාරිතාවය මෙගා වොට් 105ක් වූ මෙ.වො. 1 බැගින් වූ සූර්ය බලාගාර පුද්ගලික ආයෝජන යටතේ සංවර්ධනය කරනු ලබයි. මෙගා වොට් 40ක් මේ වන විටත් සම්පූර්ණ කොට ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කර තිබේ. (මෙ.වො.1 X 35 යටතේ මෙගා වොට් 29ක් සහ මෙගා වොට් 1 X 70 යටතේ මෙ.වො. 12ක් ලෙස) මෙගා වොට් 14ක ධාරිතාවයක් සහිත බලාගාර මේ වන විට ඉදිකිරීම් අදියරේ පවතී. 2021 වර්ෂය අවසානයට ප්‍රථම සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ.

- **කෝමාරිකා වගාව සමග සම්බන්ධ කොට සංවර්ධනය කරනු ලබන පොලොන්නරුව (කඳුරුවෙල) මෙගා වොට් 10ක සූර්ය බලාගාරය.**

2020 වර්ෂයේ දී කොන්ත්‍රාත්තුව ප්‍රදානය කොට ඇති අතර 2022 වන විට නිමා කොට මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

- **මෙගා වොට් 1-10 දක්වා වූ සූර්ය බලාගාර (සම්පූර්ණ මෙගා වොට් 147)**

පෞද්ගලික ආයෝජන ලෙස සංවර්ධනය කිරීම සඳහා මෙ.වො. 1-10 දක්වා වූ සූර්ය විදුලි බලාගාර ව්‍යාපෘති 147ක් තෝරා ගත් අතර මෙ.වො. 84ක් සඳහා ටෙන්ඩර් ප්‍රදානය මාර්තු මස 02 සිදු කරන ලදී. ඉන් මෙ.වො. 54ක් සඳහා මේ වන විට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් තාවකාලික අනුමැතිය නිකුත් කර ඇත. 2022 සැප්තැම්බර් වන විට මෙම ව්‍යාපෘති බලගැන්වීමට අපේක්ෂා කෙරේ.

- **මෙගා වොට් 10 X 2 සූර්ය බලාගාර (වාලච්චේන හා වව්නතිව්)**

ව්‍යාපෘති සංවර්ධනකරුවන් ලංකා විදුලිබල මණ්ඩලය සමග ඉහත ව්‍යාපෘති සංවර්ධනය සඳහා විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම් අත්සන් කොට ඇත. වාලච්චේන බලාගාරය සඳහා සංවර්ධනකරු විසින් නව ස්ථානයක් යෝජනා කොට ඇත. 2022 සැප්තැම්බර් මස වන විට බලගැන්වීමට අපේක්ෂා කෙරේ.

- **භූමිය මත ඉදි කරනු ලබන කි.වො. 75 X 7,000 සූර්ය බලාගාර (ගමට බලාගාරයක්)**

2021 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාවක් ලෙස මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. 2021 – 2023 කාලසීමාව තුළ දේශීය හා පෞද්ගලික ආයෝජන මගින් මෙ.වො. 525ක ධාරිතාවයෙන් ජාතික විදුලි ජාලයට සම්බන්ධ කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මෙම වැඩසටහන යටතේ අවම වශයෙන් සෘජු රැකියා 10,000ක් හා වක්‍ර රැකියා අවස්ථා 20,000ක් පමණ උත්පාදනය කළ හැකි බව අපේක්ෂා කෙරේ. මෙහි ප්‍රථම අදියර යටතේ 2021 ඔක්තෝම්බර් 09 දින ව්‍යාපෘති 155ක් සංවර්ධනය කිරීම සඳහා ටෙන්ඩර් ප්‍රදානය සිදු කරන ලදී. 2022 නොවැම්බර් වන විට දෙවන අදියර ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

- **ඉන්දියානු ණය පහසුකම මත ක්‍රියාත්මක සූර්යබල ව්‍යාපෘති (ඇ.ඩොලර් මිලියන 100)**

මෙම ණය පහසුකම යටතේ රජයේ ගොඩනැගිලි මත සූර්ය පියැසි (ඇ.ඩොලර් මිලියන 85), ආගමික සිද්ධස්ථාන මත ඉදි කරන සූර්ය පියැසි (ඇ.ඩොලර් මිලියන 10), කුඩා පාවෙන සූර්ය බලාගාර දෙක (ඇ.ඩොලර් මිලියන 05) ඉදි කිරීමට අපේක්ෂිතයි.

ව්‍යාපෘතියට අදාළ ණය ගිවිසුම 2021 ජූනි මස 16 දින අත්සන් කරන ලදී. සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව සකස් කිරීමට අදාළ ඉන්දියානු උපදේශකවරුන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය මේ වන විට සිදු වේ. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් රජයේ ගොඩනැගිලිවල ව්‍යාපෘති ස්ථාන 2,377ක් හඳුනාගෙන ඇති අතර ඒ හා සම්බන්ධ තාක්ෂණික අධ්‍යයනයන් සිදු කරනු ලැබේ. ව්‍යාපෘතියේ තාක්ෂණික අධ්‍යයන කටයුතු හා අධීක්ෂණය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීන් 180ක් පුහුණු කොට ඇත. මේ යටතේ මෙගා වොට් 120ක ධාරිතාවයක් ස්ථාපිත කිරීමට අපේක්ෂිතයි.

- **මෙගා වොට් 100 සියඹලාණ්ඩුව සූර්යබල උද්‍යානය**

පාරිසරික බලපෑම් අධ්‍යයන සඳහා අනුමැතිය මධ්‍යම පරිසර අධිකාරියෙන් හිමි වී ඇත. ඔක්තෝම්බර් මස අවසානයේ දී ව්‍යාපෘතිය සඳහා යෝජනා කැඳවීමට අපේක්ෂා කෙරේ. උද්‍යානයට අවශ්‍ය ඉඩම්වල මායිම් සළකුණු කොට අවසන් කර ඇත. මෙමගින් ජනනය කරන විදුලිය ලබාගෙන සම්ප්‍රේෂණය කිරීම සඳහා අවශ්‍ය වන මැදගම - අම්පාර සම්ප්‍රේෂණ මාර්ගයේ වැඩිදියුණු කිරීමේ කටයුතු ආරම්භ කොට ඇත.

- **මෙගා වොට් 150 පුනරීන් සූර්යබල උද්‍යානය**

පාරිසරික හා සමාජ බලපෑම් අධ්‍යයනය මේ වන විට සිදුවෙමින් පවතින අතර අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ද සිදු වේ. මෙම ව්‍යාපෘතිය 2024 වර්ෂයේ දී සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ.

### 3. සුළංවිදුලි ජනන ව්‍යාපෘති

- **මෙගා වොට් 100 - මන්නාරම සුළංවිදුලි උද්‍යානය - "තම්බපවණි"**

ශ්‍රී ලංකාවේ ප්‍රථම මහා පරිමාණ සුළංවිදුලි උද්‍යානය වන්නේ, මන්නාරම දූපතේ දකුණු වෙරළ තීරයේ පිහිටි "තම්බපවණි" සුළං විදුලි උද්‍යානය වන අතර එය 2021 මැයි මස 06 වන දින සම්පූර්ණ ධාරිතාවයෙන් විදුලිය ජනනය කිරීම සඳහා බලගන්වන ලදී. මෙම උද්‍යානය මෙගා වොට් 3.45ක ධාරිතාවයෙන් යුත් අති නවීන සුළං ජනන යන්ත්‍ර (ටර්බයින) 30කින් සමන්විත වේ. මෙහි සමස්ථ ස්ථාපිත ධාරිතාවය මෙගා වොට් 103.5කි. මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන මෝසම් සුළං කාලයන් හි ශ්‍රී ලංකාවට ලැබෙන සුළං ප්‍රවාහවල සුළං බලය ප්‍රයෝජනයට ගත හැක. මේ වන විට අගෝස්තු දක්වා ගිගාවොට් පැය 204ක බලශක්තියක් ජනනය කර ඇත.



"තම්බපවණි"මන්නාරම සුළං විදුලි උද්‍යානය



මන්නාරම සුළං විදුලි උද්‍යානය විවෘත කිරීම

- **මෙගා වොට් 20 - මන්නාරම සුළං බලාගාරය**

"තම්බපවණි" ව්‍යාපෘතිය සඳහා ලබා ගත් ආසියානු සංවර්ධන බැංකු ණය මුදලේ ඉතිරිය භාවිතා කොට මන්නාරම ප්‍රදේශයෙන් තවත් මෙගා වොට් 20ක සුළං බලාගාරයක් ඉදි කිරීමට කටයුතු කරන අතර මීට අදාළ කොන්ත්‍රාත්තුව 2022 මුල් භාගයේ දී පිරිනැමීමට බලාපොරොත්තු වේ.

- **මෙගා වොට් 1- 10 බැගින් වූ කුඩා පරිමාණ සුළං බලාගාර (මෙ.වො. 60)**

පෞද්ගලික ආයෝජන මත මන්නාරම, මාදම්පේ සහ ත්‍රිකුණාමලය වැනි ප්‍රදේශවල සම්පූර්ණ ධාරිතාවය මෙගා වොට් 60ක් (ජනන ධාරිතාවය මෙගා වොට් 1 සිට 10 දක්වා) වන සුළං බලාගාර ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වේ. ත්‍රිකුණාමලය හා මන්නාරම සුළං බලාගාර ඉදි කිරීමට ටෙන්ඩර් ප්‍රදානය කොට ඇති අතර මාදම්පේ ප්‍රදානය කිරීමට නියමිතව ඇත. මන්නාරම මෙගා වොට් 10 සුළං බලාගාරය ඉදි කිරීමට මූලික පියවර ගෙන ඇත.

- **මෙගා වොට් 100 මන්නාරම සුළං විදුලි උද්‍යානය - දෙවන අදියර**

මෙම ව්‍යාපෘතියට අදාළ ශක්‍යතා අධ්‍යයනය, සමාජීය බලපෑම් අධ්‍යයනය හා පක්ෂි අධ්‍යයනය මේ වන විට සිදුවෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය හා පෞද්ගලික අංශයේ ආයෝජන මත සංවර්ධනය කෙරෙනු ඇත. ව්‍යාපෘතිය 2024දී නිම කිරීමට බලාපොරොත්තු වේ.

- **මෙගා වොට් 100 මන්නාරම සුළං විදුලි උද්‍යානය - තෙවන අදියර - මුල්ලිකුළම් සුළං විදුලි උද්‍යානය**

ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙම මෙ.වො. 100 සුළං විදුලි උද්‍යානය සංවර්ධනය කරන අතර ඒ සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් තාවකාලික අනුමැතිය ලබා ගෙන ඇත. පාරිසරික හා සමාජීය බලපෑම් අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වේ. මෙම ව්‍යාපෘතිය 2024දී අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

- **මෙගා වොට් 240 පුනරීන් සුළං විදුලි උද්‍යානය**

මෙහි පළමු අදියර වශයෙන් මෙගා වොට් 100ක සුළං විදුලි උද්‍යානයක් සංවර්ධනය කරනු ලබන අතර ඊට අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය මේ වන විට සිදු කරමින් පවතී. පාරිසරික හා සමාජීය බලපෑම් අධ්‍යයනය ද සිදු කරමින් පවතී. පළමු අදියර, 2024 වර්ෂයේ දී නිම කිරීමට අපේක්ෂා කෙරේ.

### 4. කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘති

මෙගා වොට් 5ක ධාරිතාවයෙන් (මෙ.වො. 3.5 සහ මෙ.වො. 1.4) යුත් කුඩා පරිමාණ ජල විදුලි බලාගාර දෙකක් ඉදිවෙමින් පවතින අතර 2021 අවසන් වීමට ප්‍රථම බලගැන්වීමට බලාපොරොත්තු වේ. මෙගා වොට් 13ක ධාරිතාවයෙන් යුත් කුඩා පරිමාණ ජල විදුලි බලාගාර හයක් (06)ක් ද ඉදිවෙමින් පවතින අතර 2022 වන විට බලගැන්වීමට බලාපොරොත්තු වේ.

### 5. ජෛව ස්කන්ධ සහ කසළවලින් විදුලිය නිපදවන විදුලි බලාගාර

- 2023 වර්ෂය වන විට ජෛව ස්කන්ධ විදුලි බලාගාරවලින් මෙගා වොට් 10ක ධාරිතාවයක් ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීමට බලාපොරොත්තු වේ.
- මුතුරාජවෙල, මෙගා වොට් 10ක කසළවලින් විදුලිය ජනනය කරන විදුලි බලාගාරය 2021 පෙබරවාරි 18 දින බලගන්වා වාණිජ මෙහෙයුම් ආරම්භ කරන ලදී.

## 5.2 විදුලි සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් සංවර්ධනය

ශ්‍රී ලංකාවේ විදුලි සම්ප්‍රේෂණ ජාලය කි.මී. 799 දිග කි.වෝ. 220 සම්ප්‍රේෂණ රැහැන් සහ කි.මී. 2,361 දිග කි.වෝ. 132 සම්ප්‍රේෂණ රැහැන් මාර්ගවලින් සමන්විත වන අතර එයට ජාල උපපොල 79ක් සහ ප්‍රාථමික ජාල උපපොල 134ක් සම්බන්ධ වෙයි. සම්ප්‍රේෂණ ජාලයේ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන්නේ, ලංකා විදුලිබල මණ්ඩලය මගිනි. 2021 වර්ෂයේ දී නාවලපිටිය සහ රාගල නව ජාල උපපොළවල් සහ ඒ ආශ්‍රිත සම්ප්‍රේෂණ රැහැන් මාර්ග ඉදිකිරීම් සම්පූර්ණ කොට බලගන්වන ලදී.

මෙරට විදුලි බෙදාහැරීම් ජාලය කි.මී. 33,138.27 දිග කි.වෝ. 33 රැහැන් මාර්ග සහ කි.මී. 2,448 දිග කි.වෝ. 11 රැහැන් සහ කි.මී. 150,169 දිග අඩුසැර බෙදාහැරීම් රැහැන් මාර්ගවලිනුත් 33,476ක් වන බෙදාහැරීම් ජාල උපපොලවල්වලිනුත් සමන්විත වෙයි.

පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මගින් ජනනය කරනු ලබන විදුලිය වැඩි වශයෙන් ඉතා කාර්යක්ෂමව විදුලි ජාල පද්ධතිය තුළට අවශෝෂණය කර ගැනීමේ අරමුණින් යුතුව සූර්ය සහ බැටරි ගබඩා පහසුකම් සහිත කුඩා පරිමාණ සුහුරු ජාල නියමු ව්‍යාපෘතියක් දැනට සංවර්ධනය කරමින් පවතින අතර එය 2022 පෙබරවාරි වන විට නිම කිරීමට බලාපොරොත්තු වේ.

ලංකා විදුලි පුද්ගලික සමාගම මගින් සවි කර ඇති සියළු සුහුරු විදුලි ජාල උපාංග අධීක්ෂණය කිරීමේ මධ්‍යම මෙහෙයුම් මධ්‍යස්ථානය ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සුහුරු මණු දත්ත මධ්‍යස්ථානයක් මේ වන විට ඉදිවෙමින් පවතින අතර 2021 නොවැම්බර් මස අවසානයේ දී නිම කෙරෙනු ඇත.

විදුලි සේවාවන් හි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා වැඩිදියුණු කළ බෙදාහැරීම් කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර ඇති අතර සියළුම විදුලි පාරිභෝගික සේවාවන් ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා විදුලි පුද්ගලික සමාගමේ පාරිභෝගික සේවා ද්වාරය ඔස්සේ මාර්ගගතව ලබා දීමට කටයුතු කොට ඇත.

ජාතික විදුලිබල පද්ධතියට වැඩි වශයෙන් පුර්ජනනීය බලශක්ති ප්‍රභවවලින් ජනනය කරන විදුලිය එකතු කර ගැනීමටත්, විශ්වාසදායක, ගුණාත්මක සහ අඛණ්ඩ විදුලි සම්ප්‍රේෂණයක් සහතික කරලීම සඳහාත් සම්ප්‍රේෂණ ජාල සංවර්ධන කටයුතු නිරන්තරයෙන්ම සිදු කරනු ලබයි. මෙම සංවර්ධන කටයුතු බොහොමයක්ම සිදු කරනු ලබන්නේ, ආසියානු සංවර්ධන බැංකුව, අන්තර්ජාතික ජපාන සහයෝගිතා ආයතනය සහ ප්‍රංශ සංවර්ධන ආයතනයන්හි මූල්‍යාධාර පහසුකම් මතයි. දැනට ඉදිකිරීම් තත්ත්වයේ පවතින ව්‍යාපෘති මගින් කිලෝ මීටර් 20 දිග කිලෝ වෝල්ට් 400 විදුලි සම්ප්‍රේෂණ රැහැන්, කිලෝ මීටර් 691 දිග කිලෝ වෝල්ට් 220 රැහැන් මාර්ග සහ කිලෝ මීටර් 585 දිග කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ රැහැන් මාර්ග නිම කෙරෙයි.

මේ වන විට අපගේ විදුලි ජාල පද්ධතියේ තාක්ෂණික හා වාණිජමය හානිය 9% සිට 8.35% දක්වා අඩු කර ඇත.

පහත දැක්වෙන සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ව්‍යාපෘති අදාළ කාල සීමාව තුළ අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය.

| | ව්‍යාපෘතිය | අරමුදල් සැපයීම | ප්‍රගතිය | නිම කිරීමේ දිනය |
|---|---|---|---|---|
| 1 | පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය<br>මාලිබොඩ, වේවැල්වත්ත, නාවලපිටිය හා රාගල නව ග්‍රිඩ් උපපොල ඉදි කිරීම.<br>කි.වෝ. 132 නව සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම. | ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය | 2021 ජූනි 23 දින නිම කරන ලදී. | අවසන් කොට ඇත. |
| 2 | සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ධාරිතාව පුළුල් කිරීම.<br>කප්පල්තුරේ කි.වෝ. 220/132 ග්‍රිඩ් උපපොල ඉදි කිරීම සහ කෙරවළපිටිය, කටුනායක, ත්‍රිකුණාමලය ග්‍රිඩ් උපපොල ආවර්ධනය. | ආසියානු සංවර්ධන බැංකුව | 96%ක් අවසන් | 2021 නොවැම්බර් 30 |
| | නව අනුරාධපුර ග්‍රිඩ් උපපොල ආවර්ධනය සහ කැස්බෑව, කළුතර හා පැරණි අනුරාධපුර ග්‍රිඩ් උපපොල ඉදි කිරීම. | ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය | 89%ක් අවසන් | 2021 නොවැම්බර් 30 |
| | කප්පල්තුරේ, කළුතර, කැස්බෑව හා පැරණි අනුරාධපුර ග්‍රිඩ් උපපොල වෙත කි.වෝ. 132 සම්ප්‍රේෂණ රැහැන් මාර්ග ඉදි කිරීම. | ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය | 2020.03.15 දින නිම කරන ලදී. | අවසන් කොට ඇත. |
| 3 | හම්බන්තොට කි.වෝ. 220 ග්‍රිඩ් උපපොල සංවර්ධනය. | ආසියානු සංවර්ධන බැංකුව | 92% අවසන් | 2021 නොවැම්බර් 30 |
| | නව පොල්පිටිය - හම්බන්තොට කි.මී. 150ක කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම. | | 75% අවසන් | 2022 මැයි 20 |
| 4 | නඩුකුඩා කිලෝ වෝල්ට් 220/33 ග්‍රිඩ් උපපොල ඉදි කිරීම,<br>මන්නාරම කි.වෝ. 220/33 ග්‍රිඩ් උපපොල ආවර්ධනය | ආසියානු සංවර්ධන බැංකුව | 2021 අප්‍රේල් 15 දින බලගන්වන ලදී. | අවසන් කොට ඇත. |
| | මන්නාරම - නඩුකුඩා කි.මී. 30ක කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම. | ආසියානු සංවර්ධන බැංකුව | 2020.08.17 දින නිම කරන ලදී. | දැනටමත් අවසන්ය. |
| | පාදුක්ක - හොරණ කි.මී. 25ක කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම. | ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය | 18% අවසන් | 2022 අප්‍රේල් 20 |
| | හබරණ වාලච්චේන කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගයේ දෙවන පරිපථය සවිබල ගැන්වීම. | ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය | 78% අවසන් | 2021 නොවැම්බර් 30 |
| 5 | කොළඹ B ග්‍රිඩ් උපපොල ඉදි කිරීම.<br>කොළඹ C - කොලොන්නාව ග්‍රිඩ් උපපොල දක්වා කි.වෝ. 132 තනි ආදාන හා ප්‍රතිදාන සම්බන්ධතාව 800mm2 රැහැන්<br>කොළඹ C හා කොලොන්නාව ග්‍රිඩ් උපපොල ආවර්ධනය. | ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය | 71% අවසන් | 2022 ජනවාරි 31 |
| 6 | කොටුගොඩ ග්‍රිඩ් උපපොල ආවර්ධනය<br>කොලොන්නාව ස්ටැන්ලි ග්‍රිඩ් උපපොල ආවර්ධනය<br>පාදුක්ක ස්විච්චපන්න අංගනය ආවර්ධනය<br>හොරණ ග්‍රිඩ් උපපොල ආවර්ධනය<br>දෙහිවල ග්‍රිඩ් උපපොල ආවර්ධනය<br>මාදම්පේ ග්‍රිඩ් උපපොල ආවර්ධනය | ආසියානු සංවර්ධන බැංකුව | 85% අවසන් | 2021 දෙසැම්බර් 31 |
| 7 | බියගම කි.වෝ. 220/33 ග්‍රිඩ් උපපොල ඉදි කිරීම.<br>බියගම ග්‍රිඩ් උපපොල ආවර්ධනය | ආසියානු සංවර්ධන බැංකුව | 93% අවසන්ය. | 2021 දෙසැම්බර් 31 |
| 8 | පන්නිපිටිය ග්‍රිඩ් උපපොලේ 100Mvar BSC ඉදි කිරීම. | ආසියානු සංවර්ධන බැංකුව | 63% අවසන් | 2022 ජනවාරි 31 |
| | බියගම ග්‍රිඩ් උපපොලේ SVC (ස්ථිතික වා පද්ධතිය) ඉදි කිරීම. | | 19% අවසන් | 2022 ඔක්තෝම්බර් 07 |
| | මහ කොළඹ ජාල උපපොලේ ධාරිත්‍රක බැංකු කණ්ඩන ස්ථාපිත කිරීම සහ තුල්හිරිය ජාල උපපොලේ ධාරිත්‍රක බැංකු නැවත සුසර කිරීම. | | මූල්‍ය ඇගයීම් සිදුවෙමින් පවතී. 2021 දෙසැම්බර් කොන්ත්‍රාත්තුව පිරිනැමීමට බලාපොරොත්තු වේ. | |

| | ව්‍යාපෘතිය | අරමුදල් සැපයීම | ප්‍රගතිය | නිම කිරීමේ දිනය |
|---|---|---|---|---|
| 9 | 300 kVA ක්ෂුද්‍ර ජාල (Micro Grid) නියමු ව්‍යාපෘතිය - (ලංකා විදුලි පුද්ගලික සමාගම විසින් ක්‍රියාත්මක කරන ලදී) | ආසියානු සංවර්ධන බැංකුව | 60% අවසන් | 2021 නොවැම්බර් 30 |
| 10 | කෙරවලපිටිය කි.වෝ. 220 ස්විච්චපන්න ස්ථානය ඉදි කිරීම. | ආසියානු සංවර්ධන බැංකුව | 12% අවසන් | 2022 අගෝස්තු 16 |
| 11 | හබරණ - වෙයන්ගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය<br>නව හබරණ කි.වෝ. 220/132/33 ග්‍රිඩ් උපපොල ඉදි කිරීම. | ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතය | 99% අවසන් | 2021 නොවැම්බර් 30 |
| | නව හබරණ වෙයන්ගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම.<br>ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ මාර්ගය<br>සිව් පරිපථ සම්ප්‍රේෂණ මාර්ගය | | ද්විත්ව පරිපථය (2021 මැයි 31 නිම කරන ලදී)<br>95% අවසන් | සිව් පරිපථ රැහැන් මාර්ගය (2022 මාර්තු 05) |
| 12 | ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ජාල සංවර්ධන හා කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය.<br>කි.වෝ. 400, කි.වෝ. 220 හා කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ග ඉදි කිරීම. | ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතය | 36% අවසන් | 2022 ජූලි 30 |
| | ග්‍රිඩ් උපපොලවල් ඉදි කිරීම. | | 65% අවසන් | 2021 දෙසැම්බර් 31 |
| | කි.වෝ. 220 හා කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ග ඉදි කිරීම. | | 37% අවසන් | 2022 ජුනි 14 |
| | ලොට් ඒ: දෙහිවල, ගල්කිස්ස හා බත්තරමුල්ල ප්‍රාථමික උපපොල බෙදාහැරීම් උපපොල හා කේබල් ඉදි කිරීම. | | 23% අවසන් | 2022 සැප්තැම්බර් 15 |
| 13 | කි.වෝ. 33 බෙදා හැරීමේ කුළුණු මාර්ග සහ ගැන්ට්‍රි ඉදි කිරීම.<br>පැරණි අනුරාධපුර ග්‍රිඩ් උපපොලේ සිට මහඉලුප්පල්ලම ගැන්ට්‍රිය දක්වා, කි.මී 2 -ත්ගාල ගැන්ට්‍රි සිට ස්ටෝර්ෆීල්ඩ් ගැන්ට්‍රි දක්වා, කි.මී . 4 කප්පල්තුරෙයි ග්‍රිඩ් උපපොලේ සිට වයිනාබේ ගැන්ට්‍රි දක්වා- කි.මී. 8.<br>ඇඹිලිපිටිය ග්‍රිඩ් උපපොලේ ග්‍රිඩ් උපපොලේ සිට වෙනිවෙලර - කි.මී. 10.5. මතුගම ග්‍රිඩ් උපපොලේ සිට බෙන්තොට ප්‍රාථමික උපපොළ දක්වා - කි.මී. 11.5 | ප්‍රාංශ සංවර්ධන නියෝජිතායතනය | 75% අවසන් | 2022 ජුනි 07 |
| | ඇතුල්කෝට්ටේ සහ බෙලිගහ ප්‍රදේශයේ දැනට පවතින කි.වෝ. 33/11 අංක 02 දරණ ප්‍රාථමික උපපොළ ආවර්ධනය කිරීම.<br>රත්තනපිටියේ ප්‍රාථමික උපපොළ ඉදි කිරීම. | ආසියානු සංවර්ධන බැංකුව | 37% අවසන් | 2022 සැප්තැම්බර් 22 |
| 14 | විදුලි පද්ධතියේ විශ්වසනීයත්වය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය<br>කිලෝමීටර් 300 ක් දිග කි.වෝ. 33 විදුලි රැහැන් මාර්ග සහ කි.වෝ. 33 ගැන්ට්‍රි 13ක් ඉදි කිරීම. | ආසියානු සංවර්ධන බැංකුව | 38% අවසන් | 2022 මාර්තු |
| 15 | ග්‍රාමීය විදුලියන ජාලය පුළුල් කිරීම හා බෙදාහැරීම් කාර්යසාධන අධීක්ෂණය සඳහා භාණ්ඩ සම්පාදනය හා බෙදා හැරීම. | ආසියානු සංවර්ධන බැංකුව | 2020 දෙසැම්බර් නිම කරන ලදී. | අවසන් කොට ඇත. |
| 16 | උතුරු පළාතේ දූපත් තුනක (නයිනතිව්, අනලතිව්, ඩෙල්ෆ්ට්) සුළං, සූර්ය හා ඩීසල් දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති බලාගාර ඉදි කිරීම. | ආසියානු සංවර්ධන බැංකුව | ප්‍රසම්පාදන ක්‍රියාවලිය සාර්ථකව අවසන් කර කොන්ත්‍රාත්කරු තෝරාගෙන ඇත. කොන්ත්‍රාත්තුව ලබා දීම සඳහා කැබිනට් අනුමැතිය බලාපොරොත්තුවෙන් පසුවෙයි. ලංකා විදුලිබල මණ්ඩලයේ තාක්ෂණික වාර්තාව පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණ බලාපොරොත්තු වෙමින් පවතී. | |

## 5.3 අයවැය යෝජනා යටතේ ඉදිරිපත් කළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

### 5.3.1 දැයට එළිය වැඩසටහන

ජාතික බෙදාහැරීම් ජාලය බොහෝ ග්‍රාමීය ප්‍රදේශ දක්වා ව්‍යාප්ත කර තිබුණ ද, සැළකිය යුතු ගෘහ ඒකක සංඛ්‍යාවක්, විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී පවුල් කිහිපයකට විදුලි සේවා සම්බන්ධතාවය ලබා ගැනීමට නොහැකි වී ඇත්තේ, ඒ සඳහා ගෙවිය යුතු මූලික පිරිවැය ගෙවීමේ හැකියාවක් නොමැති වීම හේතුවෙනි. එවැනි පවුල් සඳහා නොමිලේ විදුලි සේවා සම්බන්ධතාවය ලබා දීමට රජය විසින් තීරණය කරන ලදී. ඒ අනුව, 2021 අයවැය මගින් රුපියල් මිලියන 750ක මුදලක් මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කර දෙන ලදී. මේ සඳහා ප්‍රතිලාභීන් ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි පුද්ගලික සමාගම හා සමෘද්ධි සංවර්ධන අධිකාරිය එක්ව තෝරා ගනු ලැබීය.

මෙම වැඩසටහන 2021 මාර්තු 06 වන දින කුරුණෑගල, ගිරිබාව ගම්මානයේ දී ආරම්භ කරන ලදී. 2021 ඔක්තෝම්බර් මස 22 දින වන විට මෙමගින් නිවාස 24,547කට විදුලි සේවා සම්බන්ධතාවය නොමිලේ ලබා දීමට හැකි විය.

| | දිස්ත්‍රික්කය | ප්‍රතිලාභී නිවාස සංඛ්‍යාව | සම්බන්ධතා ලබා දී ඇති සංඛ්‍යාව | පිරිවැය (රු.මිලියන) |
|---|---|---|---|---|
| **1** | අම්පාර | 4,330 | 1,519 | 34.18 |
| **2** | අනුරාධපුරය | 6,565 | 2,317 | 52.13 |
| **3** | බදුල්ල | 4,281 | 1,231 | 27.70 |
| **4** | මඩකලපුව | 5,033 | 1,494 | 33.62 |
| **5** | කොළඹ | 2,363 | 404 | 9.09 |
| **6** | ගාල්ල | 3,319 | 1,333 | 29.99 |
| **7** | ගම්පහ | 4,923 | 842 | 18.95 |
| **8** | හම්බන්තොට | 6,088 | 1,200 | 27.00 |
| **9** | යාපනය | 2,753 | 1,740 | 39.15 |
| **10** | කළුතර | 2,242 | 299 | 6.73 |
| **11** | මහනුවර | 3,802 | 893 | 20.09 |
| **12** | කෑගල්ල | 2,681 | 501 | 11.27 |
| **13** | කිලිනොච්චිය | 1,505 | | |
| **14** | මුලතිව් | 1,810 | 1669 | 37.55 |
| **15** | කුරුණෑගල | 6,443 | 1,131 | 25.45 |
| **16** | මාතලේ | 2,157 | 216 | 4.86 |
| **17** | මාතර | 3,209 | 789 | 17.75 |
| **18** | මොනරාගල | 5,582 | 672 | 15.12 |
| **19** | නුවරඑළිය | 3,449 | 486 | 10.94 |
| **20** | පොළොන්නරුව | 2,442 | 635 | 14.29 |
| **21** | පුත්තලම | 4,196 | 772 | 17.37 |
| **22** | රත්නපුරය | 8,779 | 1,415 | 31.84 |
| **23** | ත්‍රිකුණාමලය | 4,174 | 1,605 | 36.11 |
| **24** | වව්නියාව | 1,486 | | |
| **25** | මන්නාරම | 1,680 | 1,360 | 30.60 |
| | **මුළු එකතුව** | **95,292** | **24,547** | **552.31** |

- මහනුවර මීමුරේ ප්‍රදේශයේ හුදකලාව පිහිටි ගම්මාන තුනක් (උඩගල්දෙබොක්ක, මැදකැලේ හා ගලමුදුන) සඳහා මේ වසර අවසාන වන විට සූර්යබල තාක්ෂණය ඔස්සේ විදුලිය ලබා දීමට සැලසුම් කොට ඇත.

### 5.4 "ගම සමග පිළිසඳරක්" වැඩසටහනේ දී එකඟ වූ ක්‍රියාකාරකම් හි ප්‍රගතිය.

#### 1. බදුල්ල දිස්ත්‍රික්කය, හල්දුම්මුල්ල (2021 සැප්තැම්බර් 23)

- පහත සඳහන් ගම්මාන සඳහා විදුලි සැපයුම ලබා දීම අවසන් කර ඇත.
- කුමාරතැන්න ගම්මානය
- කළුවල - අක්කර 100 ගම්මානය
- වෙලන්විට ගම්මානය
- කළුකැලේ ගම්මානය

#### 2. අම්පාර දිස්ත්‍රික්කය, උහන, ලාතුගල (2021 ජනවාරි 09)

- ලාතුගල ගම්මානයේ නිවාස 18කට විදුලිය ලබා දෙන ලදී.

#### 3.ගාල්ල දිස්ත්‍රික්කය, මාදම්පා ගම, ගලගොඩ ගම්මානය (2021 මාර්තු 13)

- කට්ටිකරන ලද ඉඩම් සඳහා විදුලිය ලබා දෙන ලෙස කළ ඉල්ලීම ඉටු කර ඇත.

#### 4. මහනුවර දිස්ත්‍රික්කය, මීමුරේ (2021 පෙබරවාරි 13)

උඩගල්දෙබොක්ක, මැදකැලේ සහ ගල මුදුන ගම්මාන සඳහා ජාලයෙන් බැහැර විදුලිය (සූර්යබල තාක්ෂණය) ලබා දීම සිදු කෙරේ. මේ සඳහා දැයට එළිය වැඩසටහන යටතේ රුපියල් මිලියන 43.9ක් වෙන් කරන ලදී. 2021 වර්ෂය අවසන්වීමට ප්‍රථම මෙම ව්‍යාපෘතිය නිම කිරීමට බලාපොරොත්තු වේ.

- ගම්මාන තුනෙහි පොදු ස්ථානවල සූර්ය බලයෙන් ක්‍රියාත්මකවන විදී ලාම්පු සවි කිරීම අවසන් කර ඇත.
- ගල මුදුන හා උඩගල්දෙබොක්ක ගම්මාන සඳහා බැටරි ආරෝපණ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම අවසන් කරන ලදී.
- ගල මුදුන ගම්මානයේ ක්ෂුද්‍ර ජල විදුලි බලාගාර දෙකක ප්‍රතිසංස්කරණ කටයුතු සිදු වෙමින් පවතී.

#### 5.කෑගල්ල දිස්ත්‍රික්කය, දැරණියගල, දික්ඇල්ල කන්ද (2021 පෙබරවාරි 06)

- සීතාවක ගඟ ජලවිදුලි බලාගාරයේ කටයුතු සිදු වෙමින් පවතින අතර 2023 වර්ෂයේ මැද භාගයේ දී නිම කිරීමට අපේක්ෂා කෙරෙයි.

#### 6. පොළොන්නරුව දිස්ත්‍රික්කය, මැදිරිගිරිය, වෙඩිකච්චිය (2021 ජනවාරි 16)

- මැදිරිගිරිය ප්‍රදේශයේ නිතර නිතර සිදු වූ විදුලි බිඳවැටුම් පරීක්ෂා කර බලා නිවැරදි කර ඇත.
- එකමුතුගම ගම්මානයට විදුලි සැපයුම ලබා දීම අවසන් කරන ලදී.
- දර්ශනපුර, දහම්වැව සහ වෙඩිකච්චිය ගම්මානවල අඩු ආදායම්ලාභීන්ට විදුලි සම්බන්ධතාවය ලබා දීම සිදු කරමින් පවතී. මේ වන විට 95%කට විදුලිය ලබා දී ඇති අතර ඉතිරිය 2021අවසන් වීමට ප්‍රථම නිම කිරීමට බලාපොරොත්තු වේ.

#### 7. වව්නියාව දිස්ත්‍රික්කය, බෝගස්වැව (2021 අප්‍රේල් 03)

- සපුමල්ගස්කඩ රජමහා විහාරයට සූර්යබල තාක්ෂණය මගින් විදුලිය ලබා දීමේ කටයුතු සිදුවෙමින් පවතී. මේ සඳහා දැයට එළිය වැඩසටහනෙන් රුපියල් මිලියන 4.95ක මුදලක් වෙන් කොට ඇත.
- කිරිඉබ්බන්වැව හමුදා මුරපොළ අසල සිට හැලඹ වැව ප්‍රධාන මාර්ගය ඔස්සේ සුසාන භූමිය දක්වා ජාලගත විදුලි සැපයුම ලබා දීම මේ වන විට සිදුවෙමින් පවතී. දැයට එළිය වැඩසටහනෙන් මේ සඳහා රුපියල් මිලියන 17.59ක් වෙන් කොට ඇත.
- මහවැලි එල් කලාපයේ පැරණි ගොවිපලේ සිට ඩෙන්සිල් කොබ්බෑකඩුව මාර්ගය දක්වා වගාබිම්වලට විදුලිය සැපයීම මේ වන විට සිදුවෙමින් පවතී. දැයට එළිය වැඩසටහන යටතේ මේ සඳහා රුපියල් මිලියන 5.19ක් වෙන් කොට ඇත.

### 5.5 දේශගුණික විපර්යාස සඳහා ගන්නා ලද ක්‍රියාකාරකම්

#### 5.5.1 විදුලිබල ක්ෂේත්‍රයේ - ජාතිකව තීරණය කරන ලද දායකත්ව (NDCs)

බලශක්ති ක්ෂේත්‍රයේ NDCs සඳහා පහත දැක්වෙන ප්‍රතිපත්ති, ඉලක්කයන් රජය විසින් දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය වෙත ප්‍රකාශ කර ඇත.

- වසර 2030 වන විට රටේ විදුලි ඉල්ලුමෙන් 70% පුනර්ජනනීය බලශක්ති මගින් සාක්ෂාත් කර ගැනීම.
- වසර 2050 වන විට පූර්ණ කාබන්හරණ තත්ත්වයකට ලඟා වීම.
- නව ගල් අඟුරු බලාගාර කිසිවක් ස්ථාපිත නොකිරීම.

2021 වර්ෂයේ විදුලිබල ක්ෂේත්‍රයේ NDCs යාවත්කාලීන කරන ලද අතර ඒ අනුව, සාමාන්‍ය පවතින වාතාවරණය යටතේ, අපේක්ෂිත හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම 25%ක් වෙයි. (කොන්දේසි විරහිතව 5% හා කොන්දේසි සහිතව 20%) වර්ෂ 2021 – 2030 කාලසීමාව තුළ ඇස්තමේන්තුගත හරිතාගාර වායු විමෝචන අඩු කිරීම කොන්දේසි විරහිතව මෙට්‍රික් ටොන් 9,819,000ක් වන අතර කොන්දේසි සහිතව මෙට්‍රික් ටොන් 39,274,000කි. (සම්පූර්ණ අගය කාබන්ඩයොක්සයිඩ් මෙට්‍රික් ටොන් 49,093,000)

### 5.5.2 කොළඹ හරිත සංවර්ධන සංවාදය

ජාතික හරිත සංවර්ධන න්‍යාය පත්‍රය සකස් කිරීමට දායකවීමට සහ හරිත සංවර්ධනය පිළිබඳ අඛණ්ඩ වැඩපිළිවෙල ප්‍රවර්ධනය කිරීම සඳහා අදාළ වන විවිධ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් යුත් වේදිකාවක් පිහිටුවීම සඳහා සහයෝගය දැක්වීමේ අරමුණින් 2021 වර්ෂයේ දී පරිසර අමාත්‍යාංශය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හා අනෙකුත් පාර්ශවකරුවන් සමඟ අමාත්‍යාංශය විසින් ප්‍රතිපත්තිමය සංවාද මාලාවක් ආරම්භ කරන ලදී.

## 6. 2022 සඳහා සැලසුම්

### 6.1 විදුලිබල ජනනය

#### (i) ජලවිදුලි ජනනය

- මෙගා වොට් 14 සීතාවක ගඟ ජල විදුලි බලාගාරය - 2022 වර්ෂයේ දී මෙහි ඉදිකිරීම් ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

#### (ii) සූර්ය විදුලි ජනනය

- මෙගා වොට් 100 සියඹලාණ්ඩුව සූර්ය විදුලි උද්‍යානය - මෙම උද්‍යානය සංවර්ධනය කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව 2022 වර්ෂයේ දී ප්‍රදානය කිරීමට බලාපොරොත්තු වේ.
- මෙගා වොට් 150 පූනරීන් සූර්ය විදුලි උද්‍යානය - සූර්ය විදුලි උද්‍යානය සංවර්ධනය කිරීමට යෝජනා කැඳවීම සහ පාරිසරික හා සමාජ බලපෑම් අධ්‍යයනය අවසන් කිරීමට අපේක්ෂා කෙරෙයි.
- කි.වෝ. 75 X 7,000 භූමිය මත ඉදිකරන සූර්ය බලාගාර (ගමට බලාගාරයක්)
  භූමිය මත ඉදි කරනු ලබන සහ පවතින බෙදාහැරීම් තරාපැව්වලට සම්බන්ධ කරන සූර්ය බලාගාර වැඩසටහනේ පළමු අදියර යටතේ, සූර්ය බලාගාර 155ක් 2022 වර්ෂයේ දී බලගන්වනු ලබන අතර දෙවන අදියරේ ඉදිකිරීම් සඳහා ටෙන්ඩර් කැඳවීමට අපේක්ෂා කෙරේ.
- මෙගා වොට් 147 කුඩා පරිමාණ සූර්ය බලාගාර - මේ යටතේ මෙ.වො. 84ක ධාරිතාවයකින් යුත් බලාගාරවල වැඩ අවසන් කොට බලගැන්වීම 2022 සැප්තැම්බර් මස සිදු කිරීමට අපේක්ෂිතයි.
- ඇ.ඩො.මි. 100ක ඉන්දියානු ණය ආධාර යටතේ ක්‍රියාත්මක සූර්ය විදුලි බලාගාර - මෙහි විදුලි බලාගාර ස්ථාපිත කිරීමේ කටයුතු සිදු කිරීමට අපේක්ෂිත අතර 2023 මෙ.වො. 120ක ධාරිතාවයක් ජාතික ජාලයට එකතු කිරීමට බලාපොරොත්තු වේ.

#### (iii) සුළං විදුලි ජනනය

- මෙගා වොට් 20/50 මන්නාරම සුළං බලාගාරය - 2022 වර්ෂයේ මුල් කාර්තුව තුළ දී මෙම ව්‍යාපෘතියට අදාළ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනැමීමට බලාපොරොත්තු වේ.
- මෙගා වොට් 100 - මන්නාරම සුළංවිදුලි උද්‍යානය - දෙවන අදියර - මෙම උද්‍යානය සංවර්ධනයට අදාළ යෝජනාවලි කැඳවීම 2022 වර්ෂයේ දී සිදු කිරීමටත්, 2024 වන විට ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමටත් බලාපොරොත්තු වේ.
- මෙගා වොට් 100 - මන්නාරම, මුල්ලිකුලම් සුළංවිදුලි උද්‍යානය - තෙවන අදියර - මෙහි පාරිසරික හා සමාජ බලපෑම් අධ්‍යයනය 2022 වර්ෂයේ නිම කොට ඉදි කිරීම් ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.
- මෙගා වොට් 100 පූනරීන් සුළංවිදුලි උද්‍යානය - පළමුවන අදියර - 2022 වර්ෂයේ දී ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු නිම කිරීමටත් උද්‍යානය සංවර්ධනය සඳහා යෝජනාවලි කැඳවීමටත් බලාපොරොත්තු වේ.
- මෙගා වොට් 5 සහ මෙගා වොට් 10 මන්නාරම සුළං බලාගාර - මෙම බලාගාරවල ඉදිකිරීම් 2022 වර්ෂයේ ආරම්භ කෙරෙනු ඇත.
- මෙගා වොට් 10 සුළං විදුලි බලාගාරය - ත්‍රිකුණාමලය - ඉදිකිරීම් 2022 වර්ෂයේ දී ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

සුළං, සූර්යබල හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් පෞද්ගලික ආයෝජකයින්ගෙන් ධාරිතාවය මෙගා වොට් 50ට වැඩි පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කිරීමට අදාළව ගොඩනංවා, සතුකොට මෙහෙයවීම (BOO) ක්‍රමය යටතේ කැමැත්ත ප්‍රකාශ කිරීම (Expression of Interest) 2021 සැප්තැම්බර් මාසයේ දී කැඳවන ලදී. 2022 වර්ෂයේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීමට බලාපොරොත්තු වේ.

### (iv) කුඩා පරිමාණ ජල විදුලි ජනනය

2022 වර්ෂයට අදාළ ධාරිතා එකතු කිරීම් පහත පරිදි වේ.

| | ස්ථානය | ධාරිතාවය (මෙ.වො.) | සම්පූර්ණවන වසර | මුළු ධාරිතාවය (මෙ.වො.) |
|---|---|---|---|---|
| 01 | මාගල් ගඟ | 2.8 | 2022 | 13 |
| 02 | දිග්ගල | 4.4 | | |
| 03 | කටාරන් ඔය | 0.5 | | |
| 04 | ඇල්ලමුල්ල | 1.5 | | |
| 05 | හත්මලඇල්ල | 2.0 | | |
| 06 | දඹුලු ඔය ජලාශය | 1.6 | | |

### (V) ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG) ජනනය

- **මෙගා වොට් 300 - පළමු LNG බලාගාරය, කෙරවළපිටිය -** "සොබාදනවි" ව්‍යාපෘතියේ ප්‍රධාන ඉදිකිරීම් කටයුතු නිම කොට වර්ෂ 2023 මැද භාගය වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.
- **මෙගා වොට් 300 - දෙවන LNG බලාගාරය, කෙරවළපිටිය -** මෙම ව්‍යාපෘතිය සංවර්ධනය කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව 2022 වර්ෂයේ දී සුදුසු ආයෝජකයෙකු වෙත ප්‍රදානය කිරීමට බලාපොරොත්තු වේ.
- **LNG සැපයුම් යටිතල පහසුකම් සංවර්ධනය -** LNG පර්යන්ත පහසුකම්වලින් සමන්විත FSRU ඒකකය ගොඩනංවා සතු කොට මෙහෙයවීමේ (BOO) පදනම මත සහ LNG නල මාර්ග පද්ධතිය ගොඩනංවා, මෙහෙයවා පවරා දීමේ (BOOT) පදනම මත - 2022 වර්ෂයේ දී අදාළ ප්‍රසම්පාදන කටයුතු නිම කෙරෙනු ඇති අතර 2024 වර්ෂයේ මුල දී මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

**(Vi) මෙගා වොට් 130 - වායු ටර්බයින විදුලි බලාගාරය - කැළණිතිස්ස -** මෙම ව්‍යාපෘතියට අදාළ ටෙන්ඩරය නොබෝ දිනකින්ම ප්‍රදානය කිරීමට බලාපොරොත්තු වේ.

**2030 වන විට පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් උපයෝගී කර ගනිමින් රටේ විදුලි ඉල්ලුමෙන් 70% ජනනය කිරීමට අදාළ සැලසුම්.**

විදුලිබල අමාත්‍යාංශය, රාජ්‍ය අමාත්‍යාංශය හා අමාත්‍යාංශයේ අනෙකුත් අදාළ ආයතන සමඟ රජයේ ප්‍රතිපත්ති, ඉලක්ක ළඟා කර ගැනීමට අදාළ සැලසුම් සකස් කරන අතර පහත සඳහන් සැලසුම් මේ වන විටත් නිමා කොට ඇත.

| විදුලි ජනන ධාරිතා සැලැස්ම (2020-2030) | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ස්ථාපිත ධාරිතාව (මෙවො )- 2020 | අතිගරු ජනාධිපතිතුමාගේ දැක්ම අනුව බලශක්ති උත්පාදන ධාරිතා එකතු කිරීම (මෙ.වො.) | | | | | | | | | |
| | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 |
| **පවිත්‍ර බලශක්තිය** | | | | | | | | | | | |
| **පුනර්ජනනීය බලශක්තිය** | **2,430 (52%)** | **2,980** | **3,367** | **3,883** | **4,478** | **4,906** | **6,028** | **7,178** | **8,443** | **9,523** | **11,148 (82%)** |
| **ප්‍රධාන ජලවිදුලිය** | | | | | | | | | | | |
| ලක්ෂපාන | 354 | 354 | 354 | 354 | 354 | 354 | 354 | 354 | 354 | 354 | 354 |
| මහවැලි | 817 | 817 | 817 | 817 | 817 | 817 | 817 | 817 | 817 | 817 | 817 |
| සමනල | 212 | 212 | 212 | 212 | 212 | 212 | 212 | 212 | 212 | 212 | 212 |
| මොරගොල්ල | | | | 32 | 32 | 32 | 32 | 32 | 32 | 32 | 32 |
| බ්‍රෝඩ්ලන්ඩ්ස් | | 35 | 35 | 35 | 35 | 35 | 35 | 35 | 35 | 35 | 35 |
| උමා ඔය | | 120 | 120 | 120 | 120 | 120 | 120 | 120 | 120 | 120 | 120 |
| සීතාවක ගඟ | | | | 14 | 14 | 14 | 14 | 14 | 14 | 14 | 14 |
| තල්පිටිගල | | | | | 15 | 15 | 15 | 15 | 15 | 15 | 15 |
| | | | | | | | | | | | |
| **කුඩා පරිමාණ ජල විදුලිය** | 423 | 427 | 440 | 455 | 485 | 520 | 617 | 700 | 700 | 700 | 700 |
| | | | | | | | | | | | |
| **සුළං** | | | | | | | | | | | |
| මන්නාරම | 30 | 100 | 100 | 100 | 250 | 250 | 250 | 250 | 250 | 250 | 250 |
| පූනරීන් | | | | | 100 | 233 | 233 | 233 | 233 | 233 | 233 |
| වෙනත් | 149 | 149 | 149 | 204 | 204 | 204 | 204 | 211 | 411 | 711 | 1,011 |
| (Off Shore) | | | | | | | 500 | 1,000 | 1,500 | 1,500 | 2,000 |
| | | | | | | | | | | | |

| විදුලි ජනන ධාරිතා සැලැස්ම (2020-2030) | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ස්ථාපිත ධාරිතාව (මෙවො )- 2020 | අතිගරු ජනාධිපතිතුමාගේ දැක්ම අනුව බලශක්ති උත්පාදන ධාරිතා එකතු කිරීම (මෙ.වො.) | | | | | | | | | |
| | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 |
| **සූර්ය** | | | | | | | | | | | |
| සියඹලාණ්ඩුව | | | | 100 | 100 | 100 | 100 | 100 | 100 | 100 | 100 |
| සූර්ය පියැසි | 337 | 474 | 564 | 654 | 744 | 844 | 944 | 1,044 | 1,144 | 1,244 | 1,344 |
| වෙනත් | 70 | 225 | 495 | 695 | 895 | 1,025 | 1,360 | 1,600 | 1,840 | 2,090 | 2,370 |
| | | | | | | | | | | | |
| **වෙනත් පුනර්ජනනීය ප්‍රභව** | | | | | | | | | | | |
| ජෛව ස්කන්ධ බලශක්තිය | 38 | 67 | 81 | 91 | 101 | 111 | 121 | 141 | 161 | 181 | 201 |
| පොම්පාගාර විදුලිය | | | | | | | | | | 200 | 400 |
| බැටරි ගබඩා පහසුකම් | | | | | | 20 | 100 | 300 | 500 | 700 | 900 |
| මුහුදු රළ | | | | | | | | | 5 | 5 | 10 |
| භූ තාපය | | | | | | | | | | 10 | 30 |
| | | | | | | | | | | | |
| **ද්‍රවීකෘත ස්වභාවික වායු** | | | | **310 (5%)** | **660** | **977** | **977** | **977** | **977** | **977** | **977 (7%)** |
| කෙරවලපිටිය | | | | 310 | 660 | 977 | 977 | 977 | 977 | 977 | 977 |
| | | | | | | | | | | | |
| **පවිත්‍ර නොවන බලශක්තිය** | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| **ගල් අඟුරු** | **900 (19%)** | **900** | **900** | **900** | **900** | **900** | **900** | **900** | **900** | **900** | **900 (7%)** |
| නොරොච්චෝලේ | 900 | 900 | 900 | 900 | 900 | 900 | 900 | 900 | 900 | 900 | 900 |
| | | | | | | | | | | | |
| **ඩීසල්** | **536 (11%)** | **536** | **536** | **646** | **592** | **275** | **275** | **275** | **275** | **275** | **275 (2%)** |
| කැළණිතිස්ස | 115 | 115 | 115 | 225 | 225 | 225 | 225 | 225 | 225 | 225 | 225 |
| කැළණි(18*3)** | 54 | 54 | 54 | 54 | | | | | | | |
| Sojitz | 163 | 163 | 163 | 163 | 163 | | | | | | |
| ඒකාබද්ධ චක්‍රීය | 154 | 154 | 154 | 154 | 154 | | | | | | |
| තල්පිටිය, කොළොන්නාව, මතුගම (1*50) | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 |
| | | | | | | | | | | | |
| **දැවි තෙල්** | **839 (18%)** | **508** | **508** | **508** | **208** | **208** | **208** | **208** | **208** | **208** | **208 (2%)** |
| සපුගස්කන්ද (18*4) | 52 | 52 | 52 | 52 | 52 | 52 | 52 | 52 | 52 | 52 | 52 |
| සපුපස්කන්ද (9*8) | 72 | 72 | 72 | 72 | 72 | 72 | 72 | 72 | 72 | 72 | 72 |
| බත්තල විදුලි බලාගාරය | 60 | 60 | 60 | 60 | 60 | 60 | 60 | 60 | 60 | 60 | 60 |
| උතුරුජනනී | 24 | 24 | 24 | 24 | 24 | 24 | 24 | 24 | 24 | 24 | 24 |
| West Coast | 300 | 300 | 300 | 300 | | | | | | | |
| ACE ඇඹිලිපිටිය | 100 | | | | | | | | | | |
| ACE මාතර | 20 | | | | | | | | | | |
| AES | 163 | | | | | | | | | | |
| ඒෂියා පවර් | 48 | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| මුළු එකතුව | **4,705** | **4,924** | **5,311** | **6,247** | **6,838** | **7,266** | **8,388** | **9,538** | **10,803** | **11,883** | **13,508** |

| විදුලි ජනන සැලැස්ම 2022-2030 | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අතිගරු ජනාධිපතිතුමාගේ දැක්ම අනුව විදුලි ජනනය (ගි.වො.පැ) | | | | | | | | |
| | **2022** | **2023** | **2024** | **2025** | **2026** | **2027** | **2028** | **2029** | **2030** |
| **පවිත්‍ර බලශක්තිය** | | | | | | | | | |
| **පුනර්ජනනීය විදුලි ජනනය (ගි.වො.පැ.)** | **9,594** | **10,739** | **11,393** | **13,021** | **14,133** | **15,116** | **16,218** | **18,419** | **19,825** |
| **පුනර්ජනනීය විදුලිය විදුලි ඉල්ලුමෙන් (%) ලෙස** | **52.7%** | **55.8%** | **56.0%** | **60.4%** | **61.9%** | **62.6%** | **63.8%** | **68.8%** | **70.3%** |
| **ප්‍රධාන ජලවිදුලිය** | **5,078** | **5,507** | **5,417** | **6,035** | **5,838** | **5,585** | **5,541** | **6,118** | **5,759** |
| ලක්ෂපාන | 1,558 | 1,601 | 1,438 | 1,596 | 1,592 | 1,448 | 1,535 | 1,477 | 1,550 |
| මහවැලි | 2,386 | 2,804 | 2,653 | 3,135 | 2,767 | 2,566 | 2,806 | 3,172 | 2,643 |
| සමනල | 762 | 679 | 660 | 721 | 875 | 818 | 583 | 889 | 740 |
| මොරගොල්ල | | | 135 | 130 | 154 | 161 | 151 | 143 | 157 |
| බ්‍රෝඩ්ලන්ඩ්ස් | 164 | 174 | 159 | 197 | 209 | 183 | 186 | 184 | 186 |
| උමා ඔය | 207 | 249 | 372 | 255 | 240 | 408 | 281 | 253 | 484 |
| **කුඩා පරිමාණ ජල විදුලිය** | **1,456** | **1,519** | **1,582** | **1,645** | **1,692** | **1,739** | **1,786** | **1,833** | **1,880** |
| **සුළං** | **733** | **833** | **957** | **1,279** | **1,899** | **2,316** | **2,645** | **3,469** | **4,364** |
| මන්නාරම | 322 | 370 | 434 | 756 | 1,077 | 1,077 | 1,077 | 1,077 | 1,077 |
| පූනරීන් | | | | | 298 | 716 | 716 | 716 | 716 |
| වෙනත් | 412 | 463 | 523 | 523 | 188 | 188 | 852 | 1,676 | 2,571 |
| **සූර්ය** | **1,758** | **2,242** | **2,729** | **3,285** | **3,857** | **4,487** | **5,118** | **5,731** | **6,413** |
| **ජෛව ස්කන්ධ බලශක්තිය** | **568** | **638** | **708** | **778** | **848** | **988** | **1,128** | **1,268** | **1,409** |
| **ගබඩා පහසුකම්** | | | | * | * | * | * | * | * |
| පොම්පාගාර ජල විදුලි | | | | | | | | * | * |
| බැටරි ගබඩා | | | | * | * | * | * | * | * |
| | | | | | | | | | |
| **ද්‍රවීකෘත ස්වභාවික වායු** | | | **2,502** | **2,757** | **3,479** | **3,748** | **3,830** | **2,838** | **3,632** |
| නව ඒකාබද්ධ චක්‍රීය | | | 1,574 | 2,460 | 2,807 | 2,516 | 2,497 | 2,158 | 2,600 |
| කැළණිතිස්ස නව GTs | | | 0 | 0 | 3 | 0 | 0 | 0 | 0 |
| පරිවර්තනය කරන ලද West Coast | | | 288 | 69 | 138 | 263 | 365 | 236 | 296 |
| පරිවර්තනය කරන ලද කැළණිතිස්ස ඒකාබද්ධ චක්‍රීය | | | 278 | 167 | 205 | 450 | 350 | 185 | 366 |
| පරිවර්තනය කරන ලද Sojitz කැළණිතිස්ස | | | 362 | 60 | 209 | 362 | 341 | 178 | 257 |
| ස්ථාවර ඉහළ විදුලි බලය | | | | | 118 | 157 | 276 | 82 | 113 |
| | | | | | | | | | |
| **පවිත්‍ර නොවන බලශක්තිය** | | | | | | | | | |
| | | | | | | | | | |
| **ගල් අඟුරු** | **5,439** | **5,534** | **5,568** | **5,175** | **5,170** | **5,235** | **5,300** | **5,474** | **4,668** |
| නොරොච්චෝලේ | 5,439 | 5,534 | 5,568 | 5,175 | 5,170 | 5,235 | 5,300 | 5,474 | 4,668 |
| **ඩීසල්/ නැප්තා** | **1,117** | **1,103** | **8** | **3** | **0** | **0** | **0** | **0** | **0** |
| කැළණිතිස්ස GTs | 2 | 3 | | | | | | | |
| කැළණිතිස්ස GT 7 | 61 | 5 | 8 | 3 | | | | | |
| කැලණිතිස්ස ඒකාබද්ධ චක්‍රීය | 521 | 315 | | | | | | | |
| සොජිත්ස් කැලණිතිස්ස | 504 | 626 | | | | | | | |
| පරිපූරක | 29 | 2 | | | | | | | |
| නව ඒකාබද්ධ චක්‍රීය (විවෘත චක්‍ර මෙහෙයුම්) | | 151 | | | | | | | |
| **දැවි තෙල්** | **2,068** | **1,869** | **875** | **600** | **39** | **60** | **55** | **50** | **71** |
| සපුගස්කන්ද A | 333 | 316 | 205 | 190 | | | | | |
| සපුගස්කන්ද B | 454 | 415 | 351 | 341 | | | | | |
| බත්තල විදුලි බලාගාරය | 407 | 357 | 255 | | | | | | |
| උතුරුජනනී | 123 | 120 | 64 | 69 | 39 | 60 | 55 | 50 | 71 |
| West Coast | 752 | 662 | | | | | | | |
| | | | | | | | | | |
| **මුළු විදුලි ඉල්ලුම (ගි.වො.පැ.)** | **18,218** | **19,252** | **20,346** | **21,556** | **22,822** | **24,160** | **25,404** | **26,780** | **28,195** |

### 6.2 සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් සංවර්ධනය

දැනට පවතින සම්ප්‍රේෂණ පද්ධතියේ විශ්වසනීයත්වය තහවුරු කර ගනිමින් වඩාත් වැඩි වශයෙන් පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් ජනනය කරනු ලබන බලශක්තිය පද්ධතියට අවශෝෂණය කර ගැනීම සඳහා සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් පද්ධතිය ශක්තිමත් කිරීමට හා පුළුල් කිරීමට සැලසුම් කෙරෙයි.

- 2021 වර්ෂය අවසාන වීමට ප්‍රථම ආසියානු සංවර්ධන බැංකුව සමඟ ඩොලර් මිලියන 250ක ණය ගිවිසුමකට එළඹීමට බලාපොරොත්තු වන අතර එමඟින් පහත සඳහන් සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් සංවර්ධන කටයුතු වර්ෂ 2022දී ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

| | ව්‍යාපෘතියේ නම | සම්පූර්ණ ඇස්තමේන්තුගත මුදල (රු.මිලි.) |
|---|---|---|
| 1 | විදුලි පද්ධතියේ විශ්වසනීයත්වය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (PSRSP) | |
| 1.1 | කලවාන සහ මීගමුව කිලෝ වෝල්ට් 132 ග්‍රිඩ් උපපොළවල් ඉදිකිරීම.<br>මීරිගම කිලෝ වෝල්ට් 220 ග්‍රිඩ් උපපොළක් සහිත ස්විච්චපන්න මධ්‍යස්ථානයක් ඉදි කිරීම, කිලෝ වෝල්ට් 132 මාතර ග්‍රිඩ් උපපොළ ආවර්ධනය කිරීම | 7,982 |
| 1.2 | මාතර-හම්බන්තොට කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම, හම්බන්තොට-තිස්සමහාරාම කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ මාර්ගය, කිලෝ වෝල්ට් 132 රැහැන් මාර්ගය හෝමාගම ග්‍රිඩ් උපපොළේ සිට හොරණ-පාදුක්ක 132 මාර්ගය දක්වා, කිලෝ වෝල්ට් 132 රැහැන් මාර්ගය බද්දේගම ග්‍රිඩ් උපපොළේ සිට ගාල්ල-අම්බලන්ගොඩ 132 මාර්ගය දක්වා කිලෝ වෝල්ට් 132 භූගත රැහැන් මාර්ගය කැලණිය කේබල් ගැන්ට්‍රියේ සිට පැලියගොඩ ග්‍රිඩ් උපපොළ දක්වා | 5,015 |
| 1.3 | තිස්සමහාරාම, බද්දේගම, හෝමාගම සහ පැලියගොඩ කිලෝ වෝල්ට් 132 ග්‍රිඩ් උපපොළවල් ඉදිකිරීම. | 6,572 |
| 1.4 | නව අනුරාධපුර-නව හබරණ කිලෝ වෝල්ට් 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම, කුකුලේ-කලවාන කිලෝ වෝල්ට් 132 සහ හබරණ-වේයන්ගොඩ කිලෝ වෝල්ට් 220 සම්ප්‍රේෂණ මාර්ගයට මීරිගම ජාල උපපොළේ සිට කිලෝ වෝල්ට් 132ක රැහැන් කොටසක් ඉදි කිරීම. | 2,991 |
| 2 | බෙදාහැරීම් පද්ධතියේ විශ්වසනීයත්වය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය (ලංකා විදුලි පුද්ගලික සමාගම) | 10,000 |

- ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ හඳුනාගත් පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා තාක්ෂණික සහාය යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 4.23ක ආධාරයක් ඔවුන්ගේ ප්‍රදාන මූල්‍යකරණය මඟින් ලබා දෙනු ඇත. එමඟින් 2022 වර්ෂයේ දිගුකාලීන ජනන හා සම්ප්‍රේෂණ සැලසුම් අධ්‍යයනයන් සිදු කිරීමට නියමිතව ඇත.
- 2022 වර්ෂයේ දී පහත සඳහන් ප්‍රමුඛතා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය මේ වන විට මූල්‍යාධාර ලබා ගැනීමේ කටයුතුවල නිරතව සිටියි.

| | ව්‍යාපෘතියේ නම | සම්පූර්ණ ඇස්තමේන්තුගත පිරිවැය (USDM) |
|---|---|---|
| 1 | කිලෝ වෝල්ට් 132/33, බියගම කලාපයේ ග්‍රිඩ් උපපොල ඉදි කිරීම. | 16.36 |
| 2 | කිලෝ වෝල්ට් 220/33 ඒකල ග්‍රිඩ් උපපොල ඉදි කිරීම. | 20.01 |
| 3 | කොළඹ G (කිරුළපන) කිලෝ වෝල්ට් 220/132 ග්‍රිඩ් උපපොල සහ කොළඹ K (වැල්ලවත්ත) කිලෝ වෝල්ට් 132/11 ග්‍රිඩ් උපපොල ඉදි කිරීම. | 107.66 |
| 4 | කිලෝ වෝල්ට් 132/11, උප P (නාරාහේන්පිට) ග්‍රිඩ් උපපොල ඉදි කිරීම. | 28.61 |
| 5 | කිලෝ වෝල්ට් 132/11, උප Q (ටවුන්හෝල්) ග්‍රිඩ් උපපොල ඉදි කිරීම. | 12.60 |
| 6 | කිලෝ වෝල්ට් 132/11, මහනුවර නගරයේ ග්‍රිඩ් උපපොල ඉදි කිරීම. | 27.06 |
| 7 | කිලෝ වෝල්ට් 220/33, කොටදෙණියාව ග්‍රිඩ් උපපොල ඉදි කිරීම. | 17.23 |
| 8 | කිලෝ වෝල්ට් 132/33, වාරියපොල කොටුමා උපපොල හා කිලෝ වෝල්ට් 220/132 වාරියපොල දකුණ සම්බන්ධන ස්ථානය ඉදි කිරීම. | 39.38 |
| 9 | කිලෝ වෝල්ට් 220 වවුනියාව කොටුමා උපපොල සංවර්ධනය. | 18.18 |
| 10 | නව හබරණ - කප්පල්තුරෙයි කිලෝ වෝල්ට් 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම. | 28.87 |
| 11 | සමනල වැව – ඇඹිලිපිටිය කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම. | 9.33 |
| 12 | කිලෝ වෝල්ට් 132/33, වැලිමඩ ග්‍රිඩ් උපපොල ඉදි කිරීම. | 26.09 |
| 13 | කිලෝ වෝල්ට් 132/33, කිරියන්කල්ලිය ග්‍රිඩ් උපපොල ඉදි කිරීම. | 29.93 |
| 14 | කෙරවලපිටිය – වරාය කිලෝ වෝල්ට් 220 දෙවන භූගත සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම. | 46.90 |

## 7 2021 වර්ෂයේ දී මුහුණ දුන් අභියෝග සහ එවැනි අභියෝග ජය ගැනීම සඳහා උපාය මාර්ග.

| | අභියෝගය | ජය ගැනීමට භාවිතා කරන උපාය මාර්ග |
|---|---|---|
| 1 | සංවර්ධන ව්‍යාපෘති සඳහා එල්ල වූ COVID 19 වසංගත තත්ත්වයේ බලපෑම. | සේවකයින් සඳහා එන්නත් ලබා දීම.<br>දිගු සේවා මුර හඳුන්වා දීම.<br>ප්‍රමුඛ අත්‍යාවශ්‍ය ව්‍යාපෘති සමීපව නිරීක්ෂණය කිරීම.<br>ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් සමඟ නිතර සාකච්ඡා කර ගැටලු හඳුනාගෙන අදාළ පාර්ශව සමඟ සහයෝගයෙන් ඒවා විසඳා ගැනීම. |
| 2 | **ජනන හා සම්ප්‍රේෂණ ව්‍යාපෘතිවල ඉඩම් සම්බන්ධ ගැටළු** | |
| | ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදයන්. | ඉඩම් අමාත්‍යාංශයේ සහයෝගය ලබා ගැනීම සඳහා මෙම අමාත්‍යාංශය යටතේ ඉඩම් කාර්ය සාධන බලකායක් පත් කිරීම. |
| | වන්දි ගෙවීම ප්‍රමාණවත් නොවීම නිසා නැවත පදිංචි කිරීම දුෂ්කර වීම. | වන්දි ගෙවීම වඩාත් ආකර්ෂණීය වන පරිදි LARC හා Super LARC යටතේ වන්දි ගෙවීමට අවශ්‍ය ව්‍යාපෘති ගැසට් කිරීමට යෝජනා කර ඇත. |
| | විදුලි ජනන ව්‍යාපෘති සඳහා හඳුනා ගෙන ඇති මහවැලි ඉඩම් / ජල මූලාශ්‍ර සඳහා රාජ්‍ය භාගයක් අය කිරීම. | වාර්මාර්ග අමාත්‍යාංශය සමග සාකච්ජා කර සුහද විසඳුම් ලබා ගැනීම. |
| 3 | ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍යමය බාධාවන් හා විදුලි ජනන හා සම්ප්‍රේෂණ ව්‍යාපෘති සඳහා සැලකිය යුතු ආයෝජනයන් අවශ්‍ය වීම. | ණය ලබා ගැනීම වෙනුවට, හැකි සෑම විටම ආයෝජන ප්‍රවර්ධනය කිරීම (ජනන ව්‍යාපෘති සඳහා අයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සහ ආයෝජකයින් ආකර්ෂණය කර ගත නොහැකි සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් මාර්ග ඉදි කිරීම සඳහා ද්විපාර්ශ්වික හා බහු පාර්ශ්වික අරමුදල් සොයා ගැනීම. |
| 4 | කාර්මික නිෂ්පාදන ක්‍රියාවලියේ ජාත්‍යන්තර තරගකාරීත්වය පවත්වා ගැනීම සඳහා බලශක්ති පිරිවැය අවම කිරීම. | පුනර්ජනනීය බලශක්ති දායකත්වය වැඩි කිරීම, ද්‍රවීකෘත ස්වභාවික වායු හඳුන්වා දීම හා බලශක්ති සංයුතිය විවිධාංගීකරණය කිරීම. |
| 5 | **පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන ගැටළු** | |
| | සංකීර්ණ අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා බොහෝ ආයතනවල අනුමැතිය අවශ්‍ය වීම. (මධ්‍යම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය, NBRO, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ඉඩම් කොමසාරිස්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව) | සෑම ආයතනයකටම ප්‍රතිචාර දැක්වීම සඳහා සීමිත කාලයක් ලබා දීම.<br>මහා පරිමාණයේ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා (ප්‍රධාන වශයෙන් පුනර්ජනනීය බලශක්ති උද්‍යාන හා පාවෙන සූර්ය බලාගාර ව්‍යාපෘති සඳහා) රාජ්‍ය අමාත්‍යාංශය මගින් අවශ්‍ය සියළු අනුමැතීන් සහිතව ව්‍යාපෘති භූමිය නිදහස් කර ගැනීම හා ලංසුකරුවන්ට පැමිණීම සඳහා ඉඩම් / ජල මූලාශ්‍ර සකස් කර දීම (එම අනුමැතීන් ලබා ගැනීම සඳහා දරන ලද වියදම කුමක් වුවද, එම වියදම තෝරා ගනු ලබන සංවර්ධකයා විසින් දැරිය යුතු බවට වන කොන්දේසියක් ලංසු ලේඛනයට අන්තර්ගත කිරීම) |
| | පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති මන්දගාමී වීම. | ලංකා විදුලිබල මණ්ඩලය මගින් ජාල උපයෝගීතාව නිතිපතා ප්‍රසිද්ධ කිරීම.<br>ලංකා විදුලිබල මණ්ඩලය මගින් නිතිපතා පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ටෙන්ඩර් ක්‍රියාත්මක කිරීම සහ ඊළඟ ටෙන්ඩරය නිකුත් වන තුරු සුදුසු අවස්ථාවලදී පෝෂක ගාස්තු (feed in tariff) හඳුන්වා දීම. |
| | සූර්ය බල විදුලි ජනනයේ අතරමැදි ස්වභාවය අවම කිරීම. | බැටරි හඳුන්වා දීම - ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය හා සී/ස ලංකා විදුලි පුද්. සමාගම මගින් දැරිය හැකි මිලකට බැටරි නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් නියමු ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.<br>සූර්ය බලශක්ති ව්‍යාපෘතිවල බැටරි භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ ගාස්තු ක්‍රමයක් හඳුන්වා දීම. |

ලංකා විදුලිබල මණ්ඩලය

## හැඳින්වීම

ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) යනු 1969 අංක 31, 1979 අංක 29 හා 1988 අංක 32 දරන පනත් මගින් සංශෝධිත 1969 නොවැම්බර් මස පළමුවැනි දිනැති 1969 අංක 17 දරන පනත මගින් ස්ථාපිත රජය සතු ව්‍යාපාරයකි. 2013 අංක 31 දරන පනත මගින් සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් ලං.වි.ම. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියාමන විෂය පථය යටතට ගෙන එන ලදී. විදුලි බලය ජනනය, සම්ප්‍රේෂණය හා සියලු පාරිභෝගික කාණ්ඩයන් වෙත බෙදාහැරීම, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත පිරිවැය පිළිබිඹු කරන්නාවූ අවසන් පාරිභෝගික අයක්‍රමය ප්‍රකාර ආදායම් රැස් කිරීම හා මණ්ඩලයේ සමස්ත ආදායම එහි සියලු කාර්යයන් සඳහා ප්‍රමාණවත් වන බවට සහතික කරනු පිණිස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත් ප්‍රකාර හා එහි පනත යටතේ පනවා ඇති පරිදි ඉටු කිරීමේ බලය ලං.වි.ම. වෙ.ත ලබාදී ඇත.

## දැක්ම

විදුලි බලයෙන් සසිරිමත් දිවියක්

## මෙහෙවර

අපගේ සාරධර්මවලට අනුගත වෙමින් සමස්ත ශ්‍රී ලංකාවටම කාර්යක්ෂම, සමායෝජිත හා සකසුරුවම් විදුලිය සැපයුමක් සංවර්ධනය කරමින් පවත්වාගෙන යාම; ගුණාත්මකභාවය, ජාතිය වෙත සේවය සැලසීම, කාර්යක්ෂමතාවය හා ඵලදායකත්වය, කැපවීම, ආරක්ෂාව, වෘත්තීයවේදීත්වය හා තිරසරබව.

## අරමුණු

එක්සත් ජාතීන් විසින් නිකුත් කරන ලද තිරසර සංවර්ධන අරමුණු කෙරෙහි නිසි සැලකිල්ල යොමු කරමින් ආයතනික සැලැස්ම 2019-2023 සඳහා ලං.වි.ම. විසින් අරමුණු අටක් හඳුනාගනු ලබයි. ආයතනයේ දිගු කාලීන දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කරගනු පිණිස සකස් කරන ලද අරමුණු අට පහත පරිදි වේ.

- ලං.වි.ම. මූල්‍යමය වශයෙන් වඩාත් ශක්තිමත් කිරීම
- අඩු පිරිවැය බලශක්ති ජනනය ප්‍රවර්ධනය
- දැරිය හැකි මිලකට සමස්ත රටටම විදුලිය ලබාදීම
- පාරිභෝගිකයන් වෙත ඉහළ ගුණාත්මකභාවයෙන් යුත් විදුලි සැපයුමක් හා සේවාවන් ලබාදීම
- බාහිර පරදුකරුවන් සමගින් වඩා ශක්තිමත් සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම
- නවීන තාක්ෂණය සමගින් මෙහෙයුම් විශිෂ්ටත්වය
- හරිත බලශක්තිය ඒකාබද්ධ කිරීමේ කාර්යය ප්‍රශස්තකරණය

## පාරිසරික තිරසරබව

මතු පරම්පරාවන් වෙත අපගේ පරිසරය ආරක්ෂා කරන අතර ශ්‍රී ලංකාව තුළ නවෝත්පාදනීය ව්‍යාපාරයක් බවට පත්වීම සඳහා අපි කැපවී සිටින්නෙමු. ලං.වි.ම. මෙහෙයුම් කටයුතුවලදී ජනතා විශ්වාසය ගොඩනගා ගන්නා අතරම අදාළ පාරිසරික නීති හා නියාමන ප්‍රමිතීන් සමගින් මුළුමනින්ම අනුගතව කටයුතු කරන බවට වගබලා ගනු පිණිස ලං.වි.ම. පුරා මනා පාරිසරික කළමනාකරණ පිළිවෙත් ක්‍රියාත්මක කරනු ලබයි. දිගු කාලීනව සමාජය වෙත ප්‍රශස්ත ප්‍රතිලාභ සැලසෙන බවට සහතික කරනු පිණිස අගේ සංවර්ධන ව්‍යාපෘතීන්හි සියලු අදියරයන් තුළ සමාජය හා සෙසු පරදුකරුවන්ද ඇතුළත් සහභාගිත්ව ප්‍රවිශයක් මගින් අපි අපගේ ව්‍යාපාර කටයුතු සිදු කරමු.

### 1. විදුලි සැපයුම් සමාලෝචනය

පසුගිය වසර පහළව ඇතුළත රටේ විදුලිය ඉල්ලුම වාර්ෂිකව 5.5%ක පමණ සාමාන්‍ය අනුපාතයකින් වර්ධනය වී ඇති අතර, කාර්ය බහුල වේලාවන් තුළ ඉල්ලුම වාර්ෂිකව 3.7%ක අනුපාතයකින් වර්ධනය වී ඇත. කෙසේ වුවද, 2020 වසරේ ශුද්ධ ජනනය ගි.වො.පැ. 15,714 ලෙස වාර්තා වූ අතර, කොවිඩ්-19 වසංගත තත්ත්වයෙහි බලපෑම සමගින් 2019 වසර හා සාපේක්ෂව 1.3%කින් පහත වැටිණි.

ලං.වි.ම. මෙන්ම ස්වාධීන විදුලිය නිෂ්පාදනායතනයන්ගේද (IPP) තාප විදුලි බලාගාරයන් වෙතින් ජනනය කෙරෙන විදුලිය ප්‍රමාණයන්ද සමගින් විදුලිය ජනනය සම්බන්ධ ලං.වි.ම. වාර්ෂික පිරිවැය සැලකිය යුතු ලෙස වෙනස් වේ. ගල් අඟුරු හා ද්‍රව ඉන්ධන ලෙස එන ඉන්ධන සැපයුම් ආරක්ෂා කරගැනීම තුළ තාප විදුලි බලාගාරයන්හි ක්‍රියාකාරිත්වයට සෘජු බලපෑමක් එල්ල කරන අතර ලං.වි.ම. මූල්‍ය තත්ත්වයන් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන්ද ඉතා වැදගත් වේ.

ආර්ථික කටයුතු ව්‍යාප්ත වීම හේතුවෙන් සිදුවන ඉල්ලුමේ වර්ධනය සපුරාලනු පිණිස ලං.වි.ම. සතුව පවත්නා විදුලිය ජාලය පුළුල් කිරිම සඳහා මෙන්ම නව පාරිභෝගිකයන් හේතුකොට ඇතිවන ඉල්ලුම සපුරාලනු පිණිසද ලං.වි.ම. දැනට පවත්නා විදුලිය ජාලය පුළුල් කිරීමේ අරමුණින් එහි සමස්ප්‍රේෂණ හා බෙදා හැරීමේ ජාලය සංවර්ධනය කිරීම සඳහා ලං.වි.ම.ට සැලකිය යුතු ආයෝජනයක් අවශ්‍ය වේ. ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කරනු පිණිස හා ග්‍රාමීය ප්‍රදේශයන්හි ආර්ථික සංවර්ධනය සඳහාද ග්‍රාමීය විදුලියන යෝජනාක්‍රම හා සියල්ලන් සඳහා විදුලිය වැඩසටහන් හඳුන්වා දී ඇත. එවන් ව්‍යාපෘති ආර්ථිකමය වශයෙන් ක්‍රියාත්මක කළ නොහැකි වන අවස්ථාවන්හි ආයෝජන හෝ මෙහෙයුම් සහාය ලබා දීම මගින් ශ්‍රී ලංකා රජය විසින් ලං.වි.ම. වෙත වන්දි ලබාදිය යුතුවේ.

සමස්ත ශ්‍රී ලංකාවම විදුලියනය කිරීම සඳහා වූ ලං.වි.ම. එළැඹුම සැලසුම්ගත පරිදි අවසන් වීමත් සමගින්, පාරිභෝගික භවතුන්ගේ සිත් සතන් දිනාගනු පිණිස ලබාදෙනු ලබන සේවාවන්හි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම කරා ලං.වි.ම. විසින් අවධානය යොමු කරවන ලදී. ලං.වි.ම. වඩාත් පාරිභෝගික හිතවාදී ආයතනයක් බවට පත්වීම කරා සිදුවන පරිවර්තනය වඩාත් දිරිමත් කරනු පිණිස, නව්‍ය පාරිභෝගික සේවා මූලාරම්භයන් ගණනාවක්ද හඳුනාගෙන ඇත. තොරතුරු තාක්ෂණ දැනුම සහිත කාර්ය බහුල නවීන යුගයේ පාරිභෝගිකයන් ඉලක්ක කරගනිමින් මෙම ලැයිස්තුව තුළ බොහෝ ජංගම හා අන්තර්ජාල පදනම්ගත සේවාවන් ඇතුළත් විය. පාරිභෝගික සේවය සම්බන්ධයෙන් ලං.වි.ම. ප්‍රධාන පාරිභෝගික අන්තර් මුහුණත පුහුණු කරවීමේ ප්‍රධාන පුහුණු එළැඹුමක්ද ලං.වි.ම. විසින් දියත් කරන ලදී.

### 1.1 නව පාරිභෝගික සත්කාරක මූලාරම්භයන්

<u>සේවා ඉල්ලුම් හා පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම:</u>

- ලං.වි.ම. කාර්යාල වෙත පැමිණීමකින් තොරව මාර්ගගතව සිය සේවා අවශ්‍යතාවයන් සපුරා ගැනීමට පාරිභෝගිකයන් හට හැකියාව ලබාදෙනු පිණිස සියලු අංගයන්ගෙන් පූර්ණ වශයෙන් සමන්විත *CEBCare* වෙබ් ද්වාරයක් අලුතින් හඳුන්වා දෙන ලදී. මෙම නව වෙබ් ද්වාරය හරහා පාරිභෝගිකයන් විසින් නව සම්බන්ධතා අයැදුම් කිරීම, සේවා වෙනස් කිරීම් ඉල්ලීම, බිල්පත් විස්තර පරීක්ෂා කිරීම, මාර්ගගතව ගාස්තු ගෙවීම, විදුලිය බිඳ වැටීම් සම්බන්ධ පැමිණිලි ඉදිරිපත් කිරීම හා විදුලිය බිඳ වැටීමේ සැලසුම් පරීක්ෂා කිරීමද සිදුකරනු ඇත.
- විවිධ බෙදාහැරීමේ ශාඛාවන් අදාළ වන පරිදි නඩත්තු හා විදුලිය අත් හිටුවීමේ සැලසුම්කරණ මෙහෙයුම් අංකිතකරණය කරනු පිණිස *CEBAssist* විදුලිය බිඳ වැටීමේ සැලසුම්කරණ ක්‍රමයද හඳුනවාදෙන ලදී. මෙමගින් ලං.වි.ම.ට විදුලිය බිඳ වැටීමේ වාර ගණන හා කාලය ප්‍රශස්තකරණය කොට කෙටි පණිවිඩ හා සෙසු *CEBCare* ස්පර්ශ ලක්ෂ්‍ය හරහා කල්තබා බලපෑමට ලක්වන පාරිභෝගිකයන් වෙත දැනුම් දීමටද හැකියාව ලබාදෙනු ලබයි.
- ප්‍රශස්ත සම්පත් උපයෝජනයක් හා සේවා ගුණාත්මකභාවයේ වර්ධනයක් අත්පත් කරගනු පිණිස පළාත් ඇමතුම් මධ්‍යස්ථාන 13ම එක් සැබෑ ඇමතුම් මධ්‍යස්ථානයක් තුළට ඒකාබද්ධ කිරීමේ අදහසින් ඒකාකෘත ඇමතුම් මධ්‍යස්ථාන විසඳුම (*Unified Call Center Solution*) හඳුන්වා දෙන ලදී. සේවා ස්ථානගත නියෝජිතවරයා විසින් පිළිතුරු ලබාදීමේ විකල්පයට අතිරේකව ස්වයංක්‍රීයගත හඬ ප්‍රතිචාර (AVR), අන්තර් ක්‍රියාකාරී හඬ ප්‍රතිචාර (IVR) හා ස්වයංක්‍රීය පැමිණිලි ඇතුළත් කිරීමේ පහසුකම්ද සම්පාදනය කරනු පිණිස ඒකාකෘත ඇමතුම් මධ්‍යස්ථාන විසඳුම CEBAssist විසඳුමද සමගින් දෝෂ රහිතව ඒකාබද්ධ කරන ලදී. තත්පර 16ක සාමාන්‍ය රැඳී සිටීමේ කාලයක්ද, තත්පර 45ක කාර්ය බහුල වේලා රැඳී සිටීමේ කාලයක්ද සමගින් දිනකදී 25,000ක සාමාන්‍ය අගයක ඇමතුම් සංඛ්‍යාවක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට මෙම ඒකාකෘත විසඳුම මගින් ලං.වි.ම. වෙත හැකියාව ලබාදෙනු ලබයි.
- විදුලි සංදේශ සේවා සම්පාදක විදුලිබල නිරීක්ෂණ පද්ධති CEBAssist විසඳුම සමගින් ඒකාබද්ධ කරනු පිණිස CEBAssist ආයතනික විදුලි බිඳ වැටුම් ද්වාරය හඳුන්වා දෙන ලදී. විදුලිය බිඳ වැටීමේ පැමිණිලි ඉදිරිපත් කිරීම හා සැලසුම්ගත විදුලිය අත් හිටුවීමේ සැලැස්ම ලබාගැනීම සඳහා යෙදවුම් වැඩසටහන්කරණ අතුරු මුහුණත (API) හරහා CEBAssist විසඳුම සමගින් ගනුදෙනු කිරීමට මෙම ද්වාරය මගින් ආයතනික ගනුදෙනුකරුවන් හට හැකියාව ලබාදෙනු ලබයි.

<u>මනුකරණය හා බිල්පත්කරණය:</u>

- ක්ෂේත්‍රයේ සිට මාර්ගගතව මනු කියවීම් රැස් කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා මනු කියවන්නන් වෙනුවෙන් *MeterAssist* ජංගම යෙදවුම හඳුන්වා දෙන ලදී. මධ්‍යගත බිල්පත්කරණ පද්ධතිය වෙත කියවීම් යාවත්කාලීන කිරීමේදී යෙදවුම හා ප්‍රතිඵලය අතර කාල සීමාව අවම කිරීම හා පාරිභෝගිකයන් වෙත නිවැරදි බිල්පත්කරණ තොරතුරු ලබාදීම මෙහිදී ඉලක්ක කරගන්නා ලදී.

- ගේවිටු වසා ඇති හා තක්සේරුගත මනු කියවීමේ අවස්ථාවන්හිදී කෙටි පණිවිඩ හා යෙදවුම හරහා ගනුදෙනුකරුවන් වෙත දැනුම් දීම් සිදුකිරීමේ හැකියාව *CEBAssist* මාර්ගගත මනු කියවීමේ පද්ධතිය විසින් ලං.වි.ම. වෙත ලබාදෙන ලදී. නවතම මනු කියවීම් තත්ත්වයන් හා බිල්පත් අගයන් සම්බන්ධයෙන් ගනුදෙනුකරුවන් දැනුවත්ව තැබීමේ පහසුකමද එමගින් ලබාදෙනු ලබයි.
- ප්‍රාදේශීය කාර්යාලයේ හා පළාත් කාර්යාලයන්හි මිනිස් ශ්‍රමයෙන් සිදු කෙරෙන බිල්පත්කරණ ක්‍රියාවලිය පූර්ණ අංකිතකරණයකට ලක් කිරීම සඳහා *CEBAssist* මාර්ගගත බිල්පත්කරණ ක්‍රමය හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රමය මගින් ඉතා අඩු කාලයකින් පාරිභෝගික බිල්පත්කරණ පැමිණිලි විසඳා අදාළ ගිණුම් පියවීම් සිදු කිරීමට හා තත් කාලීන ගිණුම් යාවත්කාලීනයන් සිදු කිරීමටද ලං.වි.ම. වෙත හැකියාව ලබාදෙනු ලබයි.
- ආදායම් කළමනාකරණය හා විසන්ධි / ප්‍රති-සන්ධිගත මෙහෙයුම් සඳහා සහාය ලබාදෙනු පිණිස *CEBAssist - DisconnectionAssist* ක්‍රමය හඳුන්වා දෙන ලදී. තත් කාලීන ගෙවුම් තොරතුරුද සමගින් නිවැරදි ගෙවුම් පැහැර හැරීම් පිළිබඳ විග්‍රහයන්ද, අවුල් විරහිත විසන්ධි / ප්‍රති-සන්ධිගත මෙහෙයුම් සිදු කිරීමට මෙම ක්‍රමය මගින් පහසුකම් සලසනු ලබයි.
- අංකිතව පාරිභෝගික විදුලි මනු කියවා විද්‍යුත් තැපැල් මගින් විද්‍යුත් බිල්පත එවීම හා කෙටි පණිවිඩ එවීම සඳහා බස්නාහිර පළාතේ *CEBAssist* සුහුරු මනු කියවීම් ක්‍රමය හඳුන්වාදෙන ලදී.
- බැංකු වෙත පාරිභෝගිකයන්ගේ නවතම ගිණුම් ශේෂ පිළිබඳ දැනුම් දෙනු පිණිස ස්වයංක්‍රීය බිල්පත් පියවීමේ පහසුකම හඳුන්වාදෙන ලදී. එයට ප්‍රතිචාරීව, ස්ථාවර නියෝග වැඩ පිළිවෙලයන් හරහා බැංකු මගින් පාරිභෝගිකයන්ගේ බිල්පත් ගෙවීමට අවශ්‍ය පහසුකම් සලසනු ලබයි.

**ගාස්තු ගෙවීම් සිදු කිරීම:**

- නිදහස් ප්‍රවේශ ක්ෂණික ගෙවීම් විකල්පයන්ද සහිතව බහුවිධ ගෙවීම් ද්වාරයන් හඳුන්වා දෙමින් මාර්ගගත ගෙවීමේ ක්‍රමය ප්‍රතිසංස්කරණය කරන ලදී. මෙයට අමතරව, *CEBCare* ජංගම යෙදවුමට මාර්ගගත ගාස්තු ගෙවීමේ පහසුකම ව්‍යාප්ත කරන ලදී.
- තුන්වන පාර්ශ්වයේ ගාස්තු රැස් කිරීමේ පද්ධතියට වඩා වැඩි බැංකු හා සුපිරි වෙළඳසැල් ජාලයන් එක් කරන ලදී. තවද, තුන්වන පාර්ශ්වයේ ගාස්තු රැස් කිරීම සඳහා මාර්ගගත තත් කාලීන ගිණුම් යාවත්කාලීනකරණයට අවකාශ සලසනු පිණිස තුන්වන පාර්ශ්වයේ ගාස්තු ඒකරාශිකරණ පද්ධතියද ප්‍රතිසංස්කරණය කරන ලදී.
- ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ප්‍රධාන ජංගම ගාස්තු ගෙවීමේ වේදිකාවන් භාවිතයෙන් දැන් පාරිභෝගිකයන් හට සිය විදුලි බිල්පත් ගෙවිය හැක. පාරිභෝගිකයාට පහසු පරිදි *CEBCare* යෙදවුම හරහාද ගෙවීම් සිදුකළ හැක. මේවන විට සියලුම ප්‍රධාන ජංගම ගාස්තු ගෙවීමේ වේදිකාවන් තුළ පාරිභෝගික සත්‍යාපනයන් හා ලං.වි.ම. පාරිභෝගික බිල්පත් පියවීම් ඒකාබද්ධ කොට ඇත. මෙමගින් ලං.වි.ම. කාර්යාල වෙත යාමකින් තොරව සිය ගාස්තු පියවීමට පාරිභෝගිකයන් හට වඩාත් විශාල අංකිත ස්පර්ශක ලක්ෂ්‍යයන් සම්පාදනය කරනු ලබයි.
- තත් කාලීනව ඕනෑම මහජන බැංකු ශාඛාවක් වෙතින් ගෙවීම් වවුචර භාර ගැනීමට හා ප්‍රධාන පද්ධති යාවත්කාලීන කිරීමට ගාස්තු රැස් කිරීම් බෙදා හැරීමේ ක්‍රමය හා ගෙවීම් වවුචර ක්‍රමය ප්‍රතිසංස්කරණය කරන ලදී. මෙම ප්‍රතිසංස්කරණය කළ ක්‍රම මගින් කෙටි පණිවිඩ හරහා ගෙවීම් වවුචර ලබාගැනීමට හා ලං.වි.ම. කාර්යාල වෙත පිවිසීමකින් තොරව මහජන බැංකුවේ ඕනෑම ශාඛාවක් හරහා අදාළ ගෙවීම් වව්චර කටයුතු කිරීමට පාරිභෝගිකයන් හට හැකියාව ලබාදෙනු ලබයි.

## 1.2 විදුලි ඉල්ලුම

2021 පළමු මාස හය තුළ, විදුලි ඉල්ලුම 7.10%කින් වර්ධනය වූ අතර, මෙම කාල පරිච්ඡේදය තුළ වාර්තාගත උපරිම ඉල්ලුම පසුගිය වසරේ මෙගාවොට් 2,717.46 අගය හා සාපේක්ෂව මෙගාවොට් 2,801.62ක් විය. මෙම මාස 6ක කාල පරිච්ඡේදය තුළ, ගි.වො.පැය 8,120ක ප්‍රමාණයක් ජනනය කරන ලද අතර, ගි.වො. පැය 7,443ක ප්‍රමාණයක් අලෙවි කරන ලදී.

වසරේ පළමු අර්ධය තුළ ජනිත සමස්ත බලශක්තිය (ගි.වො.පැ. 8,120) ප්‍රමාණයෙන් 33%ක් (කුඩා ජලවිදුලිද ඇතුළත්) ජල විදුලි ජනනයෙන් ලැබී ඇත. ගල් අඟුරු ජනනය 38%ක අගයෙහි විය. තාප තෙල් දායකත්වය සමස්ත විදුලිබල ජනනයෙන් 22%ක් විය. (කුඩා ජලවිදුලි හැර) සෙසු පුනර්ජනනීය මූලාශ්‍ර දායකත්වය 7%ක් විය. මෙයට සාපේක්ෂව, 2020 ජූනි මාසය අවසානය වනවිට, ජලවිදුලි ජනන දායකත්වය 26%ක් විය.

### 1.3 2022 වසර සඳහා වූ ඉල්ලුම් පුරෝකථනය

2022 වසර සඳහා ලං.වි.ම. 2022-2046 දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම මත පදනම් වූ විදුලි ඉල්ලුම් පුරෝකථනය පහත පරිදි වේ:

| වසර | ඉල්ලුම | | ජනනය | | කාර්ය බහුල කාල සීමා |
|---|---|---|---|---|---|
| | (ගි.වො.පැ.) | වර්ධන අනුපාතය (%) | (ගි.වො.පැ.) | වර්ධන අනුපාතය (%) | (මෙ.වො.) |
| **2022** | 16,741 | 5.8% | 18,203 | 5.7% | 2,967 |

### 1.4 විදුලි ජනනය

ලංකා විදුලිබල මණ්ඩලයේ ජනන අංශය ලං.වි.ම. සතු තාප හා ජල විදුලි බලාගාර ක්‍රියාත්මක කිරීමේ හා නඩත්තු කිරීමේ වගකීම දරයි. මෙ.වො. 1,383ක සමස්ත ස්ථාපිත ධාරිතාවයක් සහිත විශාල ජල විදුලි බලාගාරය 17කින්ද, මෙ.වො. 900 එක් (01) ගල් අඟුරු බලයෙන් ක්‍රියාත්මක විදුලි බලාගාරයකින්ද, මෙ.වො. 604ක අගයකින් යුත් විශාල තෙල් බලයෙන් ක්‍රියාත්මක විදුලි බලාගාර හතකින් හා මෙ.වො. 1 තෙල් බලයෙන් ක්‍රියාත්මක විදුලි බලාගාර 50කින්ද යුත් මෙ.වො. 654ක ස්ථාපිත ධාරිතාවයකින් යුත් තාප බලාගාරයන්ගෙන්ද, මෙ.වො. 31.05 මන්නාරම සුළං ගොවිපලෙන්ද ජනන වත්කම් සමන්විත වේ.

ලං.වි.ම. විසින් යාපනය අර්ධද්වීපය වටා වූ දූපත්වල හුදෙකලා ජාලයන්හි විදුලි බලාගාර කිහිපයක්ද ක්‍රියාත්මක කරනු ලබයි. මෙලෙසින්, 2021 ජූනි මස 30වන දින වනවිට ලං.වි.ම. සතු විදුලි බලාගාරයන්හි සමස්ත ස්ථාපිත ධාරිතාවය මෙ.වො. 2,968ක් විය.

2021 ජූනි මස 30වන දින වනවිට ලං.වි.ම. හා පුද්ගලික විදුලි නිෂ්පාදකයන්ගේ ජනන විස්තර පහත දී ඇත.

2021 ජූනි මස 30වන දිනෙන් අවසන් මාස 06 සඳහා, සමස්ත ජනනය ගි.වො.පැ. 8,120ක අගයක වූ අතර ඉන් 26%ක් ප්‍රධාන ජල විදුලි ජනනයෙන් ලද අතර, ගල් අඟුරු විදුලි ජනනයෙහි දායකත්වය 38%ක් විය. තාප තෙල් සමස්ත බලශක්ති ජනනයෙන් 22%ක දායකත්වයක් ලබාදුන් අතර, සෙසු පුනර්ජනනීය මූලාශ්‍රයන්හි දායකත්වය 14%ක් විය. සන්සන්දනාත්මකව, 2020 වසරේ එම කාල පරිච්ඡේදය සඳහාම ප්‍රධාන ජලවිදුලි බලාගාරයන්හි දායකත්වය 21%ක් විය.

| විස්තරය | ජනනය (ගි.වො.පැ.) |
|---|---|
| ලං.වි.ම. ජල | 2,151 |
| තාප - ගල් අඟුරු | 3,091 |
| තාප - තෙල් | 700 |
| සුළං | 100 |
| ස්.වි.නි. ස.නො.පු.බ. (කුඩා ජලවිදුලි) | 576 |
| තාප | 1,056 |
| සුළං | 120 |
| සූර්ය (ජාල සම්බන්ධිත) | 68 |
| සූර්ය (වහළ මත) | 179 |
| ඩෙන්ඩ්‍රෝ, ජෛවස්කන්ධ හා නාගරික | 79 |
| එකතුව | **8,120** |

### 1.5 ජනන ධාරිතාව පුළුල් කිරීම

ලං.වි.ම.හි අනුමත දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම (2018-2037) තුළ සැලසුම් කළ පරිදි නව ජනන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යය ඉදිරියට ගමන් කරමින් පවතී.

ජනන ව්‍යාප්ති ව්‍යාපෘතීන්හි වර්තමාන තත්ත්වය පහත පරිදි වේ.

## 2. සංවර්ධන ව්‍යාපෘතීන්හි හා කාර්යයන්හි ප්‍රගතිය

### 2.1 ජල විදුලි සංවර්ධන ව්‍යාපෘති

#### උමා ඔය ජල විදුලි ව්‍යාපෘතිය


පුහුල්පොළ වේල්ලේ ගුවන් දර්ශනය

උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය හා සහයෝගීව වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කෙරෙමින් පවතී. විදුලි බලාගාරයේ ඇස්තමේන්තුගත ධාරිතාවය මෙ.වො. 120ක් (මෙ.වො.2x60) වන අතර, අපේක්ෂිත වාර්ෂික බලශක්ති නිෂ්පාදනය ගි.වො.පැ. 290ක් වේ.

- බලාගාර ධාරිතාවය : මෙ.වො.120
- සමස්ත ව්‍යාපෘති පිරිවැය : එ.ජ.ඩො. මිලියන 530
- අපේක්ෂිත වාර්ෂික බලශක්ති නිෂ්පාදනය : ගි.වො.පැ. 290
- කාර්ය අවසන් කිරීමට අපේක්ෂිත දිනය : 2021සැප්තැම්බර්
- වර්තමාන ප්‍රගතිය : සමස්ත භෞතික ප්‍රගතිය – 96.16%

#### බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය


බ්‍රෝඩ්ලන්ඩ්ස් විදුලි පොළ

බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය යනු දැනට පවත්නා පොල්පිටිය විදුලි බලාගාරයේ පහළ ධාරාගත ජල විදුලි විභවයෙන් ප්‍රයෝජන ගැනීමේ අරමුණින් කැළණි නදිය මත ගොඩනැගීමට සැලසුම් කර ඇති ගඟෙන් දුවන වර්ගයේ ව්‍යාපෘතියකි. ව්‍යාපෘතිය තුළ මෙ.වො. 35ක ස්ථාපිත ධාරිතාවයක් පවතිනු ඇති අතර, වාර්ෂිකව විදුලි බලශක්තිය ගි.වො.පැ. 126ක් ජනනය කිරීමට අපේක්ෂිතය.
බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය යනු ශ්‍රී ලංකාවේ පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය (CDM) ලද පළමු මහා පරිමාණ ජලවිදුලි බලාගාරය වේ.

- බලාගාර ධාරිතාවය : මෙ.වො.35
- සමස්ත ව්‍යාපෘති පිරිවැය : චීන කර්මාන්ත හා වාණිජ බැංකුව (ICBC) එ.ජ.ඩො. මිලියන 69.724 (85%)
  : ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව (HNB) එ.ජ.ඩො. මිලියන 12.304 (15%)
- අපේක්ෂිත වාර්ෂික බලශක්ති නිමැවුම : ගි.වො.පැ. 126
- සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය : 2021 සැප්තැම්බර්
- වර්තමාන ප්‍රගතිය : සමස්ත භෞතික ප්‍රගතිය – 90%
  සමස්ත මූල්‍ය ප්‍රගතිය – 71%

#### මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය

මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා වූ ණය අංක 3146 (SF)/ 3147 SRI – " හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ආයෝජන වැඩසටහන (අදියර 1)" යටතේ මෙම ව්‍යාපෘතිය වෙත එ.ජ.ඩො. මිලියන 125ක් ආසියානු සංවර්ධන බැංකුව මගින් සම්පාදනය කරන ලදී.

- බලාගාර ධාරිතාවය : මෙ.වො. 30.5
- සමස්ත ව්‍යාපෘති පිරිවැය : විදේශ අරමුදල් එ.ජ.ඩො. මිලියන 113.86 හා දේශීය අරමුදල් (ලං.වි.ම.) ශ්‍රී ලං.රු. මිලියන 3,958
- සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය : 2023 සැප්තැම්බර් 15
- වර්තමාන ප්‍රගතිය : සමස්ත ප්‍රගතිය – 16.5%

## 2.2 ලං.වි.ම. තාප විදුලිබල සංවර්ධන ව්‍යාපෘති

### ද්‍රව ස්වභාවික වායු ව්‍යාපෘතිය (LNGP)

කොළඹ පදනම්ගත විදුලි බලාගාරයන් වෙත ස්වභාවික වායු යොදවනු පිණිස රාජ්‍ය-පුද්ගලික අංශ හවුල්කාරිත්ව ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කොට ඇත.

සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය : 2024 පෙබරවාරි

වර්තමාන ප්‍රගතිය : 26%

### කැළණිතිස්ස මෙ.වො. 130 වායු ටර්බයින විදුලි බලාගාරය

මෙම කැළණිතිස්ස නව වායු ටර්බයින ව්‍යාපෘතියේ අරමුණ වනුයේ හදිසි අවස්ථාවන්හි කොළඹ නගරය වෙත සිදු කෙරෙන විදුලිය සැපයුම ප්‍රතිස්ථාපනය කිරීම හා කාර්ය බහුල අවස්ථාවන්හි විදුලිය සැපයීම පිණිස කැළණිතිස්සේ දැනට පවත්නා රාමුව V වායු ටර්බයිනය වෙනුවට නව වායු ටර්බයිනයක් යෙදවීමයි. කෙසේ වුවද, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ජනන අංශය යටතේ ප්‍රති-ව්‍යුහගත කර ඇත.

- බලාගාර ධාරිතාවය : මෙ.වො. 130 (ඒකක 3ක් හෝ 4ක්)
- සමස්ත ව්‍යාපෘති පිරිවැය : එ.ජ.ඩො. මිලියන 90
- සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය : 2023
- අරමුදල්කරණය : සැපයුම්කරුගේ ණය පහසුකම
- වර්තමාන ප්‍රගතිය : 2021 අප්‍රේල් මාසයේදී ටෙන්ඩර් කැඳවන ලද අතර, 2021 සැප්තැම්බර් මස වසා දමනු ඇත.

## 2.3 පුද්ගලික අංශය විසින් සිදුකරන තාප විදුලිබල සංවර්ධන ව්‍යාපෘති

### පරිපූරක විදුලි බලාගාර

වාලච්චේන මෙ.වො. 24 විදුලි බලාගාරය (V Power Holding සමාගම) 2021 ඔක්තෝබර් දක්වා මාස හයක කාලයක් සඳහා මෙහෙවරෙහි යොදවා ඇත.

### පළමු මෙ.වො. 300 ස්වභාවික වායු බල සංයුක්ත චක්‍රීය විදුලි බලාගාරය - කෙරවළපිටිය

- බලාගාර ධාරිතාවය : මෙ.වො. 300
- සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය : 2024 අප්‍රේල්
- වර්තමාන ප්‍රගතිය : 2021-07-19 දින විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කරන ලදී.

### දෙවන මෙ.වො. 300 ස්වභාවික වායු බල සංයුක්ත චක්‍රීය විදුලි බලාගාරය - කෙරවළපිටිය

- බලාගාර ධාරිතාවය : මෙ.වො. 300
- සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය : 2024 ඔක්තෝබර්
- වර්තමාන ප්‍රගතිය : 2021.06.21 දින යෝජනා ඉල්ලීම කැඳවන ලද අතර, 2021.09.13 දින වසා දැමීමට නියමිතය. ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු සිදු වෙමින් පවතී.

### තුන්වන මෙ.වො. 300 ස්වභාවික වායු බල සංයුක්ත චක්‍රීය විදුලි බලාගාරය - මුතුරාජවෙල

- බලාගාර ධාරිතාවය : මෙ.වො. 300
- සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය : 2026
- වර්තමාන ප්‍රගතිය : ඉඩම් සංවර්ධනය සඳහා වූ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව සම්පූර්ණ කොට ඇති අතර, වාර්තාව මහජන අදහස් සඳහා විවෘත කරන ලදී. එළැඹෙන වසර දෙක තුළ ඉඩම් සංවර්ධන කටයුතු සිදු කෙරෙනු ඇත. ලං.වි.ම. හා සී/ස. ජාතික තාප විදුලි සංස්ථාව අතර බද්ධ ව්‍යාපාර ගිවිසුම දැනටමත් අත්සන් කොට ඇත. බද්ධ ගිවිසුම් සමාගමේ සාංගමික ව්‍යවස්ථාවට අදාළ කටයුතු අවසන් කෙරෙමින් පවතී.

### 2.4 පුද්ගලික අංශය විසින් සිදුකරනු ලබන පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ව්‍යාපෘති

කුඩා ජලවිදුලි, සුළං, සූර්ය, ජෛවස්කන්ධ, ආදී වශයෙන් වූ නව සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) මූලාශ්‍රයන්ගෙන් ජනිත විදුලිය ප්‍රමිතිගත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් මගින් ජාලය තුළට අවශෝෂණය කරගැනේ. මෙම සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති විස්තර පහත දී ඇත:

**සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශයේ කාර්ය සාධනය (2021 ජුනි 30වන දින දක්වා)**

2021 ජුනි මස 30වන දිනට මෙහෙවරෙහි යොදා ඇති සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත දී ඇත:

| ව්‍යාපෘති වර්ගය | ව්‍යාපෘති සංඛ්‍යාව ව්‍යාපෘති | ධාරිතාවය (මෙ.වො.) |
|---|---|---|
| කුඩා ජල විදුලි | 212 | **414** |
| සුළං බලය | 17 | **148** |
| ජෛවස්කන්ධ - කෘෂි හා කාර්මික අපද්‍රව්‍ය විදුලිය | 04 | **13** |
| ජෛවස්කන්ධ – ඩෙන්ඩ්‍රෝ විදුලිය | 09 | **27** |
| නාගරික අපද්‍රව්‍ය විදුලිය | 01 | **10** |
| සූර්ය විදුලිය | 45 | **88** |
| එකතුව | **288** | **700** |

**සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශය සඳහා වූ වැඩසටහන**

2021 වසරේ අවසාන භාගයේ මෙහෙවරෙහි යෙදවීමට අපේක්ෂිත ස.නො.පු.බ. ව්‍යාපෘති පහත පරිදි වේ.

| ව්‍යාපෘති වර්ගය | ව්‍යාපෘති සංඛ්‍යාව | ධාරිතාවය (මෙ.වො.) |
|---|---|---|
| කුඩා ජලවිදුලි | 44 | **74** |
| ජෛවස්කන්ධ - කෘෂි හා කර්මාන්ත අපද්‍රව්‍ය විදුලිය | 01 | **02** |
| ජෛවස්කන්ධ– ඩෙන්ඩ්‍රෝ විදුලිය | 10 | **56** |
| ජෛවස්කන්ධ නාගරික ඝණ අපද්‍රව්‍ය විදුලිය | 03 | **20** |
| සූර්ය විදුලිය | 55 | **73** |
| සූර්ය තාප විදුලිය | 00 | **0** |
| සුළං විදුලිය | 02 | **36** |
| එකතුව | **115** | **261** |

### 2.5 ලං.වි.ම. විසින් සිදුකරන ජනන සංවර්ධනයන් සම්බන්ධ ශක්‍යතා අධ්‍යයනයන්

| අයිතම අංකය | ව්‍යාපෘති විස්තරය | අරමුදල් සැපයීමේ නියෝජිතායතනය | පිරිවැය | අවසන් කිරීම | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 01 | පළමු පොම්පගත ගබඩා ජල විදුලි ව්‍යාපෘතිය (PSHP) සඳහා වූ පූර්ව ශක්‍යතා හා විස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනයන් | විදේශීය (ආසියානු සංවර්ධන බැංකුව) + දේශීය | ශ්‍රී ලං.රු.මි. 385 | 2023 | 2021.08.03 දින ප්‍රසිද්ධ කරන ලද අභිප්‍රාය ප්‍රකාශය (EOI) |

## 2.6 වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ගොඩනගන ලද ජල විදුලි ව්‍යාපෘති

### තල්පිටිගල ජල විදුලි ව්‍යාපෘතිය

- බලාගාර ධාරිතාවය : මෙ.වො.15
- අපේක්ෂිත සාමාන්‍ය වාර්ෂික බලශක්තිය : ගි.වො.පැ. 52.4
- සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය : 2024

### ගිං ගඟ ජල විදුලි ව්‍යාපෘතිය

- බලාගාර ධාරිතාවය : මෙ.වො.20
- අපේක්ෂිත සාමාන්‍ය වාර්ෂික බලශක්තිය : ගි.වො.පැ. 66
- සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය : 2022

## 2.7 ලං.වි.ම. විසින් ක්‍රියාත්මක ජනන ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති

නඩත්තු / අලුත්වැඩියා පිරිවැය අවම කරමින් යන්ත්‍රවල කාර්යක්ෂමතාවය හා විශ්වසනීයත්වය වැඩිදියුණු කරනු පිණිස ලං.වි.ම. ජනන අංශය විසින් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබයි. නව තාක්ෂණය උපයෝගයෙන් නවීන උපකරණ යොදමින් යල්පිනු උපකරණ ඉවත් කෙරෙනු ඇති අතර, මෙමගින් පැරණි උපකරණයනට අමතර කොටස් නොමැති වීම හේතුවෙන් ඉස්මතුවන ගැටලු ආමන්ත්‍රණය කිරීමට හැකියාව ලබා දෙමින් ඉදිරි වසරයන්හි ඒවායේ කාර්යක්ෂමතාවය සහතික කරනු ඇත.

2021දී සිදුකරන ලද හා 2022 සඳහා සැලසුම්ගත ප්‍රතිසංස්කරණ කාර්යයන්හි කාර්ය සාධනය පහත දී ඇත.

| ව්‍යාපෘතියේ නම | 2021 ජුනි 30වන දිනට ප්‍රගතිය | වෙනත් කරුණු |
|---|---|---|
| ලක්විජය විදුලි බලාගාරයේ ගල් අඟුරු අංගන පහසුකම නංවාලීම | භෞතික ප්‍රගතිය -15% | 2023 දෙසැම්බරයේදී සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය<br>පවත්නා ධාරිතාවය - මෙ.ටො. මිලියන 0.9<br>වර්ධිත ධාරිතාව - මෙ.ටො. මිලියන 1.21 |
| කැළණිතිස්ස විදුලි බලාගාරයේ රාමුව–V වායු ටර්බයිනය ප්‍රතිසංස්කරණය | භෞතික ප්‍රගතිය - 85% | 2021 ඔක්තෝබරයේදී සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය |
| ඉඟිනියාගල විදුලි බලාගාරය ප්‍රතිසංස්කරණය | 01 ඒකකයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු 2021-02-12 දින සිට ආරම්භ කොට ඇත. භෞතික ප්‍රගතිය - 70% | 2021 දෙසැම්බරයේදී සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය |
| උඩවලව විදුලි බලාගාරය ප්‍රතිසංස්කරණය | ආරම්භ කළ යුතුව ඇත | 01 ඒකකයේ හා 03 ඒකකයේ ප්‍රතිසංස්කරණ කටයුතු |

## 2.8 ව්‍යාවසාය සම්පත් සැලසුම්කරණ (ERP) ව්‍යාපෘතිය

2021 වසර තුළ ව්‍යාවසාය සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අදියර ආරම්භ කිරීමට අපේක්ෂිතය. ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පැවතිණි. කෙසේ වුවද, ලංසුකරණ ක්‍රියාවලියට ප්‍රතිචාරාත්මක ලංසුවක් නොලැබුණු බැවින් නැවත ලංසු කැඳවීමක් සිදු කිරීමට සිදුවිය. මේ වනවිට නැවත ලංසු කැඳවීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. එබැවින්, මෙවන විට, 2021 අයවැයෙන් කිසිදු අරමුදල් ලබාදීමක් සිදුකොට නොමැති අතර, කිසිදු භෞතික ප්‍රගතියක්ද අත්කරගෙන නොමැත.

වර්තමාන ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් වූ පසු 2022 වසර සඳහා 18%කට ආසන්න භෞතික ප්‍රගතියක් අපේක්ෂා කෙරේ. 2022 වසර සඳහා ශ්‍රී ලං.රු. මිලියන 620ක CAPEX අයවැය මූල්‍ය ප්‍රගතියක් (18%) අයවැයකරණය කරනු ලැබේ.

## 3. විදුලිය සම්ප්‍රේෂණය

ඇතැම් කාර්ය ක්ෂේත්‍රයන් තුළ සෙසු අංශයනට සේවා සම්පාදනය කරන අතරම ලං.වි.ම. සමස්ත සම්ප්‍රේෂණ වත්කම් ප්‍රමාණයම ලං.වි.ම. සම්ප්‍රේෂණ අංශය විසින් සැලසුම්කරණය, සංවර්ධනය, මෙහෙයුම්කරණය හා නඩත්තුව සිදු කරනු ලබයි.

සම්ප්‍රේෂණ අංශය විසින් සියලු විදුලි බලාගාර ඇතුළත් වන පරිදි කි.වෝ. 220 හා කි.වෝ. 132 කොටුමා උපපොළයන් මෙහෙයවන අතර, එහි පද්ධති පාලන මධ්‍යස්ථානය මගින් ජාලය වෙත සැපයෙන සමස්ත විදුලිය ප්‍රමාණයම බෙදාහරිනු ලබයි. විදුලි සැපයුමෙහි විශ්වසනීයත්වය, ගුණාත්මකභාවය හා මෙහෙයුම් අරපිරිමැසුම්දායකත්වයද සාක්ෂාත් කරගනු පිණිස ජනන හා සම්ප්‍රේෂණ පද්ධති ක්‍රියාත්මක කිරීම පද්ධති පාලන මධ්‍යස්ථානය විසින් සැලසුම් කොට ක්‍රියාත්මක කරනු ලබයි. ජනන හා සම්ප්‍රේෂණ දත්ත ලේඛනාරක්ෂණය හා නිත්‍ය කළමනාකරණ තොරතුරු සැකසීමද සම්ප්‍රේෂණ අංශය විසින් සිදු කරනු ලබයි.

අංශයේ මෙහෙයුම් අරමුණු පහත පරිදි වේ:

- කාර්යක්ෂම, සමායෝජිත, විශ්වසනීය හා පිරිමැසුම්දායී සම්ප්‍රේෂණ පද්ධතියක් ගොඩනගා පවත්වාගෙන යාම.
- පාරිභෝගිකයන් වෙත ආරක්ෂිත, විශ්වසනීය හා අරපිරිමැසුම්දායී විදුලිය සැපයුමක් ලබාදෙන බවට වගබලාගනු පිණිස බෙදාහැරීමේ බලපත්ලාභීන් වෙත තොග වශයෙන් විදුලිය ලබාගෙන අලෙවි කිරීම.
- විදුලිය සඳහා වූ සාධාරණ පුරෝකථනීය ඉල්ලුම සපුරාලනු පිණිස ජනන බලාගාරයන් වෙතින් ප්‍රමාණවත් ධාරිතාවයක් පවත්නා බවට වගබලා ගැනීම.
- පද්ධතියේ කි.වෝ. 132 හා කි.වෝ. 220 සඳහා වෝල්ටීයතා විචලනයන් ±10 % සීමාව තුළද, හර්ට්ස් 50 සම්භාවිතාව ±1 % ඇතුළතද පවත්වාගෙන යාම.

රටේ සමස්ත සම්ප්‍රේෂණ මාර්ග හා කොටුමා උපපොළයන්ද ඇතුළත් සම්ප්‍රේෂණ පද්ධති සංවර්ධන ව්‍යාපෘති අත්දැකීම් බහුල ඉංජිනේරුවරුන්ගේ කණ්ඩායම්වලින් සමන්විත විශේෂයෙන් සකස් කරන ලද ව්‍යාපෘති කළමනාකරණ ඒකකයන් (PMU) විසින් සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘති කළමනාකරණ ඒකක ලං.වි.ම. ව්‍යාපෘති අංශය යටතේ ස්ථාපනය කරනු ලබයි.

### 3.1 සිදුකරනු ලබන සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිවල කාර්ය සාධනය

2021 වසර තුළ සිදුකරනු ලබන හා 2022 වසර තුළද නොකඩවා සිදු කිරීමට අපේක්ෂිත සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධ කෙටි විස්තරයක් පහත දී ඇත.

| අයිතම අංකය | ව්‍යාපෘති විස්තරය | අරමුදල් සැපයීමේ නියෝජිතායතනය | පිරිවැය | මෙහෙවරෙහි යෙදවීමට එකඟ වූ වසර | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 01 | **ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන හා කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය** | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය | | | |
| | පැකේජය 1: සම්ප්‍රේෂණ රැහැන් ඉදි කිරීම | | ශ්‍රී ලං.රු.බි. 11.67 | 2022 ජුලි | භෞතික - 27% මූල්‍ය – 13% |
| | පැකේජය 2: නව කි.වෝ. 220/132 උපපොළ ඉදි කිරීම | | ශ්‍රී ලං.රු.බි. 7.42 | 2021 දෙසැම්බර් | භෞතික - 56% මූල්‍ය – 39% |
| | පැකේජය 3: කි.වෝ. 220 සම්ප්‍රේෂණ රැහැන් ඉදි කිරීම | | ශ්‍රී ලං.රු.බි. 10.26 | 2022 ජුනි | භෞතික - 31% මූල්‍ය – 27% |
| | පැකේජය 4: බෙදාහැරීමේ උපපොළ හා කි.වෝ. 11 යොත් ඉදිකිරීම | | එ.ජ.ඩො.මි. 16.11, ශ්‍රී ලං.රු.බි. 1.7 | 2022 සැප්තැම්බර් | භෞතික - 17% මූල්‍ය – 10% |
| 02 | **හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය - අදියර II** | ආසියානු සංවර්ධන බැංකුව | | | |
| | පැකේජය 1 – A කොටස : හම්බන්තොට කොටුමා උපපොළ කි.වෝ. 220 සංවර්ධනය | | එ.ජ.ඩො.මි. 9.2, ශ්‍රී ලං.රු.බි. 437 | 2021 නොවැම්බර් | භෞතික - 84% මූල්‍ය – 67% |
| | පැකේජය 1 –B කොටස: නව පොල්පිටිය - හම්බන්තොට කි.වෝ. | | එ.ජ.ඩො.මි. 32.3, ශ්‍රී | 2021 සැප්තැම්බර් | භෞතික - 72% |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම (කි.මී. 150) | | ලං.රු.මි. 808.2 | | මූල්‍ය – 64% |
| | පැකේජය 2- A කොටස : නාඩුකුඩා කි.වෝ. 220/33 කොටුමා උපපොළ ඉදිකිරීම හා මන්නාරම කි.වෝ. 220/33 කොටුමා උපපොළ විශාලනය | | එ.ජ.ඩො.මි . 12.4, ශ්‍රී ලං.රු.මි. 947.6 | 2021 අප්‍රේල් | භෞතික - 100% මූල්‍ය – 87% |
| | පැකේජය 2- B1කොටස: මන්නාරම - නාඩුකුඩා කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය - කි.මී. 30 | | එ.ජ.ඩො.මි . 6.6, ශ්‍රී ලං.රු.මි. 438.5 | 2021 අප්‍රේල් | භෞතික - 100% මූල්‍ය – 85% |
| | පැකේජය 2- B2 A කොටස: පාදුක්ක - හොරණ කි.වෝ. 132, කි.මී. 25 සම්ප්‍රේෂණ මාර්ගය | | එ.ජ.ඩො.මි . 378.8 | 2022 අප්‍රේල් | භෞතික - 16% මූල්‍ය – 15% |
| | පැකේජය 2- B2 B කොටස : හබරණ - වාලච්චේන කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගයේ දෙවන පරිපථ වයරින්කරණය | | එ.ජ.ඩො.මි . 320.9 | 2021 නොවැම්බර් | භෞතික - 57% මූල්‍ය – 71% |
| 37 | ඌව | 2022 | බදුල්ල | බදුල්ල නගරයේ පෝෂකයේ යකොටසක් මැදි වෝල්ටීයතා පොදි බහන් දක්වා පරිවර්තනය | - | කි.මී. 3.5 |
| 38 | ඌව | 2022 | දියතලාව | හපුතලේ අටලු අංගනය විශාලනය – 4ARs, 1LBS | - | - |
| 39 | බ.ප.ද. II | 2022 | අවිස්සාවේල්ල | PD027 සිට PD034 දක්වා අන්තර් සම්බන්ධතා රැකුන් මාර්ගය | - | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 40 | බ.ප.ද. II | 2022 | අවිස්සාවේල්ල | සියලු තෙරු සහිතව HN027 සිට HN029 දක්වා දැනට පවත්නා කි.වෝ. 33 වීසල් කණු මාර්ගය රැකුන් කණු මාර්ගයක් දක්වා පරිවර්තනය | - | - |
| 41 | බ.ප.ද. II | 2022 | අවිස්සාවේල්ල | 46AVI010 සිට 46AVD009 දක්වා අධි වෝල්ටීයතා මාර්ගය ප්‍රති-සන්නායකගත කිරීම | - | - |
| 42 | බ.ප.ද. II | 2022 | අවිස්සාවේල්ල | මූණමලේ අටලු අංගනයේ සිට පහත්ගම පිරිවැය පියවා ගැනීම් කාර්යය සහිත 46HND006 අසල ස්ථානය - රෝයල් කාස්ක්ස් දක්වා | - | - |
| 43 | බ.ප.ද. II | 2022 | අවිස්සාවේල්ල | PD030 සිට මීගොඩ පෝෂකය දක්වා අන්තර් සම්බන්ධක මාර්ගයක් ඉදිකිරීම | - | - |
| 44 | බ.ප.ද. II | 2022 | අවිස්සාවේල්ල | කි.වෝ. 33 රැකුන් කණු මාර්ගය විතැන් කිරීම (AVSM380) | - | - |
| 45 | බ.ප.ද. II | 2022 | අවිස්සාවේල්ල | AV128 සිට HN005 දක්වා අන්තර් සම්බන්ධතා මාර්ගය ඉදිකිරීම | - | - |
| 46 | බ.ප.ද. II | 2022 | අවිස්සාවේල්ල | දැනට පවත්නා වීසල් මාර්ගය රැකුන් PD025 සිට PD026 දක්වා මාරු කිරීම | - | - |
| 47 | බ.ප.ද. II | 2022 | අවිස්සාවේල්ල | KOS F01, Kos F6 ස්විච්කරණ වැඩපිළිවෙල මාරු කිරීම රෝයල් කාස්ක්ස් ඩිස්ටිලරීස් දක්වා පුළුල් කිරීම | - | - |
| 48 | බ.ප.ද. II | 2022 | බණ්ඩාරගම | රයිගම අටලු අංගනයේ සිට මිල්ලනිය දක්වා කි.වෝ. 33 තනි පරිපථ කණු මාර්ගය ඉදිකිරීම | - | - |
| 49 | බ.ප.ද. II | 2022 | බණ්ඩාරගම | ඇලමෝදර අසල බස්නාහිර පළාත දකුණ තරාපැවි අවශෝෂණය සඳහා ආශ්‍රිත පද්ධති විශාලනය යෝජනා | - | - |
| 50 | බ.ප.ද. II | 2022 | බණ්ඩාරගම | BG035 සිට 65BGL007 දක්වා දැනට පවත්නා රැකුන් මාර්ගය ලිනක්ස් මාර්ගයක් දක්වා පරිවර්තනය | - | - |
| 51 | බ.ප.ද. II | 2022 | හෝමාගම | දැනට පවත්නා මාර්ග වලව්වේ පැන එන ඇද හැලෙන වහරුවේ සිට හබන්හේනවත්ත, HM -125, දුම්රිය හරස් මාර්ගය දක්වා විතැන් කිරීම, ඒවා ප්‍රතිසංස්කරණය හා ප්‍රති-සන්නායකගත කිරීම. | - | - |
| 52 | බ.ප.ද. II | 2022 | හෝමාගම | මත්තේගොඩ මාර්ගයේ සිට මාකුඹුර ගුවන් මූලික ස්ථානය (ABS) දක්වා පවත්නා රැකුන් මාර්ගය ලින්ක්ස් මාර්ගයක් බවට පරිවර්තනය | - | - |
| 53 | බ.ප.ද. II | 2022 | හෝමාගම | හෝමාගම හන්දියේ සිට දයානන්ද පැන එන ඇද හැලෙන වහරු දක්වා රැකුන්හි | - | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | සිට ලින්ක්ස් දක්වා පරිවර්තනය | | |
| 54 | බ.ප.ද. II | 2022 | හෝමාගම | මාකුඹුර අටලු අංගනයේ සිට 41HML001 දක්වා දැනට පවත්නා රකුන් මාර්ගය ලින්ක්ස් මාර්ගයක් බවට පරිවර්තනය | - | - |
| 55 | බ.ප.ද. II | 2022 | හෝමාගම | PN139 සිට PN066 දක්වා නව කි.වෝ. 33 රකුන් අන්තර් සම්බන්ධක කණු මාර්ගයක් ඉදි කිරිම - යෝජනාව ප්‍රතිශෝධනය | - | - |
| 56 | බ.ප.ද. II | 2022 | හොරණ | සබරගමුවට කුළුණු මාර්ගය ප්‍රයෝජනයට ගනිමින් ඉංගිරිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානයට (ඉමගිර) අයත් උපපොළ සම්බන්ධ කිරීම | - | - |
| 57 | බ.ප.ද. II | 2022 | හොරණ | HR059 සිට HR130 දක්වා දැනට පවත්නා වීසල් මාර්ගය රකුන් මාගර්යක් බවට පරිවර්තනය | - | - |
| 58 | බ.ප.ද. II | 2022 | හොරණ | හොරණ F2, හොරණ F5 , හා හොරණ F7 ප්‍රතිසැකසුම්කරණය | - | - |
| 59 | බ.ප.ද. II | 2022 | හොරණ | HR051 සිට HR131 දක්වා නව කි.වෝ. 33 අන්තර් සම්බන්ධතා මාර්ගයක් ඉදිකිරීම | - | - |
| 60 | බ.ප.ද. II | 2022 | හොරණ | HR163 සිට පානදුර මාර්ගය දක්වා අන්තර් සම්බන්ධතා මාර්ගයක් ඉදිකිරීම | - | - |
| 61 | බ.ප.ද. II | 2022 | හොරණ | HR189 සිට HR011 දක්වා අන්තර් සම්බන්ධතා මාර්ගයක් ඉදිකිරීම | - | - |
| 62 | බ.ප.ද. II | 2022 | හොරණ | රයිගම සිට නාර්තුපාන දක්වා කි.වෝ. 33 ලින්ක්ස් මාර්ගයක් ඉදිකිරීම | - | - |
| 63 | බ.ප.ද. II | 2022 | හොරණ | HR215 සිට HR056, HR014 දක්වා වීසල් සිට රකුන් දක්වා පරිවර්තනය | - | - |
| 64 | බ.ප.ද. II | 2022 | හොරණ | HR029 සිට HR078, HR103, 102,HR160 දක්වා වීසල් සිට රකුන් දක්වා පරිවර්තනය | - | - |
| 65 | බ.ප.ද. II | 2022 | ශ්‍රී ජ'පුර | නව පැලවත්ත ප්‍රාථමික උපපොළ දක්වා තිරස් නිෂ්කාශනයක් පවත්වාගෙන යාම පිණිස SJP F1 හා SJP F2 දක්වා විතැන් කිරීම | - | - |
| 66 | බ.ප.ද. II | 2022 | ශ්‍රී ජ'පුර | පාළම් තුන සිට අග්ගොනවෙල අටලු අංගනය දක්වා රකුන් මාර්ගය ලින්ක්ස් මාර්ගයක් බවට පරිවර්තනය | - | - |
| 67 | බ.ප.ද. II | 2022 | ශ්‍රී ජ'පුර | (සේවා ස්ථානයන්ද අතුළත්ව) සුභූතිපුර පාරේ කි.වෝ. 33 උඩිස් (OH) මාර්ගය කි.වෝ. 11 උඩිස් මාර්ගයක් දක්වා පරිවර්තනය. | - | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 68 | බ.ප.ද. II | 2022 | ශ්‍රී ජ'පුර | (සේවා ස්ථානයන්ද ඇතුළත්ව) උඩුමුල්ල පාරේ කි.වෝ. 33 උඩිස් (OH) මාර්ගය කි.වෝ. 11 උඩිස් මාර්ගයක් දක්වා පරිවර්තනය. | - | - |
| 69 | බ.ප.ද. II | 2022 | ශ්‍රී ජ'පුර | උඩුමුල්ල පාර හා සුභූතිපුර මාර්ගය අතර කි.වෝ. 11 අන්තර් සම්බන්ධතා මාර්ගය ඉදිකිරීම | - | - |
| 70 | බ.ප.ද. II | 2022 | ශ්‍රී ජ'පුර | පැලවත්ත හන්දියේ සිට තලවතුගොඩ පාර්ශ්වය දක්වා කි.වෝ. 11 උපපොළ කි.වෝ. 33 උපපොළ බවට පරිවර්තනය. | - | - |
| 71 | බ.ප.ද. II | 2022 | ශ්‍රී ජ'පුර | වල්පොල හන්දියේ සිට මණ්ඩාවිල දෙසට මුල්ලේරියාව රෝහල තුළ කි.වෝ. 33 අධි වෝල්ටීයතා මාර්ගය ප්‍රති-ස්ථානගත කිරීම - කි.මී. 0.516 | - | - |
| 72 | බ.ප.ද. II | 2022 | ශ්‍රී ජ'පුර | සුහුරුපායේ සිට සෙත්සිරිපාය දක්වා කි.වෝ. 33 මාර්ගය ඉදිකිරීමට අදාළ යෝජනා | - | - |
| 73 | බ.ප.ද. II | 2022 | හොරණ | දැනට පවත්නා කුලුණු මාර්ගය හා හැකි තැන්හි දැනට පවත්නා පාරේද දිගට වන්නට දැනට පවත්නා රැකුන් තනි පරිපථ කුලුණු මාර්ගය ලින්ක්ස් මාර්ගයක් බවට පරිවර්තනය | - | - |
| 74 | බ.ප.ද. II | 2022 | ශ්‍රී ජ'පුර | අඹතලේ අටලු අංගනයේ සිට 42WLA009 දක්වා රැකුන් සිට ලින්ක්ස් දක්වා පරිවර්තනය | - | - |
| 75 | බ.ප.ද. II | 2022 | ශ්‍රී ජ'පුර | 42MBR003 සිට 42MBD043 දක්වා රැකුන් සිට ලින්ක්ස් දක්වා පරිවර්තනය | - | - |
| 76 | බ.ප.ද. II | 2022 | ශ්‍රී ජ'පුර | කිඹුලාවල නව අටලු අංගනයක් ක්‍රියාත්මක කිරීම හා සමගාමීව කි.වෝ. 33/3C/XLPE/240 හතරැස් මි.මී. භූගත කේබල දෙකක් එළීම. | 33kV/3C/ XLPE/240 ව.මි.මී. භූගත | කි.මී. 0.5 |
| 77 | බ.ප.ද. II | 2022 | බණ්ඩාරගම | පුලේටන් කොටුමා උපපොළේ සිට රයිගම - ගලපාත දක්වා කි.වෝ. 33 ලින්ක්ස් තනි පරිපථ කුලුණු මාර්ග ඉදිකිරීම | කි.වෝ.33 ද්විත්ව පරිපථ ලින්ක්ස් කුලුණු මාර්ගය | කි.මී. 13 |
| 78 | බ.ප.ද. II | 2022 | බණ්ඩාරගම | රයිගම කර්මාන්ත කළාපයේ ත්‍රිත්ව තනි අංශ බස්බාර් (3SSBB ) අටලු අංගනය | 3SSBB | - |
| 79 | බ.ප.ද. II | 2022 | ශ්‍රී ජ'පුර | යෝජිත මාලබේ කොටුමා උපපොළේ සිට චන්ද්‍රිකා කුමාරතුංග මාවත අසල යෝජිත අටලු අංගනය දක්වා කි.වෝ. 33 ද්විත්ව පරිපථ ලින්ක්ස් කණුවක් ඉදිකිරීම. | කි.වෝ.33 ද්විත්ව පරිපථ ලින්ක්ස් කුලුණු මාර්ගය | කි.මී. 0.5 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 80 | බ.ප.ද. II | 2022 | ශ්‍රී ජ'පුර | චන්ද්‍රිකා කුමාරතුංග මාවතේ ද්විත්ව තනි අංශ බස්බාර් (2SSBB ) අටලු අංගනය ක්‍රියාත්මක කිරීම | 2SSBB | - |
| 81 | බ.ප.ද. II | 2022 | ශ්‍රී ජ'පුර | යෝජිත මාලඹේ කොටුමා උපපොලේ සිට කොස්වත්ත ප්‍රාථමික උපපොළ දක්වා නව කි.වෝ. 33 ලින්ක්ස් මාර්ගය ඉදිකිරීම | කි.වෝ.33 තනි පරිපථ ලින්ක්ස් කණු මාර්ගය | කි.මී. 4.7 |
| 82 | බ.ප.ද. II | 2022 | ශ්‍රී ජ'පුර | මාලඹේ කොටුමා උපපොළේ සිට මාලඹේ නගරය දක්වා නව පෝෂකයක් ඉදිකිරීම | කි.වෝ.33 තනි පරිපථ ලින්ක්ස් කුලුණු මාර්ගය | කි.මී. 1 |
| 83 | බ.ප.ද. II | 2022 | ශ්‍රී ජ'පුර | විකල්පයක් ලෙස මාලඹේ කොටුමා උපපොළ සිට අතුරුගිරිය F2 දක්වා නව අන්තර් සම්බන්ධතාවය ඉදිකිරීම | කි.වෝ.33 තනි පරිපථ ලින්ක්ස් කුලුණු මාර්ගය | කි.මී. 1 |
| 84 | බ.ප.ද. II | 2022 | ශ්‍රී ජ'පුර | භූගත ව්‍යාපෘතියට යෝජිත කි.වෝ. 11 ජාලයෙන් පුළුල් ලින්ක්ස් මාර්ගය භාවිත කොට ශ්‍රී ජ'පුර කොටුමා උපපොළෙන් කොස්වත්ත ප්‍රාථමික උපපොළ දක්වා විදුලි සැපයුම සකස් කිරීම | කි.වෝ.33 තනි පරිපථ ලින්ක්ස් කණු මාර්ගය | කි.මී. 1.5 |
| 85 | බ.ප.ද. II | 2022 | ශ්‍රී ජ'පුර | චන්ද්‍රිකා කුමාරතුංග මාවතේ යෝජිත අටලු අංගනයේ සිට තොරතුරු තාක්ෂණ උද්‍යානය දක්වා කි.වෝ. 33 ද්විත්ව පරිපථ ලින්ක්ස් කණු මාර්ගයක් ඉදිකිරීම | කි.වෝ.33 ද්විත්ව පරිපථ ලින්ක්ස් කුලුණු මාර්ගය | කි.මී. 0.8 |
| 86 | බ.ප.ද. II | 2022 | ශ්‍රී ජ'පුර | චන්ද්‍රිකා කුමාරතුංග මාවතේ යෝජිත අටලු අංගනයේ සිට අඹතලේ අටලු අංගනය හා අරංගල අටලු අංගනය දක්වා නව පෝෂක වැඩ පිළිවෙල | - | - |
| 87 | බ.ප.ද. II | 2022 | ශ්‍රී ජ'පුර | මාතලේ කොටුමා උපපොළේ සිට අතුරුගිරිය F6 දක්වා නව පෝෂකය | තනි පරිපථ ලින්ක්ස් කුලුණු මාර්ගය | කි.මී. 3 |

## 5.3.4 බෙදාහැරීමේ අංශය 4

| යොමු අංකය | පළාත | වසර | විස්තරය | වර්ගය | දිග (කි.මී.) | ඇස්තමේන්තුගත පිරිවැය (ශ්‍රී ලං.රු.මි.) |
|---|---|---|---|---|---|---|
| **ST/SP/38** | ද.ප. 2 | 2022 | තිස්ස සිට යෝධකණ්ඩිය දක්වා කි.වෝ. 33 රකූන් මාර්ගය ELM ලෙස ප්‍රති-සන්නායකගත කිරීම - කි.මී. 3 | රකූන් සිට ELM දක්වා | 3 | 7.5 |
| | ද.ප. 2 | 2022 | සමුපකාර මෝල (HA 162) සිට බෙරගම රෝහල් උපපොළ (HA 092) දක්වා කි.වෝ. 33 රකූන් කණු මාර්ගය අන්තර් සම්බන්ධ කිරීම - කි.මී. 1 | ත. ප., රකූන් | 1 | 3 |
| | ද.ප. 2 | 2022 | බෙරළිහෙල 3 ජනාවාසයේ (HK 020) සිට මුතියම්මල්ගම (HT 311) දක්වා කි.වෝ. 33 රකූන් කණු මාර්ගය | ත. ප., රකූන් | 2.1 | 6.3 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | අන්තර් සම්බන්ධ කිරීම - කි.මී. 2.1 | | | |
| | ද.ප. 2 | 2022 | මදුනාගල ආරණ්‍යයේ (HA 152) සිට කාර්යාල හා නිවාස (HS 191) උපපොළ දක්වා කි.වෝ. 33 රකුන් කණු මාර්ගය අන්තර් සම්බන්ධ කිරීම - කි.මී. 3.5 | ත. ප., රකුන් | 3.5 | 10.5 |
| | ද.ප. 1 | 2022 | රකදාහේන සිට පොල්ගහවිල දක්වා කි.වෝ. 33 වීසල් කනු මාර්ගය රකුන් මාර්ගයක් බවට ප්‍රති-සන්නායකගත කිරීම - කි.මී. 10 | වීසල් සිට රකුන් දක්වා | 10 | 20 |
| | ද.ප. 1 | 2022 | ගහබඩ පැන එන ඇද හැලෙන වහරුවල සිට මහලපිටිය පැන එන ඇද හැලෙන වහරු දක්වා කි.වෝ. 33 වීසල් කණු මාර්ගය රකුන් මාර්ගයක් බවට ප්‍රති-සන්නායකගත කිරීම - කි.මී. 5 | වීසල් සිට රකුන් දක්වා | 5 | 10 |
| | ද.ප. 1 | 2022 | විජය ගෘෘප් (BW 290) සිට උනන්විටිය පැන එන ඇද හැලෙන වහරු දක්වා කි.වෝ. 33 වීසල් කණු මාර්ගය රකුන් මාර්ගයක් බවට ප්‍රති-සන්නායකගත කිරීම - කි.මී. 6 | වීසල් සිට රකුන් දක්වා | 6 | 12 |
| | ද.ප. 2 | 2022 | කැටියාපේ (MH 355) සිට වළස්මුල්ල (TW 356) දක්වා කි.වෝ. 33 රකුන් කණු මාර්ගය අන්තර් සම්බන්ධ කිරීම - කි.මී. 2.5 | ත. ප., රකුන් | 2.5 | 7.5 |

ඉහත වැඩසටහන්වලට අමතරව, කි.වො. 75 සූර්ය බලශක්ති වැඩසටහනද ඉහත 4.5හි දක්වා ඇති පරිදි 2022 වසර තුළ නොකඩවා ඉදිරියට ගෙනයනු ඇත.

### 6. 2021 වසර සඳහා වූ මූල්‍ය කාර්ය සාධනය

විදුලි සැපයුම යනු අත්‍යවශ්‍ය සේවාවක් වන පසුබිමක, කොවිඩ්-19 වසංගතය පැතිර යාමෙන් අනතුරුව මුහුණ දෙන්නට සිදුවූ අභියෝග නොසලකා ලං.වි.ම. විසින් විදුලිය ජනනය, සම්ප්‍රේෂණය හා රටපුරා අබාධකව විදුලිය බෙදාහැරීමේ ප්‍රධාන මෙහෙයුම් කටයුතු නොකඩවා සිදුකරන ලදී.

ප්‍රධාන වශයෙන්ම පිරිවැය පිළිබිඹු නොකරන්නාවූ අයක්‍රමයන් හා යෝජිත අවම පිරිවැය විදුලිය ජනන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමෙහි සිදුවන ප්‍රමාදයන්ද හේතුකොට 2021 මුදල් වර්ෂය ලං.වි.ම.ට ශ්‍රී ලං.රු.බිලියන 80ක ශුද්ධ අලාභ අයවැයකරණයක් සහිත තවත් තීරණාත්මක වසරකි. රටතුළ පවත්නා වසංගත තත්ත්වයද සමගින්, ලං.වි.ම. විසින් එහි ආදායම් ධාරාවෙහි බරපතල සිදී යාමක් අත් විඳ ඇත.

ලං.වි.ම. විසින් 2021 වසර සඳහා ගි.වො.පැ. 15,798ක බලශක්ති අලෙවියක් ඇස්තමේන්තු කරන ලද අතර, එය ඒකක ප්‍රමාණයෙන් 2020 වසර හා සාපේක්ෂව 11%ක වර්ධනයකි. වර්ධනය වන බලශක්ති ඉල්ලුම සපුරාලනු පිණිස, ලං.වි.ම. විසින් 2021 වසර තුළ එහි සෘජු ජනන පිරිවැයෙන් 13%ක (ශ්‍රී ලං.රු. බිලියන 24ක) වර්ධනයක් අපේක්ෂා කරන ලදී. කොවිඩ්-19 වසංගතය හේතුකොට අඩු අගයක් ගත් 2020 වසර මැද තත්ත්වයට වෙනස්ව යමින් 2021 වසර මැද බලශක්ති ඉල්ලුම තරමක් දුරට වර්ධනය විය. ගෘහස්ථ අයක්‍රම කාණ්ඩයේ ඉල්ලුම් වර්ධනය නොසලකා ප්‍රධාන වශයෙන් කර්මාන්ත, පොදුකාර්ය හා හෝටල් අයක්‍රම කාණ්ඩයන්හි පසුගිය වසර තුළ පහත වැටීමක් වාර්තා විය.

ප්‍රධාන කොටම තොග සැපයුම් අයක්‍රම කාණ්ඩයන්හි බලශක්ති ඉල්ලුමේ සිදුවූ වර්ධනය හේතුකොට වසංගතයේ තුන්වන රැල්ල මධ්‍යයේ 2020 වසර මැද තත්ත්වය හා සාපේක්ෂව 2021 වසර මැද ශුද්ධ ජනනය 6%කින් වර්ධනය වී ඇත. කෙසේ වුවද, ඉහළ පිරිවැයක් සහිත බලශක්ති මූලාශ්‍රයන් වෙතින් බලශක්තිය මිලදී ගැනීමේ අවශ්‍යතාවයක් ඉස්මතු කරන ලද 2021 වසර සඳහා පුරෝකථනය කරන ලද අලෙවියට වඩා ඒකක වශයෙන් අලෙවි වර්ධනය අඩු අගයක විය.

තාප තෙල් මූලාශ්‍රයන් මත සැළකිය යුතු රඳා පැවැත්මක් තබාගැනීමේ හේතුවෙන් නොකඩවා මෙහෙයුම් අලාභයන් වාර්තා විය. කෙසේ වුවද, 2021 ජූනි මස 30වන දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වාර්තාගත අලාභය ශ්‍රී ලං.රු.බිලියන 4.5ක් වූ අතර 2020 ජූනි මාසය හා සාපේක්ෂව අලාභය 79%කින් අඩුවී ඇත. අඩු දෛනික විදුලි පරිභෝජනය මෙන්ම කුසලතා අනුපිළිවෙලගත පිට කිරීම් ලෙස වියදම් අධික විදුලි බලාගාර මෙහෙයවීමෙන් වැළකී සිටි ලං.වි.ම. ජල, ලං.වි.ම. ගල් අඟුරු හා ලං.වි.ම. සුළං බලශක්ති ජනනයන්හි

සිදුවූ වර්ධනයද ජනන මුහුවේ වාසිදායක වෙනස්වීමකට හේතු විය. රටතුළ වාර්තාවූ සාමාන්‍ය තත්ත්වයට වඩා ඉහළ මට්ටමක වූ වර්ෂාපතනය හේතුකොට පෙර වසර හා සාපේක්ෂව 2021 අප්‍රේල්, මැයි හා ජූනි මාසයන්හි ලං.වි.ම. ජල විදුලි නිමැවුමෙහි සැළකිය යුතු වර්ධනයක් දක්නට ලැබිණි. ඒ අනුව, පිරිවැය අධික තාප විදුලි මූලාශ්‍රයන්ගෙන් එතරම් ඉහළ දායකත්වයක් නොලබමින් වසරේ මුල් අර්ධය තුළ ලං.වි.ම.ට විදුලිය ඉල්ලුම සපුරාලීමට හැකිවිය. කෙසේ වුවද, කොවිඩ්-19 හේතුකොට දීපව්‍යාප්තව පනවා ඇති සීමාකරණයන් ඉවත් කිරීමත් සමගින් වසරේ දෙවන භාගය තුළ විදුලි පරිභෝජන ඉල්ලුම වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එහි ප්‍රතිඵලයක් ලෙස, දෛනික ඉල්ලුම සපුරාලනු පිණිස පිරිවැය අධික බලශක්ති මූලාශ්‍රයන් වෙතින් සිදු කෙරෙන විදුලිය ජනනයේ වර්ධනයත් සමගින් ඍජු ජනන පිරිවැය වර්ධනය වනු ඇත.

ප්‍රධාන වශයෙන් 2021 මැයි හා ජූනි මාසයන්හි රටතුළ පැවති වර්ධිත වර්ෂාපතන තත්ත්වය හේතුකොට ස්වාධීන බලශක්ති නිෂ්පාදකයන් (තාප) වැනි අංශයන් වෙතින් විදුලිය මිලදී ගැනීම වැනි පිරිවැය අධික තාප බලශක්ති මූලාශ්‍රයන්ගෙන් විදුලිය ජනනය කිරීමේ අවශ්‍යතාවය අවම වී ඇත. ලං.වි.ම. - ජල විදුලි අංශයෙන් සිදුවූ විදුලිය ජනනය වර්ධනය කරමින් එකී මාස තුළ සාමාන්‍ය තත්ත්වය ඉක්මවූ වර්ෂාපතනයක් බොහෝ ජලාශයන් වෙත ලැබුණු අතර, ඒ අනුව ලං.වි.ම. - ජල විදුලි නිෂ්පාදන දායකත්වය 2021 ජූනි මාසය තුළ වූ ශුද්ධ ජනනයෙන් 51%ක් විය. ශ්‍රී ලංකාවේ විදුලිය ජනනයේ ඓතිහාසික කඩඉමක් සනිටුහන් කරමින් ශ්‍රී ලංකාවේ විශාලතම සුළං විදුලි බලාගාරය ලෙස ලං.වි.ම. - තම්බපවණි සුළං විදුලි බලාගාරය විසින් වසරේ පළමු අර්ධය තුළ ගි.වො.පැ. 100ක් ජනනය කරන ලදී.

ජනන මුහුවෙහි ලං.වි.ම.-ජලවිදුලි, ලං.වි.ම.- ගල් අඟුරු හා ලං.වි.ම. - සුළං අංශයන්ගෙන් ලද දායකත්වයේ වර්ධනය මගින් (සමස්ත ශුද්ධ ජනනයෙන් 66%ක් ලෙස) පෙර වසර හා සාපේක්ෂව මූල්‍ය කාර්ය සාධනය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරන ලදී. උදුන් තෙල් ලෙස (2020.03.19 සිට ක්‍රියාත්මකවන පරිදි) එන සහනදායී ඉන්ධන මිලද සමගින්, 2020 ජූනි මාසය හා සාපේක්ෂව ලං.වි.ම.ට තාප බලාගාරයන්හි බලශක්ති පිරිවැය 22%කින් (රු. බි. 4) අඩු කිරීමට හැකිවිය. මේ හා සමගින්, මිලදී ගත් බලශක්ති තාපය මත යැපීම 29% කින් පහත වැටීම සහ සහනදායී මිලට ස්වාධීන විදුලිය නිෂ්පාදකයන් - තාප අංශය වෙත උදුන් තෙල් නිකුත් කිරීමද සමගින් මිලදීගනු ලබන තාප විදුලිය මත රඳා පැවැත්මේ අඩුවීමද 2020 ජූනි මාසය හා සාපේක්ෂව ආශ්‍රිත බලශක්ති ගාස්තු 35%කින් (රු.බි. 14.7) අඩු කිරීමට හේතුවිය. පෙරකී ඍජු ජනන පිරිවැය අඩුවීම මගින් 2021 ජූනි 30වන දිනෙන් අවසන් මාස හයක කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අලාභය අඩු කිරීම කෙරෙහි ධනාත්මක දායකත්වයක් ලබාදෙන ලදී. කෙසේ වුවද, ප්‍රධාන කොටම පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන්ගෙන් සිදුවන බලශක්ති ජනනයේ වර්ධනය හේතුකොට පුනර්ජනනීය බලශක්තිය මිලදී ගැනීම සඳහා දරන ලද වියදම රු. බිලියන 7.8කින් ඉහළ ගොස් ඇත. මෙයට අමතරව, කොවිඩ්-19 වසංගතය හේතුකොට ලං.වි.ම. මුහුණ දී ඇති බරපතල මූල්‍ය ධාරා දුෂ්කරතාවයන් මැඩපවත්වනු පිණිස සමන ක්‍රියාමාර්ගයක් ලෙස පොදුකාර්ය වියදම් සීමා කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපදෙස් ලබාදී ඇත.

කෙසේ වුවද, අද වනවිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඍණ රඳවාගත් ඉපැයුම් ශේෂයක් පවත්නා ඉමක් දක්වා සැලකිය යුතු ලෙස ලං.වි.ම. මූල්‍ය තත්ත්වයට බාධා සිදුව ඇත. පිරිවැය අධික තාප තෙල් විදුලි ජනන මූලාශ්‍ර මත අධික ලෙස රඳා පැවැත්ම හා තාප තෙල් විදුලි ජනන මූලාශ්‍රයන්හි අධික පරිවැයද, ජනන පිරිවැය පිළිබිඹු කරනු පිණිස පසුගිය වසර හත ඇතුළත (2013 වසරේ සිටම) විදුලි මිල ගණන්වල ඉහළ නැංවීමක් නොමැති තත්ත්වයක සෙසු ද්‍රව්‍යයන්හි ඉහළ නගින මිල ගණන්ද හේතුකොට පිරිවැය වර්ධනය වෙමින් පවතී.

ප්‍රධාන ආර්ථික කටයුත්තක නියැළි පොදු ව්‍යාපාරයක් වශයෙන්, දැරිය හැකි මිලකට අවසන් පාරිභෝගිකයා වෙත විදුලිය සැපයීමට ලං.වි.ම.ට බල කෙරී ඇත. මෙලෙසින්, ලං.වි.ම. මූල්‍යමය සෞඛ්‍යය අනතුරට පත් කරමින් නිෂ්පාදන පිරිවැයට බොහෝ සෙයින් අඩු මිලකට ලං.වි.ම. විසින් විදුලිය සම්පාදනය කරන බැවින් ගෘහස්ථ කාණ්ඩයේ පහළ මට්ටමේ අවසන් පාරිභෝගිකයන් මෙන්ම කර්මාන්ත, හෝටල්, ආගමික හා රාජ්‍ය කාණ්ඩයන්හි පාරිභෝගිකයන් වෙතද බොහෝ සෙයින් සහන මිලට විදුලිය සැපයේ. 2021 ජූනි මස 30වන දින වනවිට, සමස්ත රාජ්‍ය ප්‍රතිපත්තිමය අලාභය (සහනය) රු. බිලියන 23.8ක් ලෙස ඇස්තමේන්තුගත කරන ලද අතර, ඉහළ අන්තයේ පාරිභෝගිකයන් වෙතින් අය කෙරුණු අතිරික්තය රු. බිලියන 15.4ක් විය. ඒ අනුව, 2021 මාස හයෙන් අවසන් කාල පරිච්ඡේදයක් සඳහා ලං.වි.ම. ලද අලාභය රු. බිලියන 8.4ක් ලෙස වාර්තා විය. සෙසු ආදායම් ගැලපීමෙන් අනතුරුව, එම කාල පරිච්ඡේදය සඳහා වූ ශුද්ධ අලාභය රු. බිලියන 4.5ක් ලෙස වාර්තා විය.

<u>ණය ගැනීම් හා ප්‍රධාන ණය හිමියෝ</u>

පිරිවැය පිළිබිඹු කරන්නාවූ අයක්‍රමයක් නොමැති වීම හා ගාස්තු ඒකරාශි කරගැනීමේ ක්‍රියාවලියෙහි නොකඩවා සිදුවූ බාධාවන් හේතුකොට, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, ස්වාධීන විදුලිය නිෂ්පාදකයන් ඇතුළත් ප්‍රධාන සැපයුම්කරුවන් වෙත ගාස්තු ගෙවීම සම්බන්ධව හා ගල් අඟුරු ප්‍රසම්පාදනයනට අවශ්‍ය මූල්‍යකරණය සම්බන්ධ ගැටලු ඇති කරමින් ලං.වි.ම. කාරක ප්‍රාග්ධනයට බරපතල බලපෑම් එල්ල වී ඇත. එම ස්වභාවයේ පළමු වරට සිදුවූ සිදුවීමක් ලෙස, රජය සතු උපයෝගිතා ආයතනයක් වශයෙන්, 2021 අප්‍රේල් මස 08වන දින වසර පහකින් (05) කල් පිරීමේ දිනය සපිරෙන ජොෂ්ඨ, අනාරක්ෂිත, ලැයිස්තුගත, පියවාගත හැකි, ශ්‍රේණිගත

ණයකර රු. බිලියන 20ක ප්‍රමාණයක් ලං.වි.ම. විසින් නිකුත් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ණයකර නිකුතුව පළමු දිනයේදීම අධි ඉල්ලුමකට ලක් විය. ලද මුදල් ස්වාධීන විදුලිය නිෂ්පාදනායතනයන් වෙත ගෙවිය යුතුව පවත්නා රු. බිලියන 14ක මුදලින් හා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතුව පවත්නා රු. බිලියන 6ක මුදලින් යම් ප්‍රමාණයක් පියවීම සඳහා උපයෝගී කරගන්නා ලදී.

ණයකර නිකුතුව මගින් ලද අරමුදල් මගින් ස්වාධීන විදුලිය නිෂ්පාදනායතනයන් වෙත සිදුකරන ලද සැලකිය යුතු ගෙවීම් ප්‍රමාණයද සමගින් 2020 වසර අවසානය වනවිට රු. බිලියන 61.5ක් ලෙස පැවති ගෙවීමට ඉතිරි මුදල් ප්‍රමාණය 2021 ජුනි මාසය අග වනවිට රු. බිලියන 51.6ක් ලෙස වාර්තා විය. මේ අතර, යහපත් කාලගුණික තත්ත්වය මෙන්ම කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුකොට ඉල්ලුමෙහි සිදුවූ පහත වැටීමද හේතුකොට ස්වාධීන විදුලිය නිෂ්පාදනායතනයන් වෙතින් විදුලිය මිලදී ගැනීමෙහි සිදුවූ පහත වැටීම එකී වගකීම් පහත වැටීම කෙරෙහි ධනාත්මක බලපෑමක් සිදුකර ඇත. කෙසේ වුවද, ඉතිරි මුදල් පියවීම සඳහා ලද මූල්‍ය ප්‍රවාහයන්හි අප්‍රමාණවත්භාවය හේතුකොට 2020 දෙසැම්බර් මස 31වන දින වනවිට රු. බිලියන 72ක් ලෙස පැවති ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතුව පැවති ඉතිරි මුදල් ප්‍රමාණය 2021.06.30 දින වනවිට රු. බිලියන 78 දක්වා වර්ධනය වී ඇත.

මෙයට අමතරව, 2021 වසර තුළ, ප්‍රධාන වශයෙන් ගල් අඟුරු ප්‍රසම්පාදන කටයුතු සඳහා වූ මූල්‍යකරණය පිණිස ලං.වි.ම. විසින් මහජන බැංකුවෙන් රු. බිලියන 13ක මුදලක් ණය වශයෙන් ලබාගන්නා ලදී. 2021 ජුනි 30 දින වනවිට, කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයනට මුදල් සැපයීම සඳහා අයිරාවන්ද ඇතුළත් සමස්ත බැංකු ණය ගැනීම් ප්‍රමාණය රු. බිලියන 114ක් විය. මෙයට අමතරව, 2021 ජුනි මස 30වන දින වනවිට සමස්ත ව්‍යාපෘති ණය ගැනීම් ප්‍රමාණය රු. බිලියන 270.5ක් විය.

යෝජිත පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතීන්හි අඩු පිරිවැය සහිත මූල්‍යකරණ මූලාශ්‍රයක් ලෙස, ලං.වි.ම. විසින් මේවන විට එහි රාමුව හා පරිසර හිතකාමී ආකාරයකින් දැනට වර්ධනය වෙමින් පවත්නා බලශක්ති ඉල්ලුම් අවශ්‍යතාවය සපුරාලීමේ එක් විධික්‍රමයක් ලෙස "හරිත මූල්‍යකරණ මූලාරම්භයන්" මගින් අරමුදල් ලබාගැනීමේ හැකියාව අධ්‍යයනය කරමින් පවතී.

## 7. මුහුණ දෙන අභියෝග හා එවන් අභියෝග ආමන්ත්‍රණය කරනු පිණිස යොදාගනු ලබන ක්‍රමෝපායන් සහ අනාගතය සඳහා නිර්දේශ

### 7.1 පිරිවැය පිළිබිඹු කරන අයක්‍රමයක අවශ්‍යතාවය

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත ක්‍රමවේදය ප්‍රකාර පිරිවැය පිළිබිඹු කරන අයක්‍රමයක් ප්‍රකාශයට පත් නොකිරීම හේතුකොට, ලං.වි.ම.ට වාර්ෂිකව ශුද්ධ මූල්‍ය අලාභයන් සිදුව ඇත. 2016 හා 2021 ජුනි මාසය අතර කාල පරිච්ඡේදය තුළ ලං.වි.ම.ට දැරීමට සිදුවූ මූල්‍ය අලාභය ශ්‍රී ලං.රු. මිලියන 263,054 කි. මෙහෙයුම්ගත ශුද්ධ මුදල් ප්‍රවාහය සෘණ අගයක වූ අතර, බාහිරින් මූල්‍ය සහායක් ලබා දෙන්නේ නම් විනා ප්‍රධාන ව්‍යාපාරික කටයුතු සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය සොයාගැනීමට ලං.වි.ම.ට නොහැකි වේ. ප්‍රධාන කොටම තෙල් හා ගල් අඟුරු ප්‍රසම්පාදනය කිරීම සඳහා වූ ලං.වි.ම.හි කෙටි කාලීන කාරක ප්‍රාග්ධන අවශ්‍යතා කෙරෙහි මුදල් සපයනු පිණිස දිගු කාලීන ණය ගැනීම් සිදු කිරීමට මෙම තීරණාත්මක මූල්‍ය තත්ත්වය විසින් ලං.වි.ම. වෙත බල කරනු ලබයි. 2021 මැයි මස 31වන දින වනවිට ගෙවීමට ඇති ප්‍රධාන ශේෂයන්හි සමුච්චිත එකතුව ශ්‍රී ලං.රු.බිලියන 317ක අගයක විය. මෙම තත්ත්වය පාලනය කරගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් නොගතහොත්, අභ්‍යන්තර අධ්‍යයනයන් මගින් පෙන්වන පරිදි 2025 වසර වනවිට සමස්ත ණය ප්‍රමාණය ශ්‍රී ලං.රු.බිලියන 750කට ඉහළ අගයක් ගනු ඇත. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙතින් නිකුත් කරනු ලබන ප්‍රතිශෝධිත ඉන්ධන මිල තත්ත්වය තුළ, නියං සමය ඇතුළත තෙල් භාවිතයේ යම් වර්ධනයක් සිදුවුවහොත් තත්ත්වය වඩාත් අයහපත් අතට හැරිය හැක. ලං.වි.ම. වර්තමාන මූල්‍ය තත්ත්වය තුළ, නිසි කලට ස්වාධීන විදුලිය නිෂ්පාදකයන්ගේ හා ස.නො.පු.බ. සැපයුම්කරුවන් වෙත ගෙවිය යුතුව පවත්නා ඉතිරි මුදල් පියවීම අභියෝගයක් වන අතර, එතුළින් රජයේ පුනර්ජනනීය විදුලි ප්‍රතිපත්තියට බලපෑමක් ඇතිවනු ඇත.

එබැවින්, අයක්‍රමයට අයත් ගාස්තුව පහත පරිදි ඉහළ නැංවීම නිර්දේශ කෙරේ: බලශක්ති ගාස්තුව කිලෝ වොට් එකකට රු. 2.50 බැගින්ද, ස්ථාවර ගාස්තුව 35%කින්ද, ඉල්ලුම් ගාස්තුව 35%කින්ද වශයෙනි.

නොඑසේව, නියාමනායතනය වන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නිර්දේශිත සහනාධාරය ජාතික අයවැයට ඇතුළත් කරනු ලැබ ලං.වි.ම.ට එහි කටයුතු සිදු කරනු පිණිස මාසික පදනමින් බැර කෙරෙනු ඇත.

### 7.2 රජයේ ප්‍රතිපත්ති

විදුලි ව්‍යාපෘතීන්ට දිගු කාලීන වර්ධන සමයන් පවතී. එබැවින්, සංවර්ධන කටයුතු කල්තබා ආරම්භ කරනු පිණිස අවශ්‍ය දිනට බොහෝ කලකට පෙර සැලසුම් සකස් කෙරේ. විදුලිය ව්‍යාප්ත කිරීමේ සැලසුම්කරණයද සැලකිය යුතු කාලයක් ගත වන්නකි. එබැවින්, රජයේ ප්‍රතිපත්ති පැහැදිලි හා ස්ථාවර ඒවා විය යුතුය. වෙනස්වන

සුළු හා අස්ථාවර රජයේ ප්‍රතිපත්ති මගින් උපයෝගිතා සැලසුම්කරණය හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කෙරෙහි කල්තබා ප්‍රධාන අභියෝගයන් හා අවදානම් නිර්මාණය කරනු ලබයි.

අනාගත විදුලි සංවර්ධනයන් සම්බන්ධයෙන් රජයේ දැඩි තීරණයක් ලබාදෙන තුරු මේවන විට ගල් අඟුරු විදුලිබල සංවර්ධන ව්‍යාපෘති නතර කරනු ලැබ පවතී. ජාල ව්‍යාප්ති සැලසුම් සඳහා අවශ්‍ය අනුමැතීන්ද රජයේ ප්‍රතිපත්ති වෙනස් වීම් හේතුකොට ප්‍රමාද වේ. එබැවින්, පිරිවැය ඵලදායී, අබාධ විදුලිය සැපයුමක් සහතික කරනු සඳහා ජනන සංවර්ධනයන් සම්බන්ධයෙන් වහා කටයුතු කරනු පිණිස විදුලි අංශය සම්බන්ධ දැඩි රාජ්‍ය ප්‍රතිපත්තියක් පවත්වාගත යුතුවේ.

### 7.3 රජයේ ආයතන වෙතින් ලං.වි.ම. වෙත ලැබිය යුතුව පවත්නා ගෙවීම්

නියාමනය නොකළ ව්‍යාපාරයක් වශයෙන් ලං.වි.ම. විසින් විවිධ රජයේ ආයතනයන් වෙත හදිසි විදුලි බලාගාර කුලියට ලබාදීම, අලුත්වැඩියාව හා නඩත්තුව මෙන්ම සෝපාන හා වායු සමීකරණ යන්ත්‍රාගාර අලුත්වැඩියාව හා නඩත්තුවද වැනි සේවා සම්පාදනය කරනු ලබයි. කෙසේ වුවද, එම රජයේ ආයතන සේවාවන් ලබාගත් පසු එම සේවාවන් සඳහා ගෙවිය යුතු ගාස්තු ගෙවීමේ හුරුවක් සහිත ආයතන නොවේ. එනමුත් අදාළ ස්ථානයන්හි හා එළැඹි තත්ත්වයන්හි වැදගත්කම හේතුකොට ලං.වි.ම.ට එම සේවාවන් සිදු කිරීමට සිදුවේ. නොගෙවන ලද ගාස්තුවල සමුච්චිත එකතුව ශ්‍රී ලං.රු. මිලියන 297.11ක් වේ.

ඒ අතර, 2021 මැයි මාසය අවසන් වනවිට රජයේ ආයතනයන් වෙතින් ලැබිය යුතුවන සමස්ත හිඟ බිල්පත් සමුච්චිත අගය ශ්‍රී ලං.රු. මිලියන 255.94ක් විය.

තවද, ලං.වි.ම. රජයේ ආයතන ඒකකයේ කොළඹ නගර ශාඛාව විසින් රජයේ ආයතනයන්හි හා ආරෝග්‍යශාලාවන්හි අභ්‍යන්තර වයරින්කරණය නඩත්තු කිරීමේ හා ඒ ආශ්‍රිත උපකරණ නඩත්තු කිරීමේ වගකීම දරයි. මෙම කටයුතු සඳහා ලැබිය යුතු ගාස්තුද තවදුරටත් හිඟව පවත්නා අතර, 2021 ජුනි මාසය අවසානය වනවිට එහි සමුච්චිත අගය ශ්‍රී ලං.රු.මිලියන 634.73ක් විය.

එබැවින්, ලං.වි.ම. වෙත ඉහත කී ලැබිය යුතු මුදල් (ආසන්න වශයෙන් ශ්‍රී ලං.රු. මිලියන 1,187.78) පියවීම සඳහා ජාතික අයවැයෙන් අරමුදල් වෙන්කළ යුතු බවට නිර්දේශ කෙරේ.

# සී/ස. ලංකා විදුලි පුද්ගලික සමාගම

## 1 හැඳින්වීම

සීමාසහිත ලංකා විදුලිබල (පුද්ගලික) සමාගම (ලෙකෝ) 1982 අංක 17 දරණ හා 2007 අංක 07 දරණ සමාගම් පණත යටතේ මීගමුවේ සිට ගාල්ල දක්වා වූ ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ තීරයේ ප්‍රධාන ආර්ථික කළාපය තුල බලයලත් ප්‍රදේශයට විදුලිබලය බෙදා හැරීමේ මූලික අරමුණු ඇතිව 1983 වර්ෂයේදී සංස්ථාපිත කරන ලදී. පසුව 2009 අංක 20 දරණ විදුලිබල පණත මගින් ලෙකෝ වෙත බෙදා හැරීමේ බලපත්‍රයක් නිකුත් කරමින් මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියාමනය යටතට ගෙන එන ලදී.

### අපගේ දැක්ම

නව්‍ය පරිසර හිතකාමී ව්‍යාපාරය තුළින් ජන ජීවිතය එළිය කරමින් සතුට දැනවීම.

### අපගේ මෙහෙවර

අඛණ්ඩ නව්‍යකරණය මගින් වඩාත් යහපත් බලශක්ති විසඳුම් සමාජයට අත්කරදීම.

### සමාගමේ අගයන්

ඵලදායිත්වය වර්ධනයට තුඩුදෙන පරිසර විද්‍යාත්මක තිරසාර වටපිටාවක් තුළ බෙදුම් සේවා නව්‍යකරණය කරමින් හා වැඩිදියුණු කරමින් නිරන්තර කුතුහලය නිසා ලබාදෙන නව්‍ය සේවා මඟින් අපගේ පාරිභෝගිකයින් විස්මිත කිරීම හා හැකියාවන් සහිත හා තෘප්තිමත් කාර්ය මණ්ඩලයක් මඟින් ලාභදායිත්වය ඇති කිරීම.

### මූලික නිපුනතාවන්

බලශක්ති ක්ෂේත්‍රයේ විවිධාකාරී අත්දැකීම් තුලින් වැඩි දියුණු කළ ඉංජිනේරු, පර්යේෂණ හා සංවර්ධනය සහ නවෝත්පාදන, මූලික නිපුනතාවයන් වන අතර අපගේ දැක්ම හා ඉලක්කයන්ට අනුකූලව සමාගම විවිධාංගික ක්‍රියාකාරකම් සඳහා ආයෝජනය කරනු ඇත.

### සමාගමේ අරමුණු

- සමාගමෙහි ක්‍රියාකාරකම් පිළිබඳව පාර්ශවකරුවන්ගේ දැනුවත්භාවය විධිමත්ව හා විනිවිධභාවයකින් යුක්තව සහතික කිරීම සහ උපායමාර්ගික විවිධාංගීකරණය ආරම්භ කිරීම.
- නියාමන සම්මතයන් සහ අභ්‍යන්තර සේවා ප්‍රමිතීන්ට අනුකූලව බෙදා හැරීමේ සේවා වැඩි දියුණු කිරීම.
- පර්යේෂණ හා සංවර්ධනය සහ නවෝත්පාදනයන් තුලින් සමාගමෙහි තාක්ෂණික හැකියාවන් ඉහළ නැංවීම.
- නාස්තිය අවම කිරීමෙන් ව්‍යාපාර ලාභදායිත්වය, කාර්යක්ෂමතාව, අභ්‍යන්තර ක්‍රියාවලි පාලනය සහ උපාය මාර්ගික ආයෝජනය ඉහළ නැංවීම.
- ජාතික හා ජාත්‍යන්තර සම්මතයන් මඟින් සළකුනු කර ඇති සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයක් තුලින් ඵලදායි, නිපුණ, අභිප්‍රේරණය සහ අන්‍යෝන්‍ය ගෞරවනීය ශ්‍රම බලකායක් සහතික කිරීම.

## 2. 2021 වර්ෂයෙහි සංවර්ධන ව්‍යාපෘති හා ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

සමාගමේ ජයග්‍රහණය අපගේ කාර්යසාධනය සහ පාර්ශවකරුවන් සඳහා ඉහළ සේවාවක් ලබා දීමට ඇති කැපවීම ප්‍රදර්ශනය කරයි.

| | 2017 | 2018 | 2019 | 2020 | 2021 අයවැය | 2021 ජූනි වන විට තත්‍ය |
|---|---|---|---|---|---|---|
| පාරිභෝගිකයින් | 551,123 | 562,412 | 568,250 | 580,184 | 612,056 | 582,134 |
| විකුණුම් GWh රු.මිලි. | 1518 | 1,570 | 1,646 | 1,624 | 1,740 | 727 |
| ආදායම රු.මිලි. | 29,930 | 30,947 | 32,461 | 30,709 | 38,782 | 16,052 |
| බෙදාහැරීම් අලාබ (11 Kv) % | 2.7 | 2.27 | 1.61 | 1.34% | 3.99% | 2.92% |
| පාරිභෝගික/ සේවක අනුපාතය | 351 | 358 | 370 | 392 | 408 | 394 |
| කාර්යසාධන මිනුම් දර්ශක විශ්වාසනීයභාවය (SAIDI)(පැය/ පාරිභෝගික/ වර්ෂය ) | 41.9 | 39.1 | 34.7 | - | - | - |

**2021 ජූනි වන විට වත්කම් බෙදා හැරීමේ වාර්තාව පහත පරිදි වේ.**

| වත්කම් වර්ගය | මිණුම් ඒකකය | 2021 ආරම්භක ශේෂය | 2021 ජූනි වන විට සත්‍ය කාර්යසාධනය | 2021 ජූනි වන විට ශේෂය |
|---|---|---|---|---|
| 11 kV UG | km | 72.042 | 0.460 | 72.502 |
| 11 kV OH/DC | km | 14.489 | - | 14.489 |
| 11 kV OH/SC | km | 161.311 | 0.936 | 162.247 |
| 11 kV OH/SC+LV | km | 846.938 | 0.232 | 847.170 |
| බෙදා හැරීම්/උපපොළ S 11 kV | NO | 2,474 | 11 | 2,485 |
| බෙදා හැරීම්/උපපොළ S 11 KV ධාරිතාව | kVA | 398,938 | 2,880 | 401,818 |
| තොග/ උපපොළ S 11 kV | NO | 1,982 | 26 | 2,008 |
| තොග/ උපපොළ S 11 kV CAPACITY | kV | 561,503 | 6,600 | 568,103 |
| ස්විච්ගියර් පොළ- LBS & Nu-Lec | NO | 552 | 4 | 556 |
| - LBC | NO | 613 | 6 | 619 |
| 11 kV ස්වයංක්‍රිය ප්‍රතිවර්තනයන් | NO | 23 | - | 23 |
| 11 kV අංශ කිරීම් | NO | 7 | (3) | 4 |
| LV බෙදා හැරීම් පද්ධතිය 1 PH/SC | km | 41.107 | (0.522) | 40.585 |
| LV බෙදා හැරීම් පද්ධතිය 2 PH/SC | km | 1.960 | 0.477 | 2.437 |
| LV බෙදා හැරීම් පද්ධතිය 3PH/SC | km | 3,501.565 | 12.030 | 3,5595 |
| LV බෙදා හැරීම් පද්ධතිය 3PH/DC | km | 27.981 | - | 27.981 |
| පාරිභෝගික සේවා දිගුව | NO | 596,822 | 5,398 | 602,220 |
| ලං.වි.ම ප්‍රාථමික/උපපොළ (සේවා සැපයීම් ලෙකෝ) | NO | 36 | - | 36 |
| ලං.වි.ම ප්‍රාථමික/උපපොළ ධාරිතාවය | MVA | 435 | 5 | 440 |
| ලං.වි.ම විදුලි මණු මිලදී ගැනීම PT.S | NO | 38 | 1 | 39 |

### ව්‍යාපෘති හා ප්‍රගතිය

#### මෙහෙයුම්

- බෙදාහැරීම් ජාලයතුල ව්‍යාප්තිය හා පුනරුත්ථාපන කටයුතු පාරිභෝගිකයිනගේ විදුලි ඉල්ලුම සහ සැපයුම් විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීමේ අවශයතාවයමත පදනම් වේ. මෙය එක් එක් ශාඛා විසින් මෙහෙයවනු ලබන අඛණ්ඩ ක්‍රියාවලියකි.
- බෙදා හැරීමේ අලාබ අඛණ්ඩව අඩු කිරීම සඳහා සැපයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.
- ඇනහිටීම් සඳහා යොමුවීම් කාලය සහ බිඳවැටීම් ප්‍රතිස්ථාපන කාලය අඩු කිරීමෙහි අඛණ්ඩ වර්ධනය.
- නව සම්බන්ධතා ඇතුළු පාරිභෝගිකයින් ඉල්ලුම් කරන ලද සේවාවන් සඳහා වන සැකසුම් කාලය අඩු කිරීම.

#### සංවර්ධන ක්‍රියාවලීන්

- සමාගමට අයත් විදුලි ජාලය ස්මාර්ට් ජාලයක් බවට පත් කිරීමට සැලසුම් කර ඇත. ස්මාර්ට් විදුලි මණු, ජාල නිරීක්ෂණ උපකරණ සහ ස්වයංක්‍රීය ස්විච් ඒකාබද්ධ කිරීම සඳහා ස්මාර්ට් ජාලක වේදිකාව සවිකර ක්‍රියාත්මක කෙරේ.
- ස්මාර්ට් විදුලි මණු, ජාල අධීක්ෂණ උපකරණ සහ ස්වයංක්‍රීය ස්විච් වැනි ස්මාර්ට් උපාංග සවි කිරීම සිදු වෙමින් පවතී.
- සමාගමේ අභ්‍යන්තර කටයුතු ස්වයංක්‍රිය වන අතර කඩදාසි රහිත කාර්යාල සංකල්පය වෙත ගමන් කරයි. සියලුම පාරිභෝගික සේවා අන්තර්ජාලය පදනම් කරගත් යෙදුම් සඳහා විවෘතය. පාරිභෝගිකයෙකුට බිල්පත් විද්‍යුත් තැපෑලෙන් ලබාගෙන අන්තර්ජාලය හරහා ගෙවිය හැකි ඊ-බිලින් ක්‍රමය හඳුන්වා දෙනු ලැබේ.
- විදුලි ජාල පාලනය ස්වයංක්‍රීය කිරීම සඳහා උසස් බෙදා හැරීමේ කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දෙනු ලැබේ.

- භූගෝලීය තොරතුරු පද්ධති වේදිකාව සවිකර ඇති අතර සියලුම ජාල වත්කම් මෙම වේදිකාවට ලබා ගැනේ. සියළුම සේවා වාහන ද මෙම වේදිකාවට අත්පත් කරගෙන ඇති හෙයින් සියළු මෙහෙයුම් කළමනාකරණයට සහ හැකිතාක් දුරට ගනුදෙනුකරුවන්ට විනිවිදභාවයින් යුක්තව පවතී.
- හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ආයෝජන ව්‍යාපෘතිය යටතේ ආසියානු සංවර්ධන බැංකුව මඟින් අරමුදල් සපයන මයික්‍රෝ ග්‍රිඩ් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇති අතර 2021 වසර අවසන් වන විට එය නිම කිරීමට අපේක්ෂා කෙරේ. දැනට 70% ක සමස්ත භෞතික ප්‍රගතියක් සාක්ෂාත් කරගෙන ඇත.
- නුගේගොඩ නියමු භූගත කේබල් කිරීමේ ව්‍යාපෘතිය සැලසුම් කර, ඉදි කර නිම කර ඇති අතර මෙය නුගේගොඩ නගර මධ්‍යයේ මතුපිට පැවති මධ්‍යම වෝල්ටීයතා ජාලය භූගත ජාලයක් බවට පත් කර ඇත.
- ලෙකෝ සැපයුම් විශ්වසනීයත්වය සහ ප්‍රභව ධාරිතාව ඉහළ නැංවීම සඳහා බෙදා හැරීමේ පද්ධති විශ්වාසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. ලෙකෝ හි බෙදා හැරීමේ වෝල්ටීයතාවයක් ලෙස 33kV හඳුන්වා දීම මෙමඟින් බලාපොරොත්තු වන අතර විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා ලෙකෝ විදුලි ජාල ප්‍රභවයට සෘජුව 132/33 kV ජාලක උපපොළවල් හඳුන්වා දෙනු ඇත.
- නාරාහේන්පිට යෝජිත ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව ලබාදෙමින් පවතින අතර, මෙම වසරේ අවසන් කාර්තුවේදී ඉදිකිරීම් ආරම්භ කිරීමට කළමනාකරණය බලාපොරොත්තු වේ.
- මුදල් සහ චෙක්පත් ලබා ගන්නා කියෝස්ක් යන්ත්‍ර සමඟ ස්වයං ගෙවීම් මධ්‍යස්ථාන හඳුන්වා දීමෙන් පැය 24 පුරා ගෙවීම් එකතු කිරීමේ පහසුකම සක්‍රිය කර ඇත.
- සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා AMI සහ ස්මාර්ට් මීටර ආශ්‍රිත නිෂ්පාදන හා සේවාවන් පහසු කිරීම සඳහා 2021 සැප්තැම්බර් මස අවසානයේදී ස්මාර්ට් මීටර දත්ත කළමනාකරණ මධ්‍යස්ථානය ආරම්භ කෙරේ.

## 3 මූල්‍ය තත්වය

2021 ජූනි 30 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා ලාභා හෝ අලාභ ප්‍රකාශය පහත දැක්වේ.

| අවසන් කාල පරිච්ඡේදයට | අයවැයගත 2021 රු. '000 | 2021- ජූනි 30 දිනට(කෙටුම්පත) රු. '000 | 2021 - දෙසැම්බර් 31 දිනට (තත්‍ය+ පුරෝකථනය) රු. '000 | 2020 - දෙසැම්බර් 31 දිනට (විගණනය කරන ලද) රු. '000 |
|---|---|---|---|---|
| ආදායම් | 38,780,814 | 16,052,467 | 32,104,935 | 30,709,215 |
| විකුණුම් පිරිවැය | (29,218,885) | (11,769,602) | (25,039,204) | 24,596,359) |
| **දළ ලාභය** | 9,561,929 | 4,282,865 | 7,065,731 | 6,112,855 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 1,785,864 | 1,627,816 | 1,891,996 | 922,496 |
| මෙහෙයුම් වියදමම් | (2,943,532) | (1,221,368) | (2,685,035) | (2,575,292) |
| පරිපාලන වියදම් | (3,815,422) | (1,342,814) | ( 3,188,675) | (2,875,719) |
| මෙහෙයුම් ලාභය | 4,588,840 | 3,346,500 | 3,084,017 | 1,584,341 |
| මූල්‍ය ආදායම් | 665,404 | 238,612 | 477,224 | 867,193 |
| මූල්‍ය වියදම් | (87,155) | (10,337) | (60,674) | 142,541) |
| **බදු පෙර ලාභය** | 5,167,089 | 3,574,776 | 3,500,567 | 2,308,993 |
| ආදායම් බදු වියදම් | (1,446,785) | (1,000,937) | (980,159) | (626,655) |
| **වර්ෂයේ ලාභය** | 3,720,304 | 2,573,838 | 2,520,408 | 1,682,338 |

2021 ජූනි 30 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය පහත පරිදි වේ.

| රු.'000 | ජූනි 2021 | දෙසැම්බර් 2020 |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපල, පිරියත සහ උපකරණ | 3,788,611 | 13,675,416 |
| මූල්‍ය වත්කම් | 10,838,875 | 10,838,875 |
| අනෙකුත් වත්කම් | 2,056,120 | 2,152,456 |
| **මුළු ජංගම නොවන වත්කම්** | 26,683,606 | 26,666,747 |
| **ජංගම වත්කම්** | | |
| තොග | 2,719,917 | 2,804,761 |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ | 11,548,692 | 8,262,660 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 8,488,288 | 9,178,713 |
| මුදල් හා බැංකු ශේෂය | 923,600 | 431,801 |
| **මුළු ජංගම වත්කම්** | 23,680,497 | 20,677,935 |
| **මුළු වත්කම්** | 50,364,103 | 47,344,683 |
| **ස්කන්ධය සහ බැරකම්** | | |
| **ස්කන්ධය** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 1,145,067 | 1,145,067 |
| සංචිත සහ රඳවා ගත් ඉපයුම් | 36,061,923 | 33,537,300 |
| **මුළු ස්කන්ධය** | 37,206,990 | 34,682,367 |
| **ජංගම නොවන බැරකම්** | | |
| පොළී සහිත ණය ගැනීම් | 94,393 | 94,393 |
| විලම්බිත බැරකම් | 6,089,978 | 5,995,803 |
| පශ්චාත් රැකියා ප්‍රතිලාභ වගකීම් | 1,487,149 | 1,478,148 |
| | 7,671,520 | 7,568,344 |
| **ජංගම බැරකම්** | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දේ | 4,276,225 | 4,624,583 |
| අනෙකුත් ජංගම බැරකම් | 1,209,367 | 469,390 |
| **මුළු ජංගම බැරකම්** | 5,485,592 | 5,093,972 |
| **මුළු බැරකම්** | 13,157,113 | 12,662,316 |
| **මුළු ස්කන්ධය සහ බැරකම්** | 50,364,103 | 47,344,683 |

### 4. මුහුණ දුන් අභියෝග සහ එවැනි අභියෝග වලට මුහුණදීම සඳහා ගෙන ඇති උපාය මාර්ගයන්.

- පවතින වසංගත තත්ත්වය හේතුවෙන් අයවැය මඟින් ඉදිරිපත් කළ විකුණුම් පුරෝකථනයට සාපේක්ෂව සත්‍ය අලෙවිය පහත වැටී තිබුණි. කෙසේ වුවද, සමාගමට දැනට පවතින පොදු වියදම් කාර්ය වියදම් පාලනය කිරීමට හැකි වී ඇත.
- වසංගත කාල සීමාව තුළ සමාගමේ වෙළඳ ණයගැති තත්ත්වය ක්‍රමයෙන් ඉහළ ගොස් ඇත. පවතින වසංගත තත්ත්වය හේතුවෙන් බොහෝ ව්‍යාපාරික කටයුතු අඩාල වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස රජය විසින් විදුලි පාරිභෝගිකයින්ට සහන ලබා දුන්නේය. ලෙකෝ පාරිභෝගිකයින්ගේ විදුලි සැපයීම විසන්ධි නොකිරීම හේතුවෙන් වෙළෙඳ ණයගැතියන් වැඩී වී ඇත.

- 2020 අප්‍රේල් සිට ගනුදෙනුකරුවන්ට සහන ලබා දී ඇත. මේ හේතුවෙන් පසුගිය වසර කිහිපය හා සැසඳීමේදී සමාගමේ සමස්ත වෙළඳ ලැබිය යුතු ශේෂය සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. වර්තමාන තත්වයෙන් පීඩාවට පත් වූ එක් එක් පාරිභෝගිකයින්ගේ හා තෝරාගත් පාරිභෝගිකයින්ගේ පවත්නා හිඟහිටි ශේෂ පිළිබඳව පරීක්‍ෂා කිරීමට ලෙකෝ පියවර ගෙන ඇති අතර බිල්පත් පියවීමේ වාරික පදනමක් පිළියෙල කර හඳුන්වා දීම තුළින් ව්‍යාපාරවලට බල නොපාන පරිදි හිඟහිටි විදුලි බිල්පත් පියවා ගත හැකි වේ. මෙම ගනුදෙනුකරුවන් සඳහා විසන්ධි කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට කළමනාකරණය විසින් කටයුතු සම්පාදනය කරනු ලබන අතර මෙය එක් එක් සිද්ධිය අනුව විසන්ධි කිරීමේ ක්‍රියාවලියක් වනු ඇත.
- මණු කියවීම් ලබා ගැනීම් සහ බිල්පත් ගාස්තු අය කිරීම් කෙරෙහි වසංගත තත්ත්වය බරපතල ලෙස බලපා ඇත.

## 5. 2022 වර්ෂය සඳහා වැඩ සටහන් සහ ව්‍යාපෘති

- කාර්යක්ෂමතාව සහ පාරිභෝගික සේවා ඉහළ නැංවීමේදී ස්මාර්ට් ජාලක විසඳුම ක්‍රියාත්මක කිරීමේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු අඛණ්ඩව සිදු කෙරේ.
- අභ්‍යන්තර කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ව්‍යාපාර ක්‍රියාවලිය හා ප්‍රත්‍ය ඉංජිනේරු ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කෙරේ.
- ඉහළ පාලන හැකියාව සහ විනිවිදභාවය තුළින් ව්‍යාපාර සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීම සඳහා වන ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණ කාර්යයන් අඛණ්ඩව සිදු කෙරේ.
- විදුලි බල පද්ධතියේ විශ්වසනීයත්වය බල ගැන්වීමේ ව්‍යාපෘතිය ලබන වසර මුලදී ආරම්භ කෙරේ. මෙම ව්‍යාපෘතියට ප්‍රධාන වශයෙන් මුදල් සපයනු ලබන්නේ ආසියානු සංවර්ධන බැංකුව විසිනි. අපේක්ෂිත පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 50 ක් පමණ වන අතර ව්‍යාපෘතිය 2026 වසර වන විට අවසන් කිරීමට අපේක්ෂිතය.
- ප්‍රධාන කාර්යාලයේ ඉදි කිරීමේ ව්‍යාපෘති කටයුතු අඛණ්ඩව සිදු කරන බැවින් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල 2024 වන විට වාසය කිරීමට සූදානම් වනු ඇත.

# සී/ස. එල්ටීඑල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම

## හැඳින්වීම:

1980 වර්ෂයේ ස්ථාපනය කරන ලද එල්ටීඑල් හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම වර්තමානයේදී සිය ලියාපදිංචි කාර්යාලය කොළඹ 02, පාර්ක් වීදියේ අංක 67 දරන ස්ථානයෙහි පවත්වාගෙන යනු ලබන අතර සිව් දශකයකට අධික ස්වකීය ගමන්මඟ තුළ ශ්‍රී ලංකාව මෙන් ම විදේශීය රටවල ද ඉංජිනේරු ක්ෂේත්‍රය තුළ ස්වකීය විශිෂ්ටත්වය ඔස්සේ ස්වකීය අභිමතාර්ථ රැසක් සඵල කරගනිමින් විදුලිබල ක්ෂේත්‍රයෙහි ප්‍රමුඛස්ථානයට පත්ව තිබේ. මේ අනුව මෙම ආයතනය මෙරට මෙන් ම විදේශයන්හි ද පිළිගත් ප්‍රමුඛ පෙළේ විදුලිබල ක්ෂේත්‍රයේ ඉංජිනේරු ආයතනයක් බවට පත්ව තිබේ. මෙම සමාගම

මේ දක්වා සාර්ථක ලෙස ව්‍යාපාරික කටයුතුවල නියැළෙමින් විදුලිබල උත්පාදනය, විදුලි යටිතල පහසුකම් සංවර්ධනය, විදුලිබලය බෙදාහැරීමේ පරිණාමක නිෂ්පාදනය කිරීම සහ ලෝහ සින්ක් තුළ ගිල්වීමෙන් ගැල්වනයිස්කිරීම (Hot Dip Galvanizing) සහ ශ්‍රී ලංකාවේ මෙන්ම විදෙස් රටවල විදුලිබල ක්ෂේත්‍රයේ වෙනත් විවිධ අවශ්‍යතා සපුරාලීම මඟින් විවිධ අංශ ඔස්සේ විවිධාංගීකරණයට බඳුන් වී තිබේ. විදුලිබල ක්ෂේත්‍රයේ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳව අපමණ පළපුරුද්ද සහ දැනුම තුළින් පන්නරය ලද මෙන් ම සුදුසුකම්/ පළපුරුද්දෙන් හෙබි ඉංජිනේරු වෘත්තිකයන් සහ තාක්ෂණික කාර්ය මණ්ඩලයෙන් සමන්විත මෙම සමාගම ශ්‍රී ලංකාව තුළ ඉටුකරන කාර්යයන්ට අමතරව ජාත්‍යන්තර විදුලිබල වෙළඳපොල තුළට නොබියව පිවිස ඉංජිනේරු, ප්‍රසම්පාදන සහ ඉදිකිරීම් කාර්යයන් සාර්ථක ලෙස ඉටු කරනු ලැබේ.

වර්තමානයේදී එල්ටීඑල් හෝල්ඩිංස් සමාගම ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 300 ක දායකත්වයක් සපයනු ලබන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශාලතම ස්වාධීන විදුලිබල නිෂ්පාදකයා වේ. එල්ටීඑල් හෝල්ඩිංස් සතුව සම්ප්‍රේෂණ කුළුණු සහ අනෙකුත් කර්මාන්ත සඳහා තාප ගිල්වුම් ගැල්වනයිසින්කිරීම කළ හැකි සම්පූර්ණයෙන් ස්වයංක්‍රීය ගැල්වනයිසිං බලාගාරයක් පවතින අතර උසස් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව පැයකට මෙට්‍රික් ටොන් 6.2 ක නිෂ්පාදනයක් ලබාගැනීමේ හැකියාව පවතියි.

ලක්දනවි සමාගම එල්ටීඑල් (පෞද්ගලික සමාගමෙහි) පරිපාලිත අයතනයක් වන අතර මෙම වසර ආරම්භයේ දී මෙගාවොට් 350 ද්‍රවීකෘත ස්වභාවික වායු / ඩීසල් බලාගාර ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලද අතර එමඟින් 2024 වර්ෂයේ මුල්භාගයේ හෝ වසංගත තත්ත්වයෙන් පසු රට සාමාන්‍ය තත්ත්වයට පත්වුවහොත් ඊට පෙර ජාතික විදුලි පද්ධතියට එක්කිරීමට නියමිතය.

අප ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ඇතුළු අපගේ කණ්ඩායම මනා පුහුණුවකින් යුතු, ශික්ෂිත මෙන් ම කැපවීම සහිත කණ්ඩායමක් වන අතර ඔවුන්ගේ ස්ථිරභාවය, පරිශ්‍රමය හා ශක්තිය හා සබැඳි අපගේ සම්පත් උපරිම වශයෙන් උපයෝජනය කර ගනිමින් නව්‍යකරණයෙහි සහ උසස් තාක්ෂණය අඛණ්ඩ භාවිතයෙහි නියැළෙමින් දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් ආයතනික ඉලක්ක මනා ලෙස සාක්ෂාත් කරගනිමින් එල්ටීඑල් සමූහයෙහි මීළඟ ඉදිරි පියවර තැබීමට උත්සුක වී තිබේ.

අප සමාගමෙහි සුවිශේෂී කාර්යසාධනය හේතුවෙන් ආසියානු කලාපයේ විශිෂ්ටතම ස්වාධීන බලශක්ති නිෂ්පාදක සඳහා වන ස්වර්ණ සම්මානය ඇතුළත්ව පහත ආකාරයේ විවිධ ඉංජිනේරු විශිෂ්ටතා සම්මාන රැසක් හිමිකරගැනීමට සමත් විය.

- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිරිනමන ලද 2015 ඉංජිනේරු විශිෂ්ටතා සම්මානය 2015 වර්ෂයේ දී ජයග්‍රහණය කිරීම.
- දකුණු කොරියාවේ පැවති 2016 ආසියානු බලශක්ති සම්මාන ප්‍රදානයේදී විශිෂ්ට කාර්යසාධනය සම්බන්ධයෙන් වූ සම්මානය දිනාගැනීම.
- ලක්දනවි සමාගම නියමිත පරිදි ණය ගෙවීි හේතුවෙන් ණය ලබාගැනීම සඳහා වන සුදුසුකම සම්බන්ධයෙන් Fitch Rating Agency විසින් ප්‍රසිද්ධියේ දක්වා ඇති අතර එය AA"(lka) වශයෙන් ශ්‍රේණිගත කර ඇති අතර එය දෙවැනි වන්නේ AAA ණය ශ්‍රේණිගත කිරීමට පමණි.








**ලාභාංශ ගෙවීම්:**

එල්ටීඑල් හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම විසින් 1980 වර්ෂයේ සිට පසුගිය සිව් දශකය තුළ මෙහෙයුම් කටයුතු සිදුකිරීමේදී රුපියල් බිලියන 16 කට අධික සමුච්චිත ලාභාංශ ගෙවීමක් සිදුකරමින් ලංවිම මූල්‍ය ප්‍රවාහයට සුවිශාල දායකත්වයක් ලබා දී තිබේ. එමෙන්ම සමාගම විසින් ස්වකීය සාර්ථකත්වය ඉහළ නංවාගෙන රුපියල් බිලියන 33 කට අධික සාමූහික ශුද්ධ වත්කම් වාර්තා කරගෙන තිබේ. සමාගමෙහි සේවකයන් කොටස්කරුවන් බවට පත්කිරීමට සමාගම විසින් 2001 වර්ෂයේදී ගනු ලැබූ තීරණය ප්‍රකාරව 2005 වර්ෂයේදී විදේශීය ආයෝජකයන් විසින හිමිකරගෙන තිබූ කොටස් මිලදී ගැනීම උදෙසා සමාගම සතු සම්පත් උපරිම වශයෙන් උපයෝජනය කරගැනීමෙන් සමාගම සතු ලාභ

තවදුරටත් වර්ධනය විය.

මෙගාවොට් 350 ද්‍රවීකෘත ස්වභාවික වායු බලාගාරයක් ඉදිකිරීම සඳහා 2016 වර්ෂයේදී ලංවිම විසින් කැඳවන ලද ටෙන්ඩරය සඳහා සමාගමේ පූර්ණ පරිපාලිත සමාගමක් සහ බලාගාර මෙහෙයුම් අංශය වන ලක්දනවි සමාගම ලංසු ඉදිරිපත් කරන ලදී. ලක්දනවි සමාගම විසින් ඉදිරිපත් කරන ලද ලංසුව අවම මිල ගණන් සහිත ලංසුව වශයෙන් සලකා එය 2021 වර්ෂයේ දී ප්‍රදානය කරන ලද අතර එමඟින් රජය සහ ලංවිම වෙත පිළිවෙළින් පහත සඳහන් ප්‍රතිලාභ අත්වනු ඇත.

1. යන්ත්‍රෝපකරණ හැර අනෙකුත් සියලුම ප්‍රසම්පාදනයන් රට තුළ පවතින සම්පත් වලට පමණක් සීමා වන අතර අරමුදල් විදේශ රටවලට ප්‍රවාහය වීම සැලකියයුතු ප්‍රමාණයකින් අඩු කළ හැකිය.
2. ලක්දනවි සමාගම විසින් ස්වකීය පළපුරුදු ඉංජිනේරුවරුන්, පුහුණු ශ්‍රමිකයන් සහ අනෙකුත් කාර්යමණ්ඩලයෙන් සමන්විත කණ්ඩායම ව්‍යාපෘතිය ක්‍රියාත්මකකිරීම සඳහා උපයෝගී කරගනු ලැබේ. මේ හේතුවෙන් ද රටෙහි පුහුණු ශ්‍රමය විදේශ රටවලට ප්‍රවාහය වීම පහළ යයි.
3. විශ්වවිද්‍යාල වලින් පිටවන තරුණ ඉංජිනේරුවන්ට රටෙහි පවතින විරැකියා ගැටළුව විසඳාගැනීම සඳහා අතීතයේ සිට මේ දක්වාම මෙම ආයතනය රැකියා අවස්ථා සපයනු ලබයි.
4. එල්ටීඑල් හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම විසින් උපයනු ලබන ලාභාංශ මඟින් ලංවිම වෙත ප්‍රතිලාභ සැලසේ.

**විදේශීය ව්‍යාපෘති:**

විදේශයන්හි ජල සහ තාප බලාගාර මෙහෙයුම් සඳහා වන ටෙන්ඩර් ලබාගැනීම සම්බන්ධයෙන් මෙම සමාගම සාර්ථක ප්‍රතිඵල අත්කරගනු ලැබුවද ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් පනවන ලද සීමාවන් හේතුවෙන් විශේෂයෙන් ම බංගලාදේශය සහ නේපාලය යන රටවල ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතියට යම්තාක් දුරකට බාධා එල්ල වී තිබේ.

අප සමාගම විසින් මීට වසර පහකට ප්‍රථම අත්කර ගන්නා ලද ඉන්දියානු ස්විච් ගියර් නිෂ්පාදන සමාගමක් වන ඒසියාටික් ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් ස්විච්ගියර් සමාගම (Asiatic Electrical & Switchgear Company (PTE) Ltd) මෙම සමාගම විසින් පත්කරනු ලැබූ පළපුරුදු ප්‍රධාන විධායක නිලධාරියෙකුගේ පාලනය යටතේ කාර්යසාධනය ඉහළ නංවා ගන්නා ලදී. ඒසියාටික් ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් ස්විච්ගියර් සමාගම විසින් අප සමාගමෙහි විදුලිබල ක්ෂේත්‍රයෙහි සංවර්ධන කාර්යයන් සඳහා වන ඉල්ලුම අඛණ්ඩව සපුරාලනු ලබන බැවින් එම සමාගම අත්කරගැනීම අප සමාගම ලද විශාල වාසියකි.

**විදේශීය පරිපාලිත ආයතන වෙතින් ලද ලාභාංශ :**

සමාගමේ 2021/21 මූල්‍ය වර්ෂයේ කාර්යසාධනය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේදී පරිපාලිත ආයතන සාර්ථක ලෙස මෙහෙයවීම මඟින් සමාගමට ඇ.ඩො. 4,489,258 ක ලාභාංශ ආදායමක් උපයාගත හැකි විය. එය පහත සඳහන් පරිදි වර්ග කළ හැකිය:

| | | |
|---|---|---|
| 1. | ලක්දනවි බංග්ලා පවර් ලිමිටඩ්, බංග්ලාදේශ් | .. ඇඩො. 897,190 |
| 2. | ෆෙනි ලංකා පවර් ලිමිටඩ්, බංග්ලාදේශ් | .. ඇ.ඩො. 3,592,068 |
| | මුළු මුදල | **ඇ.ඩො. 4,489,258** |

මෙරට මෙන් ම විදේශයන්හි පවතින සියලුම බලශක්ති විභවතා උපයෝගී කරගැනීම සඳහා එල්ටීඑල් සමාගම විසින් විවිධ පරිපාලිත සමාගම් යටතේ ක්‍රියාත්මක කරනු ලබන සෑම ව්‍යාපාරයක් ම විධිමත්ව කළමනාකරණය කිරීම සඳහා ස්වකීය ව්‍යාපාරය විවිධාංගීකරණය කිරීම සිදු කරනු ලැබේ.

**2021 වර්ෂය සඳහා (ජනවාරි සිට අගෝස්තු දක්වා) කාර්යසාධනය සහ 2022 වර්ෂය සඳහා වැඩසටහන්**

2021 වර්ෂයේ ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා මූල්‍ය අංශයේ සුවිශේෂීතා ඇතුළත්ව එල්ටීඑල් හෝල්ඩිංස් සමාගම් සමූහයේ කාර්යසාධනය

පූර්ව වර්ෂයට සාපේක්ෂව පවත්නා වර්ෂයේ මූල්‍ය කාර්යසාධන සහ ප්‍රධාන මෙහෙයුම් සාරාංශය පහත පරිදි වගුගතකර තිබේ :-

| කාලසීමාව | 2021 මූල්‍ය වර්ෂය ජනවාරි/ අගෝස්තු | 2020 මූල්‍ය වර්ෂය ජනවාරි/ අගෝස්තු | 2019 මූල්‍ය වර්ෂය ජනවාරි/ අගෝස්තු |
|---|---|---|---|
| පිරිවැටුම | (රුපියල් මිලියන) | (රුපියල් මිලියන) | (රුපියල් මිලියන) |
| විවිධ සේවා නිෂ්පාදන | 6,994 | 6,397 | 5,947 |
| බලශක්ති උත්පාදනය | 11,213 | 6,861 | 6,439 |
| ඉදිකිරීම් සේවා | - | - | 294 |
| **මුළු ප්‍රමාණය** | **18,207** | **13,259** | **12,680** |
| දළ ලාභය | | | |
| විවිධ සේවා නිෂ්පාදනය | 3,290 | 3,134 | 2,679 |
| බලශක්ති උත්පාදනය | 3,056 | 3,119 | 1,835 |
| ඉදිකිරීම් සේවා | - | - | 76 |
| මුළු සංඛ්‍යාව | **6,346** | **6,253** | **4,591** |

සමාලෝචිත මාස අටක කාලය සඳහා (2021 ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා) වාර්තා වූ සමාගමේ සමස්ත ඒකාබද්ධ පිරිවැටුම සහ දළ ලාභය පසුගිය වර්ෂයේ එම කාල සීමාවට සාපේක්ෂව පිළිවෙළින් 37.31% සහ 01.49% වශයෙන් වර්ධනය වී තිබේ.

පසුගිය වර්ෂයේ "බල ශක්ති උත්පාදනයෙහි" සමඟ සසඳන විට 63.4% ක සුවිශේෂී වර්ධනයක් වාර්තා වේ. කෙසේනමුත් පසුගිය වර්ෂයේ අදාළ කාලසීමාව තුළ 02.02% ක අඩුවීමක් පෙන්නුම් කරයි.

## 1.0 බලාගාර ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

### 1.1 කෙරවලපිටිය යුගදනවි බලාගාරය





| ස්ථාපිත බලාගාරය | යුගදනවි බලාගාරය, කෙරවලපිටිය, ශ්‍රී ලංකාව |
|---|---|
| බලාගාරයේ මුළු ධාරිතාව | මෙගාවොට් 300 |
| GT/ST සැපයුම්කරු | GE ප්‍රංශය / ඇ.එ.ජ |
| එන්ජින් වර්ගය | GT – Frame 9E, ST SC5 |
| ප්‍රත්‍යාවර්තක වර්ගය | GE 9A5 |
| ආකෘතිය | 2:2:1 |
| යන්ත්‍ර නිමැවුම | එක් යන්ත්‍රයකින් මෙගාවොට් 100 බැගින් |
| යන්ත්‍ර සංඛ්‍යාව | 2 GTs & 1 ST |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | 2010 මැයි මස සිට වසර 25 ක් |

2021 වර්ෂයේ වාර්ෂික බලශක්ති අලෙවිය 2021 ජනවාරි මස 01 වන දින සිට අගෝස්තු 31 වන දින දක්වා ගිගාවොට් පැය 733.38 වූ අතර ළඟාකරගන්නා ලද උපයෝජ්‍යතාව 89.82 % කි. 2021 මැයි මස 10 සිට 2022 මැයි මැයි මස 09 දක්වා වාර්ෂික උපයෝජ්‍යතා ඉලක්කය 68% ක් වශයෙන් ප්‍රකාශයට පත්කර තිබේ.

එල්ටීඑල් සමාගමේ උපපාලිත සමාගමක් වන ලක්දනවි සමාගම මෙගාවොට් 300 ක සංයුක්ත චක්‍රීය බලාගාරයක් වන යුගදනවි සමාගමේ ක්‍රියාත්මක කිරීමේ හා නඩත්තු කිරීමේ කොන්ත්‍රාත්කරු වශයෙන් ඉදිකිරීම් අවධියේදී විශාල දෝශාරෝපණයකට ලක්වීම සාර්ථක ලෙස මැඩපවත්වමින් ඓතිහාසික ජයග්‍රහණයක් වශයෙන් පසුගිය වසර 13 ක කාලය තුළ බැර ඉන්ධන භාවිතා කරමින් මෙම බලාගාරය ක්‍රියාත්මක කරන ලදී. බැර ඉන්ධන භාවිතයෙන් ක්‍රියාත්මක වන පරමාදර්ශී බලාගාරයක් බවට පාත්‍ර වෙමින් ලොව ප්‍රධාන පෙළේ මූලික උපකරණ නිෂ්පාදක වශයෙන් යුගදනවි බලාගාරය ස්වකීය ශක්‍යතාව පෙන්නුම්කර තිබේ.

**1.2.** රාජ් ලංකා විදුලි බලාගාරය, නටෝර්, බංගලාදේශය (RLPP)

| ස්ථාපිත බලාගාරය | රාජ් ලංකා විදුලි බලාගාරය, නටෝර්, බංගලාදේශය |
|---|---|
| බලාගාරයේ මුළු ධාරිතාව | මෙගාවොට් 52.2 |
| එන්ජින් සැපයුම්කරු | වාර්ට්සිලා පින්ලන්තය |
| එන්ජින් වර්ගය | W20V32 |
| යන්ත්‍ර නිමැවුම | මෙගාවොට් 8.9 |
| යන්ත්‍ර සංඛ්‍යාව | 6 |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | 2014 ජනවාරි මස සිට වර්ෂ 15 ක් |



2021 වර්ෂයේ අගෝස්තු මස 31 දක්වා රාජ් ලංකා විදුලි බලාගාරයේ වාර්ෂික විදුලිබල අලෙවිය ගිගා වොට් පැය 147.407 ක් වූ අතර එය බලශක්ති උපයෝජ්‍යතාවයෙන් 93.31% ක් සපුරාලීමකි. 2021 වර්ෂය සඳහා වාර්ෂික විදුලිබල උපයෝජ්‍යතා ඉලක්කය 95% ට වඩා ඉහළින් පදනම් වී ඇත. මෙම තාප බලාගාරය ශ්‍රී ලංකාවෙන් බැහැරව ස්ථාපිත ශ්‍රී ලංකාවට අයත් ප්‍රථම බලාගාරයයි.

**1.3** ලක්ධනවි බංග්ලා විදුලි බලාගාරය, කොමිලා, බංගලාදේශය

| ස්ථාපිත බලාගාරය | ලක්දනවි බංග්ලා විදුලි බලාගාරය, කොමිලා, බංගලාදේශය |
|---|---|
| බලාගාරයේ මුළු ධාරිතාව | මෙගාවොට් 52.2 |
| එන්ජින් සැපයුම්කරු | වාර්ට්සිලා පින්ලන්තය |
| එන්ජින් වර්ගය | W20V32 |
| යන්ත්‍ර නිමැවුම | මෙගාවොට් 8.9 |
| යන්ත්‍ර සංඛ්‍යාව | 6 |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | 2014 දෙසැම්බර් මාසයේ සිට වසර 15 ක් |



2021 වර්ෂය සඳහා LBPP හි වාර්ෂික බලශක්ති අලෙවිය 2021 අගෝස්තු 31 දක්වා ගිගාවොට් පැය 119.18 ක් වන අතර ළඟා වූ උපයෝජ්‍යතාව 90.55% කි. 2021 වර්ෂය සඳහා වාර්ෂික උපයෝජ්‍යතා ඉලක්කය 90% ට වඩා ඉහළින් පදනම් වී තිබේ.

**1.4** ෆෙනි ලංකා විදුලි බලාගාරය, ෆෙනි, බංගලාදේශය

| ස්ථාපිත බලාගාරය | ෆෙනි ලංකා විදුලිබලාගාරය, |
|---|---|
| බලාගාරයේ මුළු ධාරිතාව | මෙගාවොට් 114 |
| එන්ජින් සැපයුම්කරු | වාර්ට්සිලා පින්ලන්තය |
| එන්ජින් වර්ගය | 18V50 හයක් සහ W20V32 එකක් |
| යන්ත්‍ර නිමැවුම | 18.415*6 + මෙගාවොට් 9.78*1 |
| යන්ත්‍ර සංඛ්‍යාව | 7 |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | 2019 නොවැම්බර් මාසයේ සිට වසර 15 ක් |



2021 වර්ෂයේ අගෝස්තු 31 දක්වා වාර්ෂික බලශක්ති අලෙවිය ගිගාවොට් පැය 173.74050 ක් වන අතර ළඟකරගත් උපයෝජ්‍යතාව 91.51 % කි. 2021 වර්ෂය සඳහා වාර්ෂික උපයෝජ්‍යතා ඉලක්කය 92%. ට වඩා ඉහළින් පදනම් වී තිබේ.

**1.5** පවන්දනවි සුළං බලාගාරය, නොරොච්චෝලෙ

| ස්ථාපිත බලාගාරය | පවන්දනවි සුළං බලාගාරය, ඉලන්තඩිය, නොරොච්චෝලෙ |
|---|---|
| බලාගාරයේ මුළු ධාරිතාව | මෙගා වොට් 9.8 |
| ටර්බයිම සැපයුම්කරු | ගමේසා |
| ටර්බයිම වර්ගය | G58 |
| ටර්බයිම නිමැවුම | කිලෝවොට් 850 |
| ටර්බයිම සංඛයාව | 12 |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | 2012 සැප්තැම්බර් මාසයේ සිට වසර 20 ක් |



2021 අගෝස්තු මස 31 දක්වා වාර්ෂික බලශක්ති අලෙවිය ගිගාවොට් පැය 6.10 ක් වන අතර ළඟාකරගත් බලාගාර සාධකය 10.4% කි. 2021 වර්ෂය සඳහා වාර්ෂික උපයෝජ්‍යතා ඉලක්කය පදනම් වී ඇත්තේ 9.68 % ක් වශයෙනි. 2020 ජූලි මාසයේ ලංවිම සුළං රක්ෂිරීමේ උපපොළෙහි ප්‍රධාන පරිණාමකය නිසික්‍රියාකාරීත්වයෙන් තොරවීම හේතුවෙන් මෙම බලාගාරයේ ක්‍රියාකාරීත්වයට දැඩි බලපෑම් එල්ල වූ අතර එය පිළිසකර කිරීම සඳහා වසරක පමණ කාලයක් ගතවිය.

## 2.0 බෙලිහුල්ඔය කුඩා ජල විදුලි බලාගාරය

### 2.1 බෙලිහුල්ඔය – නිව්ද කුඩා ජල විදුලි බලාගාරය

| ස්ථාපිත බලාගාරය | ෙබෙලිහුල්ඔය නිව්ද කුඩා ජල විදුලිබලාගාරය |
|---|---|
| බලාගාරයේ මුළු ධාරිතාව | මෙගාවොට් 2.2 |
| ටර්බයිම සැපයුම්කරු | Wasserkraft Volk AG, ජර්මනිය |
| වර්බයිම වර්ගය | Horizontal Turbo Impulse |
| ටර්බයිම නිමැවුම | මෙගාවොට් 1.1 |
| ටර්බයිම සංඛ්‍යාව | 2 |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | 2003 මැයි මස සිට වසර 20 ක් |



2021 වර්ෂයේ අගෝස්තු මස 31 දක්වා වාර්ෂික බලශක්ති අලෙවිය ගිගාවොට් පැය 6.1ක් වන අතර බලාගාර සාධකය 45% කි. 2021 වර්ෂය සඳහා වාර්ෂික උපයෝජ්‍යතා ඉලක්කය 100% වශයෙන් පදනම් වී තිබේ.

### 2.2 අසුපිනිඇල්ල කුඩා ජලවිදුලි බලාගාරය, අරණායක

| ස්ථාපිත බලාගාරය | අසුපිනිඇල්ල කුඩා ජලවිදුලි බලාගාරය, අරණායක |
|---|---|
| බලාගාරයේ මුළු ධාරිතාව | **මෙගාවොට් 4** |
| ටර්බයිම සැපයුම්කරු | VA Tech Hydro |
| වර්බයිම වර්ගය | Horizontal Pelton |
| ටර්බයිම නිමැවුම | **මෙගාවොට් 2** |
| ටර්බයිම සංඛයාව | 2 |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | **2005 නොවැම්බර් මාසයේ සිට වසර** |



2021 අගෝස්තු 31 දක්වා වාර්ෂික බලශක්ති අලෙවිය ගිගාවොට් පැය 8.00 ක් වන අතර සපුරා ගන්නා ලද බලාගාර සාධකය 35% කි. 2021 වර්ෂය සඳහා වාර්ෂික උපයෝජ්‍යතා ඉලක්කය 95% ක් මත ලදනම් විය.

### 2.3 - මෙගා වොට් 10 ක ධාරිතාවටයන් යුතු මකරිගාඩ් ජල විදුලි (පුද්ගලික) සමාගම , නේපාලය

| ස්ථානය | ජල මූලාශ්‍රය - දුරින් පිහිටි පෙරදිග නේපාලයේ කන්දේශ්වරීහි වර්මෙලියා නදියෙහි සහ ධර්චුලා දිස්ත්‍රික්ක යේ ගුජාර් ගම්මානයේ අතු ගංගාවක් වන මකරි ගාඩ් |
|---|---|
| සමස්ත බලාගාර ධාරිතාව | **මෙගාවොට් 10** |
| බලශක්තිය – අලෙවි කළ හැකි<br>- ගිවිසුම්ගත | **74.1 MU**<br>**69.8 MU** |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | **අත්සන්කර තිබේ** |
| ටර්බයිම නිමැවුම | **WkV-Germany** |
| ටර්බයිම වර්ගය | **Horizontal 2 Jet Pelton** |
| ජල ප්‍රභවය | **වර්ෂය පුරාම වැසි වසීම සහ හිම පතනය** |



ඉහත ව්‍යාපෘතිය එල්ටීඑල් හෝල්ඩිංස් (පුද්ගලික) සමාගමේ පරිපාලිත සමාගමක් වන එල්ටීඑල් එනර්ජි (පුද්ගලික) සමාගම විසින් විසින් ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන අතර එම සමාගමේ කොටස් 55% ක් මකරිගාඩ් හයිඩ්‍රො පවර් ප්ලාන්ට් සමාගම විසින් ලබාගෙන තිබේ.

මේ වන විට ව්‍යාපෘති කාර්යයන්ගෙන් 60% ක් පමණ අවසන් කර ඇති අතර ඉතිරි වැඩ කටයුතු 2022 මැයි මාසය වන විට අවසන් කිරීමට නියමිතය. 2022 මැයි/ ජූනි මාසවලදී පරීක්ෂා කිරීම් හා බලය පැවරීම් 2022 ජූලි මස මැද භාගයේ සිට වාණිජ කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

## 3.0 පරිණාමක නිෂ්පාදනය හා අලෙවි කිරීම



### 3.1 අඟුලාන පරිණාමක යන්ත්‍රාගාරයේ ප්‍රධාන යන්ත්‍රෝපකරණ හා පසහුකම්



**එච්වී එතුම් යන්ත්‍ර 3 (HV Winding Machine -WHCF- TUBOLY) - 3 Nos./ ස්වයංක්‍රීය එතුම් යන්ත්‍ර 3 (Automatic Winding Machines) – 3 Nos.**



කාර්මික පරිගණකයක් මගින් පාලනය වන මෙම ස්වයංක්‍රීය එතුම් යන්ත්‍ර (automatic winding machines) නිෂ්පාදන ධාරිතාව ඉහළ නංවන අතර අමුද්‍රව්‍ය පිරිමැසුම්දායක වශයෙන් භාවිතා කිරීම සහතික කරන අතරම විශාල කොන්ත්‍රාත් නියමිත වේලාවට ක්‍රියාත්මක කිරීමට මහත් ලෙස උපකාරී වේ.

**ජෝර්ජ් හර කැපුම් යන්ත්‍රය (George Core Cutting Machine )– යන්ත්‍ර 1**



මෙය අධිවේගී හා ස්වයංක්‍රීය හරය කැපීමේ මාර්ගයක් වන අතර එමඟින් වටිනා කාලය ඉතිරි කරයි. මෙමඟින් lower No-load losses, No - load Current සහ අඩු ශබ්ද මට්ටම සහිත පරිණාමකවල පියවර වශයෙන් තට්ටු වශයෙන් සකස්කර ඇති පරිණාමක හරයන් (step lap stacked transformer cores) නිවැරදිව කපා ගත හැකිය.

## HV එතුම් යන්ත්‍ර CNC-යන්ත්‍ර 02 /තිරස් එතුම් යන්ත්‍ර - යන්ත්‍ර 02 (HV Winding Machine CNC-2) Nos./Horizontal Winding Machines -2 Nos.



මෙම යන්ත්‍රවලට 5 MVA දක්වා එතීමේ හැකියාව පවතින අතර වඩා හොඳ තත්ත්වයේ නිවැරදි හා නිසි දඟර එමඟින් නිර්මාණය කරගත හැකිය.

## තෙල් පෙරහන් යන්ත්‍රය - ඒකක 01 Oil Filter Machine (Vokes SL 20) - 01 Unit

මෙම යන්ත්‍රය ක්ෂේත්‍රයෙහි අපගේ තෙල් පරිවරණය කිරීමේ පාරවිද්‍යුත් ගුණාංග ඉහළ නැංවීමෙන් බාහිර (ගෘහස්ත නොවන) අළුත්වැඩියා සහ සේවා කටයුතුවල ගුණාත්මකභාවය තහවුරු කිරීමට උපකාරී වේ.





## පරීක්ෂා කිරීමේ අංශය සඳහා එම්ජී කට්ටලය - 1 වන කට්ටලය (MG Set for Testing Department- 1 Set)

පරිණාමක 5 MVA ධාරිතාවයක් දක්වා පරීක්ෂා කිරීමේ හැකියාව සහිත මෙම MG කට්ටලය පරීක්ෂණ දෙපාර්තමේන්තුව වැඩිදියුණු කරන ලදී. පරීක්ෂණ ක්‍රියාවලියේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක අංශ ඉහළ නැංවීමට මෙය උපකාරී වේ.



## ගබඩා ගොඩනැඟිල්ල

ගබඩා ගොඩනැගිල්ල වාර්ෂිකව ඉහළයන නිෂ්පාදන ප්‍රමාණයට පහසුකම් සැලසීම සඳහා ද්‍රව්‍ය ගබඩා කිරීම හා පරිහරණ කටයුතු සඳහා නිසි ලෙස සැලසුම් කළ අවකාශයකි. අලුතින් සකස් කර ඇති රාක්ක සහ ඊආර්පී පද්ධති ගබඩා ක්‍රියාකාරිත්වය කාර්යක්ෂම හා නිවැරදි බවට පත්කරයි.



### වහල මත ඉදිවන (Rooftop) සූර්යබල පද්ධති

මෙම හරිත විදුලිබල ජනන සංකල්පය සම්බන්ධයෙන් වන ප්‍රධාන පියවරකි.

### 3.2 සමාලෝචිත වර්ෂයේ (2020/2021) නිෂ්පාදන පිළිබඳ සමාලෝචනය පහත දැක්වේ:

| | | 2020/21<br>සංඛ්‍යාව | 2019/20<br>සංඛ්‍යාව |
|---|---|---|---|
| අ) | ලංවිම / ලංකා විදුලි පෞද්ගලික සමාගම වෙත සපයන ලද පරිණාමක සංඛ්‍යාව | 1,999 | 2,131 |
| ආ) | වෙනත් දේශීය ගනුදෙනුකරුවන් වෙත සපයන ලද සමාගම වෙත සපයන ලද පරිණාමක සංඛ්‍යාව | 146 | 80 |
| ඇ) | වෙනත් රටවලට අපනයනය කරන ලද සමාගම වෙත සපයන ලද පරිණාමක සංඛ්‍යාව | 124 | 143 |
| | මුළු නිෂ්පාදනය | **2,269** | **2,354** |

**2020/2021 කාලසීමාවේදී අපනයනය සඳහා පරිණාමක නිෂ්පාදනය කරන ලද ව්‍යාපෘති**

| අපනයනය කරනු ලබන රට | උපයෝගීතා අංශය | පරිණාමක සංඛ්‍යාව | මුළු අගය ඇමෙරිකානු ඩොලර් |
|---|---|---|---|
| ඉතියෝපියාව | Ethiopian Electric Power | 40 | මිලියන 0.5 |
| මොසැම්බික් ජනරජය | Electricidade de Moçambique (EDM) | 84 | |
| මුළු සංඛ්‍යාව | | **124** | |

**2021/2022 කාලසීමාව සඳහා සැපයීමට ඇති අපනයන ඇණවුම් සංඛ්‍යාව**

| අපනයනය කරනු ලබන රට | උපයෝගීතා අංශය | පරිණාමක සංඛ්‍යාව | මුළු අගය ඇමෙරිකානු ඩොලර් |
|---|---|---|---|
| මොසැම්බික් ජනරජය | Electricidade de Moçambique (EDM) | 1,234 | **මිලියන 2.8** |

ප්‍රධාන වශයෙන් කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් වරින් වර රට අගුලු දැමීම හේතුවෙන් 2021 වර්ෂයේ ජනවාරි මස සිට අගෝස්තු මාසය දක්වා නිෂ්පාදනය කරන ලද පරිණාමක සංඛ්‍යාව 85 කින් පහළයාම වාර්තා වූ අතර එමගින් අපනයන වෙළඳපොළ සැලකිය යුතු අන්දමින් පසුගාමී වීමට හේතු විය.

## 3.3 2021 වර්ෂයේදී නිම කළ ව්‍යාපෘති කිහිපයක් සහ අත්කරගන්නා ලද ජයග්‍රහණ

### අ. නව කාර්යාලය සහ පිළිගැනීමේ පරිශ්‍රය වැඩිදියුණු කිරීම




කාර්ය මණ්ඩලය සහ ගනුදෙනුකරුවන් වෙත වඩාත් ඉඩකඩ සහිත කාර්යාල පරිසරයක් සපයමින් නව කාර්යාල පරිශ්‍රයේ ඉදිකිරීම් කටයුතු වර්ෂයක් තුළ නිම කරන ලදී. පහසුකම් සහිත සාකච්ඡා කාමර, විනෝදාත්මක සාද පැවැත්වීමේ ශාලාව, විවේකාගාරය, අමුත්තන් රැඳී සිටීමේ ශාලාව ආදිය අළුත්වැඩියා කිරීම මෙම පිළිසකර කටයුතු වලට ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතිය මඟින් ප්‍රධාන වශයෙන් අපේක්ෂා කරනු ලබන්නේ පාරිභෝගිකයින් සඳහා සේවා සැලසීමයි. සුවපහසු ලෙස අසුන් ගැනීමේ පහසුකම් සහිත සිත්ගන්නාසුළු පිළිගැනීමේ පරිශ්‍රයක්, අමුත්තන් රැඳී සිටීමේ ශාලාවක්, විවේකාගාර, පාරිභෝගිකයින් සඳහා වෙන් වූ ආහාරගැනීමේශාලා සහ වැසිකිළි පහසුකම් කර්මාන්තශාලාවට හඳුන්වා දී තිබේ.

### ආ. EU Eco Design Tier 2 අවශ්‍යතා සපුරාලන බලශක්ති කාර්යක්ෂම පරිණාමක හඳුන්වාදීම



එල්ටීඑල් සමාගම විසින් ඉතා අවම මෙහෙයුම් LTLT පාඩු සහිත EU Eco Design Tier 2 අවශ්‍යතාවයන්ට අනුකූල ඉහළ බලශක්ති කාර්යක්ෂමතාවයෙන් යුතු පරිණාමක සාර්ථක ලෙස සැලසුම් කර නිස්පාදනය කිරීම සිදු කර තිබේ. මෙම මූල්‍ය වර්ෂය අවසානයේදී එල්ටීඑල් සමාගම විසින් එල්ටීඑල් සමාගම විසින් මෙරට පෞද්ගලික අංශය වෙත සපයන ලද සමස්ත නිස්පාදන පෙළ බලශක්ති කාර්යක්ෂම සැලසුම් වලින් සමන්විත නිෂ්පාදන වශයෙන් වැඩිදියුණු කර තිබේ. දේශීය ගනුදෙනුකරුවන් මිලදී ගැනීම් සිදුකිරීමේ දී ගෙවීමට සිදුවන වත්කමෙහි මිල මෙන් ම මෙහෙයුම් පිරිවැය අඩු අගයක පැවතීම සහඅඩු විමෝචනය හේතුවෙන් දේශීය පාරිභෝගිකයන්ට ප්‍රතිලාභ සැලටසනු ඇත.

### ඇ. සන්නාම උපක්‍රම සංවර්ධන ව්‍යාපෘතිය

කාලීන වශයෙන් වෙළඳපොළෙ තුළ වර්ධනය වන තරඟකාරීත්වයට අවශ්‍ය වන පුළුල් සන්නාම උපක්‍රමය සංවර්ධනය කිරීම සඳහා එල්ටීඑල් හෝල්ඩිංස් සමාගම විසින් ආරම්භක පියවර ගන්නා ලදී. සන්නාමයේ වත්මන් තත්ත්වය පරීක්ෂා කිරීම සහ තරඟකරුවන් විශ්ලේෂණය කිරීම සඳහා වෙළඳපොළ කේන්ද්‍ර කරගත් පර්යේෂණයක් සහිතව ව්‍යාපෘතිය ආරම්භ විය. වෙළඳපොළ කේන්ද්‍ර කරගත් පර්යේෂණයේ ප්‍රතිඵල පදනම් කරගෙන සන්නාමය හඳුනාගැනීම සහ ස්ථානගතකිරීම , ඉලක්කගත වෙළඳපොළ සහ සමස්ත ව්‍යාපාරික උපායමාර්ග වලට අනුකූලව සන්නිවේදන උපක්‍රම වැඩිදියුණු කිරීම, සන්නාම සන්නිවේදන උපක්‍රමය දියුණු කිරීම සහ වෙළඳපොළ තුළ සන්නිවේදනය ආශ්‍රිත සංවර්ධනය කිරීම සම්බන්ධ ඊළඟ පියවර ගැනීම දක්වා ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතිය මඟින් එල්ටීඑල් හෝල්ඩිංස්හි අනාගත වෙළඳ සහ සන්නාමකරණ කටයුතු සඳහා පදනම සපයනු ඇත.

## 2.4 2021/2022 වර්ෂය සඳහා සැලසුම් කරන ලද වැඩිදියුණුකිරීම්

### 1. අඩු සංඛ්‍යාත තාපන උඳුන Low Frequency Heating (LFH) oven




අඩු සංඛ්‍යාත තාපන තාක්ෂණය (Hedrich Germany) එල්ටීඑල් නිෂ්පාදන ක්‍රියාවලියට නුදුරු කාලයේදී ම හඳුන්වා දෙනු ලැබේ. අඩු සංඛ්‍යාත තාපන තාක්ෂණය සහිත නව උඳුන භාවිතා කිරීම සඳහා බලය පැවරීම පැවති වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රමාද වුවද එහි කටයුතු ලබන වසර තුළදී ඉතා ඉක්මණින් නිමකිරීමට කටයුතු කරනු ලැබේ. මෙම තාපන උඳුන භාවිතා කිරීමත් සමඟ එල්ටීඑල් හෝල්ඩිංස් සමාගම මෙම තාක්ෂණය භාවිතා කරනු ලබන කලාපයේ ප්‍රථම නිෂ්පාදන ආයතනය බවට පත්වන ඇත. අඩු සංඛ්‍යාත තාපන පද්ධතිය මෙම ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාව හා නිරවද්‍යතාව විශාල වශයෙන් ඉහළ නංවන ස්වයංක්‍රීය ඉන්ධන පිරවුම් සහ පීඩන පරීක්ෂණ පහසුකමෙන් සමන්විත වේ.

අඩු සංඛ්‍යාත තාපන ක්‍රියාවලිය මඟින් පරිණාමකයෙහි HV එතීම් මඟින් අඩු සංඛ්‍යාත විදුලිය අඩු වෝල්ටීයතා මට්ටම්වලින් HV සහ LV එතීම්වල ඇතුළත සිට ඒකාකාරීව උණුසුම් කරනු ලබන අතර LV ලුහු පරිපථයක් ලෙස පවතියි.මෙම ක්‍රියාවලිය අතරතුර එතීම සඳහා නියම කරන ලද උෂ්ණත්වය මඟින් එතීමේ ප්‍රතිරෝධය නිරීක්ෂණය කරනු ලබන අතර කුටීරයෙහි රික්තක මට්ටම නිවැරදිව පාලනය කරනු ලැබේ.

### 2. නවීන තාක්ෂණයෙන් යුතු පරීක්ෂණ පහසුකම ඇතුළත් කිරීම

ඇමෙරිකා එක්සත් ජනපදයේ ෆීනික්ස් සමාගමෙන් (Phoenix USA) කර්මාන්ත ශාලාව වෙත නවීන තාක්ෂණයෙන් යුතු ස්වයංක්‍රීය පරීක්ෂා කිරීමේ උපකරණයක් ලැබිණි. මෙම නව ඒකකය ක්‍රියාත්මක කිරීම සඳහා බලය පවරන ලද පසු පරීක්ෂා කිරීමේ කාර්යයේ කාර්යක්ෂමතාව ඉහළ නංවමින් නිරතුව සිදුකරනු ලබන පූර්ණ පරීක්ෂණ ක්‍රියාවලිය ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වනු ඇත.

### 3. අමෝෆස් කෝර් තාක්ෂණය (Amorphous Core) සහිත පරිණාමක සැලසුම් කිරීම හා නිෂ්පාදනය කිරීම



එල්ටීඑල් හෝල්ඩිංස් සමාගම අමෝෆස් කෝර් තාක්ෂණය (amorphous core technology) උපයෝගී කරගනිමින් පරිණාමක නිෂ්පාදනය ආරම්භ කිරීමට සූදානම්ව සිටියි. නව තාක්ෂණය යොදාගැනීමෙන් එල්ටීඑල් හෝල්ඩිංස් වෙත 50% ක සැකෙබුම් හානියක් (no load losses) අඩු කර ගනිමින් පරිණාමක අතිශයින් බල කාර්යක්ෂම ඒවා බවට පත් කරගත හැකිය. මෙහි ප්‍රතිඵල වශයෙන් ශ්‍රී ලාංකික ගනුදෙනුකාර ප්‍රජාවට මෙහෙයුම් පිරිවැය සහ විමෝචනය අවම තත්ත්වයේ පවතින නිෂ්පාදන රැසක් ලබා ගැනීමට හැකියාව ලැබේ. අයිති කරගැනීම සඳහා වන මුළු පිරිවැය පරිණාමකවල සමස්ත ජීවකාලය තුළ ප්‍රතිලාභ ලැබීමට හේතු වේ.

### 4. On-Load Tap Changer තාක්ෂණය සහිත 5MVA විදුලි ට්‍රාන්ස්ෆෝමර

එල්ටීඑල් හෝල්ඩිංස් සමාගම මෙවන විට ප්‍රථම වරට On-Load Tap Changer තාක්ෂණය සහිත 5MVA විදුලි ට්‍රාන්ස්ෆෝමර නිෂ්පාදන කටයුතු ආරම්භ කර තිබේ. මෙහි සැලසුම් කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර මෙම ව්‍යාපෘතිය 2021/22 මූල්‍ය වර්ෂය තුළ අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. නිෂ්පාදිත පරිණාමක ජාත්‍යන්තර පිළිගැනීම සහිත පරීක්ෂා කිරීමේ විද්‍යාගාරයක අවශ්‍ය සියලුම ආකාරයේ පරීක්ෂණ වලට බඳුන් කෙරේ.

### 5. පරිවරණ ද්‍රව භාවිතා කරනු ලබන (Dry Type Transformer) නිෂ්පාදනය

වියළි වර්ගයේ පරිණාමක (Dry Type Transformers ) සඳහා ශ්‍රී ලංකාවේ දැනට පවතින ශීඝ්‍රයෙන් ඉහළ යන ඉල්ලුම සපුරාලීමේ අරමුණෙන් දැනට පවතින දැනට පවතින වියලි ආකාරයේ පරිණාමක එකලස් කිරීමේ ක්‍රියාවලිය අංග සම්පූර්ණ නිෂ්පාදන ක්‍රමයක් දක්වා වැඩි දියුණු කරනු ලැබේ. මෙමඟින් නව වෙළඳපල ප්‍රවණතාවයේ වාසිය අත් කර ගැනීමට පමණක් නොව පාරිභෝගිකයින් තෙල් වර්ගයේ පරිණාමක වලින් ඉවත්වීම නිසා විය හැකි අවස්ථා අහිමි වීම වැළැක්වීමට ද දායකත්වය සපයනු ලැබේ. ඊට අමතරව පරිණාමක සඳහා වන ඕනෑම පාරිභෝගික අවශ්‍යතාවක් සපුරාලීමට මෙය අපට ඉඩ සලසයි. මෙම අංශය සඳහා තාක්‍ෂණික සහයෝගය ලබා දීම සඳහා අපි උපදේශක සමඟ ගිවිසුමක් අත්සන් කර ඇති අතර නෝර්වේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ හිටපු ඒබීබී විශේෂඥයින්ගේ සහාය සහිතව දැනට පවතින සැලසුම් වැඩසටහන තුළ වියලි පරිණාමක සැලසුම් කිරීමේ හැකියාවන් ඇතුළත් කිරීමට සැලසුම් කර තිබේ.

### 6. 2021 වර්ෂයේ මුහුණ දුන් අභියෝග සහ ප්‍රධාන ගැටලු

ශ්‍රී ලංකාව තුළ සූර්ය බලශක්තිය දියුණුවීම පසුගිය වසර කිහිපය තුළ වේගවත්ව වර්ධනය විය. ග්‍රිඩ් පරිමාණයේ සූර්යබල PV ව්‍යාපෘති, කුඩා පරිමාණයේ බෙදාහැරීමේ සූර්ය PV ව්‍යාපෘති සහ පියසි මත ස්ථාපනය වන සූර්ය පැනල එම කාල පරිච්ඡේදය තුළ සැලකියයුතු වර්ධනයකට බඳුන් විය. සුනිත්‍ය බල අධිකාරියේ දත්ත අනුව මෙබඳු මැදිහත්වීම් මඟින් දිවයිනෙහි විදුලිබල ජාලයට වර්ෂ 2020 වන විට සූර්ය බලය මඟින් මෙගාවොට් 1000 ට වැඩි දායකත්වයක් සැපයිය යුතු ය. මෙම ව්‍යාපෘති රැසක් සඳහා පරිණාමක අනිවාර්යයෙන් ම අවශ්‍ය වන බැවින් දේශීය වෙළඳපොළ තුළ පරිණාමක සඳහා ඉහළ ඉල්ලුමක් පැවතිය හැකි බව නිරීක්ෂණය කළ හැකිය.

දේශීය සූර්ය බලශක්ති සංවර්ධකයන්ට සහ රටෙහි ආර්ථික මෙහෙයුමට පහසුකම් සැලසීම සඳහා එල්ටීඑල් හෝල්ඩිංස් සමාගම විසින් සූර්යබල PV යෙදවුම් සඳහා අනිවාර්ය අවශ්‍යතා වලට ගැළපෙන පරිදි විශේෂ පරිණාමක සැලසුම් කිරීම, නිෂ්පාදනය සහ හඳුන්වාදීම 2019 වර්ෂයේ දී සිදු කරන ලදී. සුවිශේෂී අභ්‍යන්තර සැලසුම් ලක්ෂණ වලට අමතරව මෙම පරිණාමක ඉතා කාර්යක්ෂම වන අතර සැකෙබුම් හානියෙන් තොර වේ. මෙය සූර්යබල PV සංවර්ධකයන්ට බලශක්තිය ඉතිරි කරගැනීම තුළින් මූල්‍යමය වශයෙන් විශාල ඉතුරුම් ලැබෙන බැවින් ඔවුන් වෙත ලබා දෙන ප්‍රතිලාභ ඉමහත් ය.

කෙසේ නමුත් ශ්‍රී ලංකාව තුළ පවතින පරිණාමක සඳහා වන වැට් බදු යෝග්‍යතා ව්‍යුහය හේතුවෙන් එල්ටීඑල් හෝල්ඩිංස් සමාගමට මෑතකදී දුෂ්කරතා රැසකට මුහුණ දීමට සිදුවිය. මෙරට සූර්ය බල සංවර්ධකයන්ට දේශීය වශයෙන් පරිණාමක මිලදී ගැනීමේදී වැට් බදු ගෙවීමට සිදු වුවද දැනට පවතින රෙගුලාසි මඟින් පරිණාමක ආනයන බදු වලින් නිදහස් කර තිබේ (එල්ටීඑල් ආයතනයේ නිෂ්පාදන පෙළ 8504.21.90 සහ 8504.22.20 යන එච්එස් කේතාංක මඟින් ආවරණය කර තිබේ). මේ හේතුවෙන් ඇතිවන 8% ක වැට් බදු අවාසියක් අත්වීම දේශිය නිෂ්පාදකයෙකු වශයෙන් එල්ටීඑල් සමාගම අලාභ ලැබීමේ තර්ජනයකට පාත්‍ර වී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස සූර්යබල PV ව්‍යාපෘති සඳහා පරිණාමක විශාල සංඛ්‍යාවක් විදේශයෙන් ආනයනය කරන ලද අතර මෙම නැඹුරුතාව අනාගතයේදී ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.ආනයනය කරනු ලබන පරිණාමක වැට් බද්දෙන් නිදහස් කිරීම හේතුවෙන් දේශීය සංවර්ධකයන් අමතර 8% ක මුදලක් වැයකර දේශීය පරිණාමක මිලදී ගැනීමට වෙනුවටආනයනිත පරිණාමක මිලදී ගැනීමට යොමු වී තිබේ.

දේශීයව නිෂ්පාදනය කරන ලද ජල විදුලිබල උත්පාදක හෝ සුලං බල උත්පාදක යන්ත්‍ර හෝ සුලං බල උත්පාදක යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ වැට් බද්දෙන් නිදහස් කිරීමේ විධිවිධාන එකතු කරන ලද අගය මත බදු (වැට්) පනතෙහි ඇතුළත් වේ. 2002 අංක 14 දරන වැට් පනතෙහි පළමුවන උපලේඛනයෙහි II වන කොටසෙහි XXXVi අයිතමය ප්‍රකාරව 2012 අංක 07 දරන වැට් (සංශෝධන) පනතෙහි (i) වන උප අයිතමයෙහි විශේෂයෙන් දක්වා ඇති පරිදි අනුව දේශීයව නිෂ්පාදනය කරන ලද ජල විදුලිබල උත්පාදක හෝ සුලං බල උත්පාදක යන්ත්‍ර හෝ සුලං බල උත්පාදක යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ඇතුළත්ව දේශීයව නිෂ්පාදනය කරනු ලබන අගය එකතු කළ නිෂ්පාදන වැට් බදු වලින් නිදහස් වේ. **නමුත් මෙම නිදහස් කිරීම සූර්යබල ව්‍යාපෘතිවල භාවිතා කරනු ලබන පරිණාමක සඳහා අදාළ කරගත හැකි වන පරිදි පුළුල් කර නොමැත.**

වැට් බදු යෝග්‍යතාවයේ අනනුකූලතාවය සුදුසු පරිදි හැකි ඉක්මණින් විසඳාගත හැකි නම් ඉදිරි වසර කිහිපය තුළ පරිණාමක ආනයනය කිරීම සඳහා දිවයිනෙන් පිටතට ගලනය වන ඇමෙරිකානු ඩොලර් මිලියන ගණනක මුදල ඉතිරි කර ගැනීමට හැකි වනු ඇත. එය දේශීය නිෂ්පාදකයෙකු වශයෙන් එල්ටීඑල් හෝල්ඩිංස් වෙත ආරක්ෂාව සපයාගැනීමට ආරක්ෂිත පියවරක් වනු ඇත.

මෙම තත්ත්වයන් පිළිබඳව සලකා බලා **සූර්යබල පීවී ව්‍යාපෘති සඳහා දේශීයව නිෂ්පාදනය කරනු ලබන පරිණාමක වැට් බදු වලින් නිදහස් කිරීම** සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ දේශීය කර්මාන්තය සම්බන්ධයෙන් වන ආරක්ෂිත පියවරක් වශයෙන් රටට ආනයනය කරනු ලබන පරිණාමක සඳහා වැට් බදු පැනවීමේ හැකියාව පිළිබඳ සලකාබැලීම අතිශය වැදගත් වේ.

## 4.0 සපුගස්කන්ද ගැල්වනයිසිං සහ පිරිසැකසුම් යන්ත්‍රාගාර



සපුගස්කන්ද ගැල්වනයිසිං පහසුකම් සහිත යන්ත්‍රාගාරය

### 4.1 *නිෂ්පාදන අනුබණ්ඩණය – ගැල්වනයිස් සහ පිරිසැකසුම් යන්ත්‍රාගාරය* (2021)

මාසික නිෂ්පාදනය– ගැල්වනයිසින් යන්ත්‍රාගාරය (2021 ජනවාරි සිට අගෝස්තු දක්වා

| වර්ෂය | මාසය | B1<br>මුළු ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) | B2<br>මුළු ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) | මුළු නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම්) |
|---|---|---|---|---|
| 2021 | ජනවාරි | 829,799 | 164,118 | **993,917** |
| | පෙබරවාරි | 866,683 | 140,328 | **1,007,011** |
| | මාර්තු | 929,121 | 256,166 | **1,185,287** |
| | අප්‍රේල් | 802,862 | 84,940 | **887,802** |
| | මැයි | 744,813 | 116,335 | **861,148** |
| | ජූනි | 1,162,486 | 163,340 | **1,325,826** |
| | ජූලි | 881,314 | 179,458 | **1,060,772** |
| | අගෝස්තු (ඇස්තමේන්තු කර තිබේ). | 850,000 | 90,000 | **940,000** |
| මුළු ප්‍රමාණය | | **7,067,078** | **1,194,685** | **8,261,763** |

### 4.2 නිෂ්පාදන විශ්ලේෂණය– (ගැල්වයිසින් යන්ත්‍රාගාරය)

නිෂ්පාදන විශ්ලේෂණය– ගැල්වනයිසින් යන්ත්‍රාගාරය (2021 ජනවාරි සිට ජූලි දක්වා)

| විස්තරය | | පිරිවැටුම (ලංකා රුපියල්) සහ නිෂ්පාදනය (කිලෝග්‍රෑම්) 2021<br>පිරිවැටුම | නිෂ්පාදනය |
|---|---|---|---|
| මුළු සංඛ්‍යාව | | **705,244,197** | **8,261,763** |
| ලංවිම | | 57,012,901 | 992,329 |
| අන්තර් සමාගම | දෙවන පාර්ශවය | 14,817,993 | 234,101 |
| | F&G | 70,876,673 | 2,144,986 |
| | උපපොළ පැකේජ | 33,384,300 | 87,504 |
| | කර්මාන්ත කටයුතු | | 56,423 |
| සුන්බුන් අලෙවිය | | 54,478,239 | |
| 3 වන පාර්ශවය | | 474,674,090 | 4,746,420 |



ස්වයංකීර්ණ සීඑන්සී ඇන්ගල් පංචිං යන්ත්‍රය




ස්වයංක්‍රීය සීඑන්සී ප්ලේට් ෂියරිං යන්ත්‍රය

පසුගිය දශකය පුරාම ලංවිම අපගේ ප්‍රධාන ගනුදෙනුකරු වුවද දිවයිනෙහි විද්‍යුතන ක්‍රියාවලිය 98% දක්වා සම්පූර්ණ වීම හේතුවෙන් නව විදුලි ව්‍යාපෘති ආරම්භ නොකිරීමෙන් ලංවිම සහ පැවති ව්‍යාපාරික ගනුදෙනු සැලකියයුතු ප්‍රමාණයකින් අඩුවිය. පසුගිය වර්ෂයේ සිට කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් අවාසිසහගත වෙළඳපොළ තත්ත්වයන් පැවතුණද නව ගනුදෙනුකරුවන් සමඟ ගනුදෙනු වලට එළඹීමෙන් නිෂ්පාදන මට්ටම් සාර්ථකව වර්ධනය කරගැනීමට ආයතනයට හැකි විය.

සමාලෝචිත වර්ෂය තුළදී සමාගමේ ගැල්වනයිසිං පහසුකම සමස්ත නිෂ්පාදන මට්ටම්වල ස්ථිර ප්‍රගතියක් ඇති කරන ලදී. නිෂ්පාදන ක්‍රියාවලිය සම්පූර්ණයෙන් පරිගණක මඟින් පාලනය කරනු ලැබේ. මෙම උපකරණ වලට ඇන්ගල් ස්ටීල් සඳහා ස්වයංක්‍රීය සීඑස්සී රැහැන් (automatic CNC line for angle steel), සීන්සී ප්ලේට් කටින් මැෂින් (CNC plate cutting machine), සීඑන්සී ප්‍රොෆයිල් කටර් (CNC Profile cutter), අර්ධ ස්වයංක්‍රීය චැනල් ෂියරිං මැෂින් (semi-automated channel shearing machine), සීඑන්සී ප්ලේට් පංචින් ඇන්ඩ් ඩ්‍රිලිං මැෂින් (CNC Plate punching and drilling machine) ආදිය ඇතුළත් වේ. සමාගම විසින් කාර්යක්ෂම මෙහෙයුම්, නිෂ්පාදන කාර්යයන් නියමිත වේලාවට නිමකිරීම්, සහ විශිෂ්ට තත්ත්වය සහතික කිරීම සඳහා නිෂ්පාදන සම්පත් උපරිමාකාරයෙන් උපයෝගී කරගැනීමට කටයුතු කරනු ලැබේ.

## 5.0 නිෂ්පාදන විශ්ලේෂණය– පිරිසැකසුම් යන්ත්‍රාගාරය

### 5.1 මාසික නිෂ්පාදනය – පිරිසැකසුම් යන්ත්‍රාගාරය (2021 ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා)

| වර්ෂය | මාසය | ලංවිම ව්‍යාපෘති | Inter Com. Overseas projects | Inter Com. Local projects | Private Organization | Total Production (Kgs) |
|---|---|---|---|---|---|---|
| **2018** | ජනවාරි | 25,040 | 0 | 378,310 | 0 | **403,350** |
| | පෙබරවාරි | 0 | 0 | 196,620 | 0 | **196,620** |
| | මාර්තු | 27,610 | 0 | 352,040 | 0 | **379,650** |
| | අප්‍රේල් | 23,830 | 0 | 211,110 | 0 | **234,940** |
| | මැයි | 0 | 0 | 347,950 | 0 | **347,950** |
| | ජුනි | 36,990 | 0 | 364,100 | 0 | **401,090** |
| | ජූලි | 7,350 | 0 | 370,730 | 3,400 | **381,480** |
| | අගෝස්තු | 0 | 0 | 0 | 0 | **0** |
| එකතුව | | **120,820** | **0** | **2,220,860** | **3,400** | **2,345,080** |

### 5.2 නිෂ්පාදන විශ්ලේෂණය– පිරිසැකසුම් යන්ත්‍රාගාරය

| විස්තරය | | පිරිවැටුම (ලංකා රුපියල්) සහ නිෂ්පාදනය (කිලෝග්‍රෑම්) | |
|---|---|---|---|
| | | 2021 | |
| | | පිරිවැටුම | නිෂ්පාදනය |
| ලංවිම ව්‍යාපෘති | | 26,726,543 | 120,820 |
| අන්තර් සමාගම | දේශීය ව්‍යාපෘති | 246,984,761 | 2,220,860 |
| | විදේශීය ව්‍යාපෘති | 0 | 0 |
| 3 වන පාර්ශවය | | 5,214,786.29 | 3,400 |
| මුළු ප්‍රමාණය | | **278,926,091** | **2,345,080** |

ගැල්වනයිසින් යන්ත්‍රාගාරය පිරිසැකසුම් යන්ත්‍රාගාරය සමඟ ඒකාබද්ධව කටයුතු කරන අතර දිවයිනෙහි පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2019 දෙසැම්බර් මස සිට විවිධ අවහිරතා සහ බාධක වලට මුහුණ දීමට සිදු වුවද පසුගිය වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී සැලකියයුතු ආදායමක් උපයා ගන්නා ලදී.

### 5.3 2021 ජනවාරි මස අගෝස්තු මාසය තුළ නිමකිරීමට මේ වන විට ක්‍රියාත්මක වන ව්‍යාපෘති

| යොමු අංකය | ව්‍යාපෘති නාමය | බර (කිලෝ ග්‍රෑම්) | ව්‍යාපෘතියේ තත්ත්වය |
|---|---|---|---|
| 1 | GPDEEIIP2 Package 4 - 33kv Lines and Gantries | 840,346.83 | ක්‍රියාත්මක වෙමින් පවතින |
| 2 | NTIND&EIP Package 1 | 1,098,313.53 | ක්‍රියාත්මක වෙමින් පවතින |
| 3 | NTDNDEIP Package 2 | 410,769.04 | ක්‍රියාත්මක වෙමින් පවතින |

## 6.0 ඒසියාටික් ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් ස්විච්ගියර් (පුද්ගලික) සමාගම, ඉන්දියාව







අප සමාගමේ පරිපාලිත ආයතනයක් වන ඒසියාටික් ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් ස්විච්ජියර් (පුද්ගලික) සමාගම පසුගිය තෙවසර තුළ ස්ථිර ප්‍රගතියක් අත්කර ගනිමින් ඇමෙරිකානු ඩොලර් 471,728.00 ලාභාංශයක් උපයන ලදී. . සමාගම විසින් එහි නිෂ්පාදන කාර්යයන් නව දිල්ලිය නුවරට නි.මී. 6 ක් පමණ දුරින් පිහිටි රාජාස්ථාන් ප්‍රාන්තයේ බිවාධි හි පිහිටි බදු දේපල (99 අවුරුදු) වෙත ගෙනයන ලදී.

## 7.0 සමාගම මුහුණ දුන් අභියෝග සහ අනාගත අභිවෘද්ධිය උදෙසා උපයෝගී කරගනු ලබන උපක්‍රම

### 7.1 එල්ටීඑල් හෝල්ඩිංස් පුද්ගලික) සමාගමේ හිමිකාරීත්වය ප්‍රතිව්‍යහගත කිරීම

එල්ටීඑල් හෝල්ඩිංස් (පුද්ගලික) සමාගමේ අයිතිය ප්‍රතිව්‍යුහගතකිරීම සම්බන්ධ යෝජනාව ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවේ පුළුල් අධ්‍යයනයට බඳුන් වූ අතර එල්ටීඑල් හෝල්ඩිංස් සමාගමේ වැඩිදියුණු වූ මෙහෙයුම් නම්‍යතාව ඇති කර ඵලදායීතාව ඉහළ නැංවීමේ අරමුණින් ලංවිම සතුව පවතින එහි 50% වඩා අඩු කොටස් දුර්වල කර LTL ESOT Ltd සහ ලංවිම සේවකයන් වෙත නව කොටස් නිකුත් කිරීම සඳහා උපදේස් ලබා දෙන ලදී. ස්වාධීන නෛතික සමාගමක් වන මර්සර්ස් එෆ් ජේ ද සේරම් (Messsrs F J De Saram’s) ආයතනය එල්ටීඑල් හෝල්ඩිංස් සමාගමේ සමාගම් ව්‍යවස්ථාවලියට ඇතුළත් විය යුතු වෙනස්කම් ඇතුළත් කර වාර්තාවක් සකස් කරන ලදී.

2016 සැප්තැම්බර් මස අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී වසර 05 ක කාලයක් ගත වුවද එල්ටීඑල් හෝල්ඩිංස් සමාගමේ හිමිකාරීත්වය ප්‍රතිව්‍යුහගතකිරීම සම්බන්ධ අවසන් තීරණය මේවන තෙක් ගෙන නොමැත.

එබැවින් මෙම අතිශය වැදගත් අවස්ථාවේදී ලංවිම සහ විදුලිබල අමාත්‍යාංශය මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය සහිතව එල්ටීඑල් හෝල්ඩිංස්හි හිමිකාරීත්වය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් අනුමතකිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම කඩිනමින් අවශ්‍ය පියවර ගැනීම අනිවාර්ය මෙන් ම අතිශය වැදගත් වේ. මේ සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමේදී විශේෂයෙන්ම සමාගමේ සහ පොදුවේ ලංවිම ප්‍රමුඛ අභිමතාර්ථ සහ සහ විදේශීය ව්‍යාපාරික කටයුතු වැඩිදියුණු කිරීම පිළිබඳව අවධානය යොමු කළ යුතුය.

## 8.0 සමාජ වගකීම් යටතේ කාර්යසාධනය

එල්ටීඑල් හෝල්ඩිංස් (පීවීටී) ලිමිටඩ් විසින් සමාජ වගකීම් ඉටුකිරීම සඳහා ස්වේච්ඡා සේවාවන් සැපයීම තුළින් සිය සුහදතාවය අඛණ්ඩව දක්වන අතර සමාලෝචිත කාලය තුළ පහත සඳහන් කටයුතු සිදු කරන ලදී.

2020 වර්ෂයේ මාර්තු සිට මෙරට කොවිඩ් 19 වසංගතය පැවතීම හේතුවෙන් අඟුළු දැමීම් සහ ඇඳිරි නීතිය පැනවීම් ආදී තත්ත්වයන් පැවතියද මහනුවර, අනුරාධපුර සහ කෑගල්ල ප්‍රදේශවග බෞද්ධ විහාරස්ථාන පිසකර කිරීම ඇතුළත්ව විදුලි ආලෝකය සැපයීමේ පුණ්‍ය කර්මය අඛණ්ඩව සිදු කරන ලදී.

මහනුවර අස්ගිරිය ෙඓතිහාසික විහාරය






රුවන්වැලිසෑය ෙඓතිහාසික බෞද්ධ විහාරය





වට්ටාරම රජ මහ විහාරය, කෑගල්ල




# සී/ස. ලංකා ගල් අඟුරු පුද්ගලික සමාගම

## හැඳින්වීම

සී/ස ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම සම්පූර්ණ කොටස් රජය සතු ව්‍යාපාරයකි. ලංකා විදුලිබල මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන නොරොච්චෝලේ ලක්විජය විදුලි බලාගාරයට ගල් අඟුරු ප්‍රසම්පදානය සඳහා පමණක් සමාගම සංස්ථාගත කර ඇත. අපගේ කොටස් හිමියන් මෙසේය.

| | |
|---|---|
| ලංකා විදුලි බල මණ්ඩලය | - 60% |
| භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව | - 20% |
| ලංකා නැව් සංස්ථාව | - 10% |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | - 10% |

ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික අවශ්‍යතාවයක් ලෙස 2021/2022 වාරය සඳහා නොරොච්චෝලේ බලාගාරයට ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 2.25 ක් සඳහා ප්‍රසම්පාදන කටයුතු කිරීමට අපේක්ෂිතය. බටහිර වෙරළ තීරයේ නිරිතදිග මෝසම් සමය සක්‍රීය වන නිසා ගල් අඟුරු සැපයුම සැප්තැම්බර් මාසයේ සිට ඊලග වසරේ අප්‍රේල් මාසය දක්වා මාස හතකට සීමා වේ. නමුත් බලාගාරය වසර පුරා ක්‍රියාත්මක විය යුතු බැවින් ජාතික විදුලිබල පද්ධතියට අවශ්‍ය ගල් අඟුරු අඛණ්ඩව සැපයීම සහතික කිරීම සඳහා ගල් අඟුරු ගබඩා කිරීම අත්‍යවශ්‍ය කරුණකි. එමනිසා ගල් අඟුරු ප්‍රසම්පාදනය හා සැපයුම් කිරීම වසර 2 ක කාලයක් පුරා සෑම විටම ව්‍යාප්ත වී ඇත.ඊට සමගාමීව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සැලසුම් කර ඇති අතර ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.

කිසියම් අලුත්වැඩියාවක් හේතුවෙන් බලාගාරය වසා දැමීම සලකා බැලීමෙන් පසු සෑම වසරකම ජුනි මාසයේදී ලක්විජය බලාගාරයේ ගල් අඟුරු අවශ්‍යතාවය ලංකා විදුලිබල මණ්ඩලය විසින් සී/ස ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම වෙත දැනුම් දෙනු ලැබේ. ඒ අනුව සී/ස ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම විසින් ඊළඟ වාරය සඳහා ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කරනු ලබයි.

## 2021-2022 ගල්අඟුරු වාරයේ ප්‍රසම්පාදන ප්‍රගතිය

නොරොච්චෝලේ ලක්විජය බලාගාරයට ගල්අඟුරු සැපයීමේ ක්‍රියාවලිය සිදුවන ආකාරය පහත වගුවෙන් දැක්වෙයි.




**FOB = Free On Board –** පැටවුම් වරායේදී ගල්අඟුරු මිල

**CFR = Cost and Freight –පුත්තලම නැංගුරම තෙක් නැව් ගාස්තු සමග ගල්අඟුරු මිල**

ලංකා ගල්අඟුරු සමාගම විසින් 2021-2022 වාරය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ අවශ්‍යතාවය මත ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 2.36 ( 10% ක් අඩු හෝ වැඩියෙන්) ලබා ගනී. නිරිතදිග මෝසම හේතුවෙන් සැපයුම් කාලය සැප්තැම්බර් සිට ඊළඟ වසරේ අප්‍රේල් දක්වා මාස හතකට සීමා විය. කෙසේ වෙතත්, බලාගාරය වසර පුරා ක්‍රියාත්මක විය යුතු බැවින් ජාතික විදුලිබල පද්ධතියට අඛණ්ඩව ගල් අඟුරු සැපයීම සහතික කිරීම සඳහා ගල් අඟුරු ගබඩා කිරීම අත්‍යවශ්‍ය වේ.

ප්‍රධාන වශයෙන් ගල් අඟුරු සැපයීම කර ඇත්තේ කාලීන ටෙන්ඩර් මගින් පමණක් වන අතර අමාත්‍ය මණ්ඩලය විසින් 2015-07-23 සහ 2015-10-14 යන දිනයන්හිදී ගනු ලැබූ තීරණයන්ට අනුව ගල් අඟුරු ටෙන්ඩර් ක්‍රම දෙකක් යටතේ එනම් දිගුකාලීන (Term) හා කෙටි කාලීන/ ක්ෂණික (spot) වශයෙන් සැපයීමට අනුමැතිය ලැබිණි. ඒ අනුව වසරක ගල් අඟුරු ප්‍රමාණය ගල්අඟුරු වාර දෙකකදී සැපයීම සඳහා

ගල්අඟුරු සමාගම කාලීන ටෙන්ඩර් කැඳවයි. එක් එක් ගල්අඟුරු වාරය සඳහා ලංවිම ඉල්ලා සිටින ගල් අඟුරු ප්‍රමාණය දැනුම්දීමෙන් පසු ක්ෂණික හෙවත් කෙටි කාලීන ටෙන්ඩර් කැඳවනු ලැබේ. කාලීන/ප්‍රධාන ටෙන්ඩර්වලින් ආසන්න වශයෙන් 50% කින් සහ ක්ෂණික/කෙටිකාලීන ටෙන්ඩර්වලින් 50% කින් සැපයුම සපුරාලනු ඇත.

තෝරාගත් ගල් අඟුරු සැපයුම්කරු විසින් සපයනු ලබන ගල්අඟුරු ප්‍රවාහන ගාස්තුවලට ගැලපීම මගින් පැටවීමේ වරායේ සිට ගොඩබෑම් වරාය ( පුත්තලම නැංගුරම) දක්වා ප්‍රවාහනය ලංකා නැව් සංස්ථාව විසින් සිදු කරයි.

එක් වාරයකට අදාල ගල් අඟුරු සැපයුමේ ප්‍රසම්පාදනය සහ ක්‍රියාකාරිත්වය සෑම විටම වසර දෙකක කාලයක් පුරා පැතිරී ඇති බැවින්, ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.

ලංකා ගල් අඟුරු සමාගම ගල් අඟුරු ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා ප්‍රසම්පාදන නියෝජිතායතනයක් ලෙස ක්‍රියා කරන අතර කැබිනට් මණ්ඩලය විසින් පතරක ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව(SCAPC) / කැබිනට් මණ්ඩලය විසින් පත්කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව ( SSCAPC) සහ තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) යන ප්‍රසම්පාදනයට සම්බන්ධ කමිටු වෙතින් කලින් කලට සියලුම නිර්දේශ සහ අනුමැතීන් ලබා ගනී. තාක්ෂණික ඇගයීම් කමිටු (TEC) සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව/විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව ( SCAPC/SSCAPC) යන දෙකම මුදල් අමාත්‍යාංශය විසින් පත් කර ඇති අතර ලංකා ගල් අඟුරු සමාගම (LCC) ටෙන්ඩර් නියාමනය කිරීම මගින් ප්‍රසම්පාදන අස්ථිත්වය ලෙස ක්‍රියා කරයි. ප්‍රසම්පදාන කමිටු ( SCAPC / SSCAPC) වෙතින් අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවයි.

## 2021-2022 ගල්අඟුරු වාරයේ විශේෂ අවස්ථා

### අ) රාජ්‍ය තාන්ත්‍රික මැදිහත්වීම හරහා ලංකා ගල් අඟුරු සමාගමට දිගුකාලීනව ගල් අඟුරු සැපයීමේ හැකියාව ගවේෂණය කිරීම.

ශ්‍රී ලංකා රජය සමඟ රාජ්‍ය තාන්ත්‍රික මට්ටමේ සබඳතා ඇති රටකින් දිගුකාලීන ගිවිසුමක් සඳහා සලකා බැලීමට සුදුසු ගල් අඟුරු සැපයුම් හවුල්කරුවෙකු සොයා ගැනීමට ලංකා ගල් අඟුරු සමාගම , විදුලිබල අමාත්‍යාංශය සහ ලංකා විදුලිබල මණ්ඩලය නියෝජනය කරන නිලධාරීන් උත්සාහ කරයි. ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල වෙත දැනුම් දීම සඳහා ලංකා ගල්අඟුරු සමාගම විදුලිබල අමාත්‍යාංශය හරහා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ලිපියක් යොමු කර ඇත. ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල හරහා එහි නිර්දේශ සහිතව සුදුසු ගල් අඟුරු සැපයුම්කරුවෙකු හෝ ගල් අඟුරු පතල් හිමිකරුවෙකු හඳුනා ගැනීම එහි ප්‍රධාන අරමුණයි. වඩාත් හොඳ මිලකට ගුණාත්මක ගල් අඟුරු අඛණ්ඩව සැපයීම මගින් අඩු පිරිවැයකින් රටට අඛන්ඩ විදුලි සැපයුමක් සහතික කිරීම අවසාන අරමුණ වේ.

එම උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස ගල්අඟුරු සමාගම වෙත දකුණු අප්‍රිකාව, පෝලන්තය, බ්‍රසීලය සහ රුසියාව වැනි විවිධ රටවලින් යෝජනා හතරක් ලැබී ඇත. මෙම මෙහෙයුම විධිමත් කිරීම සඳහා යෝජනා ඇගයීමට සහ වැඩිදුර අධ්‍යයනය සඳහා ලංකා ගල්අඟුරු සමාගම, ලංකා විදුලිබල මණ්ඩලය සහ විදුලිබල අමාත්‍යාංශය නියෝජනය කරන ඉහළ මට්ටමේ නිලධාරීන්ගේ එකතුවෙන් විශේෂ කමිටුවක් පත් කර ඇත.

### ආ) බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය (SORP) සකස්කර අනුමැතිය ලබාගැනීම.

ලංකා ගල්අඟුරු සමාගමේ ආරම්භයේ සිට විධිමත් බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් තිබී නැත. එබැවින් විධිමත් බඳවාගැනිමේ පටිපාටියක් සකස්කිරීමට අධ්‍යයනය කර නිර්දේශ කිරීමට ලංකා ගල්අඟුරු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයකට අනුව, ලංකා විදුලිබල මණ්ඩලයේ ඉහළ නිළධාරීන් දෙදෙනෙක්, විදුලිබල අමාත්‍යාංශයේ ඉහළ නිළධාරියෙක්,ලංකා නැව් සංස්ථාවේ ඉහළ නිළධාරියෙක් සහ ලංකා ගල්අඟුරු සමාගමේ ඉහළ නිළධාරියෙක් යන නිළධාරින්ගෙන් සමන්විත කමිටුවක් පත් කරන ලදී. ඒ අනුව, කමිටුව විසින් යෝජනා කරන ලද බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය මුදල් අමාත්‍යාංශය යටතේ පවත්නා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මගපෙන්වීම අනුව ලංකා ගල්අඟුරු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 2021-2022 වාරයේ වැඩසටහන

### ගල්අඟුරු ප්‍රසම්පාදනය

2021 ජුනි 15 වන දින නොරොච්චෝලේ ලක්විජය බලාගාරයෙන් ලැබුණු ලිපිය මත පදනම්ව, 2021/2022 ගල්අඟුරු වාරයට නොරොච්චෝලේ බලාගාරය සඳහා ගල් අඟුරු අවශ්‍යතාවය මෙ.ටොන් මිලියන 2.36 ( 10% ක් අඩු හෝ වැඩි)ක් ලෙස සැලසුම් කර ඇත. ඒ අනුව, ඉහත අවශ්‍ය ප්‍රමාණය සැපයීම සඳහා ගල්අඟුරු සමාගම විසින් පහත තාවකාලික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇත.

| විස්තරය | ටෙන්ඩරය | නැව් වාර ගනන | ප්‍රමාණය මෙ.ටො. - 10% |
|---|---|---|---|
| 2021-22 වාරයේ ලක්විජය බලාගාරයේ ගල්අඟුරු අවශ්‍යතාවය | | 40 | 2,360,000 |
| **ක්ෂණික/කෙටිකාලීන ටෙන්ඩර් විස්තර** | | | |
| ක්ෂණික 01 - LCC/21-22/ST/24/1 (සපයා අවසන්) | ST - 1 | 5 | 325,000 |
| ක්ෂණික 02 - LCC/21-22/ST/25/2 (ටෙන්ඩරය පිරිනැමීය) | ST - 2 | 5 | 325,000 |
| ක්ෂණික 03 - LCC/21-22/ST/26/3 –(ලංසු ඉදිරිපත් නොවුනි) | ST - 3 | 0 | |
| ක්ෂණික 04 - LCC/21-22/ST/27/4 – (ලංසු ඉදිරිපත් නොවුනි) | ST - 4 | 0 | |
| ක්ෂණික -05 - LCC/21-22/ST/28/5 ( කැඳවීමට ඇත ) | ST - 5 | 8 | 520,000 |
| **කාලීන/ප්‍රධාන ටෙන්ඩර විස්තර** | | | |
| කාලීන ටෙන්ඩරය - LCC/21/TT/1 (50% අඩුහෝ වැඩි 10% සහිතව ) (ටෙන්ඩරය පිරිනමා ඇත) | TT | 20 | 1,200,000 |

## කාලීන/ප්‍රධාන ටෙන්ඩරය - LCC/21/TT/1

විදුලිබල අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාව මත පදනම්ව කාලීන ටෙන්ඩරය (LCC/21/TT/1) Swiss Singapore Overseas Enterprises (Pte) Ltd වෙත ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇත. ගොඩබෑම් වරාය තෙක් නැව් ගාස්තු සහිතව ගල්අඟුරු මිල( CFR) පදනම මත ටෙන්ඩරය ප්‍රදානය කරන ලද ලිපිය, අනුව ලබා දී ඇති USD17.01 නැව් ගාස්තු මිල ගැලපීමට ලංකා නැව් සංස්ථාවට නොහැකි විය. කෙසේ වෙතත්, ලංසු ලේඛනයෙහි 2.7.1.3 වගන්තියට අනුව ලංකා නැව් සංස්ථාවට ඔවුන්ගේ යාත්‍රා යෙදවීමට අවස්ථාව ලබා දී ඇත. ඒ අනුව, 2021-2022 වාරයේ නැව්වාර සටහනෙහි නැව්ගත කිරීම් හතරකට තම නැව් ලබා දීමට ලංකා නැව් සංස්ථාවට යෝජනා කර ඇති අතර 2022-2023 වාරය සඳහා නැව්ගත කිරීම් සංඛ්‍යාව වාරය ආරම්භයේදී දැනුම් දෙනු ලැබේ.

## ක්ෂණික/කෙටිකාලීන ටෙන්ඩර

### ක්ෂණික 1

පළමු ක්ෂණික ටෙන්ඩරය සඳහා සැපයුම්කරු වන ස්විස් සිංගප්පූර් සමාගම ( **Swiss Singapore Overseas Enterprises (Pte) Ltd**) පුත්තලම නැංගුරම තෙක් නැව් ගාස්තු සමග ගල්අඟුරු මිල (**CFR**) පදනම මත මෙ.ටොන් එකකට ඇ.ඩො.159.03. බැගින් නැව්ගත කිරීම් පහකින් මෙට්‍රික් ටොන් 325,000 ( -10%) සැපයීමට ගිවිසුම්ගත වී ඇත.

### ක්ෂණික 2

දෙවන ක්ෂණික ටෙන්ඩරය පැටවුම් වරායේදී ගල්අඟුරු මිල පදනම (*FOB*) මත මෙට්‍රික් ටොන් එකකට ඇ. ඩො. 138.21 ක බැගින් නැව්ගත කිරීම් පහකින් මෙට්‍රික් ටොන් 325,000 (- 10%) සැපයීමට අදානී ග්ලෝබල් සමාගම (*Ms Adani Global (Pte) Ltd*) වෙත ප්‍රදානය කර ගොඩබෑම් වරාය ( පුත්තලම නැංගුරම) තෙක් නැව් ප්‍රවාහන ගාස්තු ( *freight*) වෙනුවෙන් නැව් සංස්ථාව විසින් මෙ.ටො. 01ක් සඳහා ඇ.ඩො.33.01 ක මිල ගැලපීමේ පදනම මත ගිවිසුම්ගත වී ඇත

### ක්ෂණික *3* සහ *4*

ගල්අඟුරු පතල් කරුවන් ගල් අඟුරු සැපයීමේ හිඟකම, ණයවර තහවුරු කිරීමේ ලිපිය සහ විදේශ මුදල් ගැටළු ආදී කරුණු මත ක්ෂණික 3 සහ 4 ටෙන්ඩර් සඳහා ලංසුකරුවන් සහභාගී නොවුනි. කෙසේ වෙතත්, මෙම තත්ත්වය මඟහරවා ගැනීම සඳහා සහ ලංවිම ගල් අඟුරු අවශ්‍යතාවය සපුරාලීම සඳහා ලංකා ගල්අඟුරු සමාගම විසින් නැව්ගත කිරීම් 08 ක් සඳහා පස්වන ක්ෂණික/කෙටිකාලීන (Spot) ටෙන්ඩරය කැඳවීමට ගල් අඟුරු සැපයුම් සැලැස්ම නැවත සකස් කරන ලදී.

## ගල්අඟුරු ගොඩබෑම/බත්තල් මගින් ප්‍රවාහනය

ලංකා නැව් සංස්ථාව විසින් ශ්‍රීජී ඉන්දියා සමාගම ( **Shreeji India**) වසර දෙකක් සඳහා ගොඩබෑම්/බත්තල් කටයුතු සඳහා සහකරු ලෙස තෝරාගෙන ඇත. පුත්තලම වරායේ නැංගුරම් පොළේ ගල්අඟුරු ගොඩබෑමෙන් පසු ප්‍රවාහන මෙහෙයුම සඳහා බත්තල් හතක් යෙදවීමට සැලසුම් කර ඇත.

## ගල් අඟුරු ප්‍රවාහනය සඳහා සමුද්‍ර රක්ෂණය

ගල්අඟුරු ප්‍රවාහනය සඳහා රක්ෂණ ආවරණ ලබාගැනීමේදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) යටතේ ලැයිස්තුගත කර ඇති සමාගම්වලින් තරඟකාරී දේශීය ලංසු කැඳවීම් මගින් තෝරාගත් සැපයුම්කරු වන පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී වෙත 2021-2022 සහ 2022-2023 වාර දෙක සඳහා ටෙන්ඩරය ලබා දී ඇත.

## ගල් අඟුරු ආනයනය සඳහා රේගු නිෂ්කාශන සේවාව

දේශීය සමාගම් හරහා ටෙන්ඩරයක් කැඳවීමෙන් රේගු නිෂ්කාශන නියෝජිතයා පත් කර ඇති අතර එය ARTF Cargo International වෙත ලබා දෙයි.

# සී/ස. ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම

## හැඳින්වීම

සී/ස ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම 10%ක් ලංකා විදුලිබල මණ්ඩලයේ අනුබද්ධිත සමාගමක් වන අතර එය 2011 වර්ෂයේ මුල් කාර්තුවේ දී සංස්ථාපනය කොට ඇත.

ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය පිළිබඳ දැක්මකින් කටයුතු කරන අතර අනෙකුත් අරමුණු වන්නේ, ආශ්‍රිත සම්ප්‍රේෂණ වත්කම් සංවර්ධනය සහ මිනිස්බල සම්පත් සම්පාදනය හා ප්‍රසම්පාදනයයි.

### 2021 ප්‍රගතිය හා 2022 සඳහා වැඩසටහන්.

### (a) කුඹල්ගමුව කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය.

වසර 20කට වැඩි කාලයක් තිස්සේ සමනල වැව ජලාශයෙන් ජලය කාන්දු වූ අතර එම කාන්දු වන ජලය උපයෝගී කර ගනිමින් ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම විසින් කුඹල්ගමුව කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය ගොඩනංවන ලදී.



ඉදිකිරීම් කටයුතු අතරතුර

2016 පෙබරවාරි මස 19 දින කුඹල්ගමුව ජල විදුලි බලාගාරයේ, ධාරිතාවය මෙගා වොට් 1.2 වන "ෆ්‍රැන්සිස්" තලබමනය බලගන්වන ලද අතර ඉන් ජනනය කරන ලද විදුලිය ජාතික විදුලි ජාලයට සම්බන්ධ කරන ලදී.

| බලාගාරයේ සාමාන්‍ය විස්තර | | |
|---|---|---|
| ස්ථාපිත ජනන ධාරිතාවය | මෙගා වොට් | 1.3 |
| ජනනය කරන ලද මුළු බලශක්ති ප්‍රමාණය | ගිගා වොට් පැය | 33.12 |
| සමස්ත ආදායම | රුපියල් මිලියන | 583.47 |
| ලංකා විදුලිබල මණ්ඩලය ආයෝජනය කරන ලද ප්‍රාග්ධනය | රුපියල් මිලියන | 115 |
| මෙහෙයුම් සිදු කළ කාලය | අවුරුදු | 5.6 |



තලබමන හා ජනන යන්ත්‍රය

### (b) ලංකා විදුලිබල මණ්ඩලය සඳහා අවශ්‍ය වන මිනිස්බලය කළමනාකරණය කිරීම.

ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉල්ලා සිටින ලද පරිදි පුහුණු හා නොපුහුණු මිනිස්බල සේවාවන් 156ක් සම්පාදනය කරනු ලැබේ. සමාගම ආරම්භයේ දී ලංකා විදුලිබල මණ්ඩලය වෙත මිනිස්බල සේවා 3,000කට ආසන්න ප්‍රමාණයක් සම්පාදනය කොට ඇත.

### (C) විදුලි මණු බහාලුම් (Meter Enclosure) නිෂ්පාදනාගාරය.

ලංකා විදුලිබල මණ්ඩලය හා ලංකා විදුලි පුද්ගලික සමාගමේ ප්ලාස්ටික් විදුලි මණු බහාලුම් අවශ්‍යතාවය සපුරාලීම සඳහා 2016 සැප්තැම්බර් 05 දින ප්ලාස්ටික් එකලා විදුලි මණු බහාලුම් නිෂ්පාදන කර්මාන්ත ශාලාවේ ඉදිකිරීම් ආරම්භ කරන ලදී. ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සවි කිරීම අවසන් කිරීමෙන් පසුව වර්ෂ 2017 සැප්තැම්බර් 05 දින කර්මාන්ත ශාලාව විවෘත කරන ලදී. මෙම කර්මාන්ත ශාලාව මගින් වාර්ෂිකව අවශ්‍ය වන විදුලි මණු බහාලුම් 250,000ක ප්‍රමාණය නිෂ්පාදනය කොට ලංකා විදුලිබල මණ්ඩලයට හා ලංකා විදුලි පුද්ගලික සමාගමට සපයනු ලැබේ.



කර්මාන්ත ශාලාවේ ඉදිරිපස

ඒ අනුව, ලංකා විදුලිබල මණ්ඩලයට හා ලංකා විදුලි පුද්ගලික සමාගමට අවශ්‍ය වන විදුලි මණු බහාලුම් අවශ්‍යතාවය සපුරාලීමට කර්මාන්ත ශාලාව ක්‍රියා කරයි.



එකළස් කිරීමේ අංගනය

### (d) දැදුරු ඔය කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය සංවර්ධනය කිරීම.


කප්ලාන් තලබමනය

කටුවන්නාව ප්‍රදේශයේ දැදුරු ඔය ජලාශ්‍රයේ වාරි ජලය මුදාහැරීම් භාවිතා කොට ධාරිතාවය මෙගා වොට් 1.3ක් වන කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය ඉදිකොට සාර්ථකව බලගන්වා ඇත. රුපියල් මිලියන 80ක වටිනාකමක් ඇති "කප්ලාන්" තලබමනය සහිත ජනන යන්ත්‍රය මගින් බලශක්ති ජනනය වාර්ෂිකව සිදු කිරීමට අපේක්ෂිතයි.


විදුලි බලාගාරය

### (e) ඉහල සමනල වැව කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය.

ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම සිදු කළ අධ්‍යයනයන්ට අනුව, දැනට පවතින කුඹල්ගමුව අමුණට ජලය කාන්දුවන ස්ථානයේ සිට මීටර් 28ක ජල මට්ටම් උසක් (Water head) පවතින බව අනාවරණය විය. මෙම ජල මට්ටම භාවිතා කරමින් වාර්ෂික විදුලි ජනනය ගිගා වොට් පැය 4.8ක් වන ධාරිතාවය කිලෝ වෝල්ට් 600ක කුඩා පරිමාණ ජල විදුලි බලාගාරයක් ස්ථාපිත කළ හැක. මෙම බලශක්තිය අවුරුදු 21ක කාලයක් පුරා කිසිඳු ඵලදායි භාවිතයකින් තොරව නාස්ති වෙමින් පවතී. දැනට පවතින ජල කාන්දුව සිදු වන ස්ථානයට හෝ අවට පරිසරයට කිසිඳු හානියක් සිදු නොවන අයුරින් ඉහත සඳහන් පරිදි කුඩා පරිමාණ ජල විදුලි බලාගාරයක් ඉදි කිරීම සඳහා සවිස්තර ශක්‍යතා අධ්‍යයනයක් සිවිල් ඉංජිනේරු විශේෂඥයින්ගේ සහාය ඇතිව ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම විසින් සිදු කර ඇත.





| ව්‍යාපෘතියේ සාරාංශය | | |
|---|---|---|
| විදුලි බලාගාරයේ ධාරිතාවය | කිලෝ වොට් | 700 |
| වර්ෂයක දී අපේක්ෂිත බලශක්ති ජනනය | ගිගා වොට් පැය | 4.8 |
| අපේක්ෂිත වාර්ෂික ආදායම | රුපියල් මිලියන | 86 |
| හදිසි අවස්ථා විදුලි බලය වශයෙන් වාර්ෂික ආදායම (රු. 35/ කි.වො.පැ.) | රුපියල් මිලියන | 171.84 |
| ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය | රුපියල් මිලියන | 227 |

### (f) ඉවතලන ඇලුමිනියම් ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය



ලංකා විදුලිබල මණ්ඩලයෙන් ඉවත් කරනු ලබන සියළුම ඉවතලන ඇලුමිනියම් සන්නායක මෙම කර්මාන්ත ශාලාවේ දී ප්‍රතිචක්‍රීකරණය කොට පසුව ඇහැසි පොදි බහන් (Areal Bundle Conductors) සෑදීමට අවශ්‍ය වන ඇලුමිනියම් දඬු (Aluminium Rods) බවට සකස් කරනු ලැබේ. මෙසේ සකස් කරනු ලබන ඇලුමිනියම් දඬු, සාකච්ඡා කොට එළඹගත් මිලකට නැවත ලංකා විදුලිබල මණ්ඩලයට යවනු ලැබේ. වර්තමානයේ දී මෙම ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලිය පාරිසරික වශයෙන් ඉහල වටිනාකමක් ලබා දෙන අතර වාර්ෂිකව ඇමෙරිකානු ඩොලර් මිලියන 04කට වඩා ඉතිරිකිරීමක් සිදු කරයි. එසේම, සිදු කරන ලද ගණනය කිරීම්වලට අනුව මෙම ව්‍යාපෘතියෙන් නිපදවන ඇලුමිනියම් දඬු මගින් ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික ඇලුමිනියම් අවශ්‍යතාවයෙන් තුනෙන් එකක් සපුරාලයි. මේ වන විට ලංකා විදුලිබල මණ්ඩලයේ ඩිපෝ මගින් ඉවතලන පැරණි ඇලුමිනියම් එකතු කිරීම් ආරම්භ කොට ගලිගමුව කර්මාන්ත ශාලා පරිශ්‍රයේ තාවකාලිකව ගබඩා කර ඇත. යෝජිත නිෂ්පාදන කර්මාන්ත ශාලාව සැලසුම් කරමින් පවතින අතර එය ගලිගමුව පරිශ්‍රයේ සංවර්ධනය කිරීමට යෝජිතයි. වර්ෂ 2022 මැද භාගය වන විට කර්මාන්ත ශාලාව ස්ථාපනය කොට මෙහෙයුම් ක්‍රියාවලිය ආරම්භ කිරීමට අපේක්ෂිතයි.

